| **මුළු එකතුව** | | | **-** | **22726** | **-** | **16477** |

## 4.5 ජාත්‍යන්තර තරුණ සබඳතා ක්‍රියාකාරකම්.

ජාතික තරුණ සේවා සභාවේ අංශයක් ලෙස ක්‍රියාත්මක වන ජාත්‍යන්තර තරුණ සම්බන්ධතා අංශය ශ්‍රී ලංකාවේ තාරුණ්‍යයට හා ජාතික තරුණ සේවා සභාවේ කාර්ය මණ්ඩලයට විවිධාකාරයේ ජාත්‍යන්තර වැඩසටහන් සඳහා සහභාගී වීමට අවස්ථාවන් ලබාදෙනු ඇත. ඊට අමතරව ලෝකයාට පෙන්විය හැකි ආකාරයේ මනා ලෙස හික්මුණු, දැනුමෙන් පරිපූර්ණ දේශීය වටිනාකම තහවුරු කරන උදාර ශ්‍රී ලාංකීය තාරුණ්‍යයක් නිර්මාණය කිරීම උදෙසා, විශිෂ්ඨ හා විශ්වාසනීය සේවයක් ඉටු කිරීම මෙම අංශයෙන් සිදු කරනු ඇත.

**වගුව 15 - ජාත්‍යන්තර තරුණ සබඳතා අංශය විසින් 2017 වර්ෂයේදි ක්‍රියාත්මක කල වැඩසටහන්.**

| අනු අංක | වැඩසටහන | සහභාගික සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ජාත්‍යන්තර තරුණ හුවමාරු වැඩසටහන | 434 |
| 02 | ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන් කලාපීය අන්තර්ජාතික තරුණ සමුළු,වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා දායකත්වය | 72 |
| 03 | ජගත් තරුණ නෞකා වැඩසටහන | 12 |
| 04 | එක්සත් ජාතීන්ගේ තරුණ නියෝජිත වැඩසටහන | 02 |
| 05 | නිලධාරීන්ගේ විදේශීය පුහුණු වැඩසටහන (අන්තර්ජාතික තරුණ සමුළු,වැඩමුළු සහ සම්මන්ත්‍රණ) | 27 |
| 06 | ස්වෙච්ඡා වැඩසටහන් | 110 |
| 07 | විදේශ සංචිතයට තෝරාගත් තරුණ තරුණියන් පුහුණු කිරීමේ වැඩසටහන | 208 |
| 08 | යෞවන සමාජ සාමාජික සාමාජිකයන් සඳහා වූ ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහන | - |

පින්තූර 05 - ජාත්‍යන්තර තරුණ සබඳතා අංශයේ ක්‍රියාකාරකම්වල විශේෂ අවස්ථා.






## 4.6 නිස්කෝ් වීඩියෝ ක්‍රියාකාරම්.

තරඟකාරී වාණිජ ලෝකයේ නොයෙකුත් අපහසුකම් නිසා සිය දක්ෂතාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමට ශ්‍රී ලාංකේය තාරුණ්‍යයට නොහැකි පරිසරයක් ගොඩනැගී තිබුණි. ඊට රාජ්‍ය ආයතනයක මැදිහත් වීම අවශ්‍යව තිබුණි. ඒ පසුබිම මත ජාතික තරුණ සේවා සභාව විසින් නිස්කෝ් වීඩියෝ අංශය ආරම්භ කරන ලදී.

- ජාතික තරුණ සේවා සභාවේ අරමුණු හා පරමාර්ථ සාක්ෂාත් කරගැනීම උදෙසා ජාතික තරුණ සේවා සභාවේ දැක්ම හා අරමුණු වලට අනුගතව නිස්කෝ් වීඩියෝ අංශයේ දැක්මට අනුකූලව ශ්‍රී ලාංකීය තාරුණ්‍යයේ දියුණුව උදෙසා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- එම වැඩසටහන් මඟින් අදාළ දර්ශන භාවිතයට ගනිමින් රූපවාහිනී හා ජනමාධ්‍ය ක්ෂේත්‍රය පිළිබඳව තාරුණ්‍යය දැනුවත් කිරීම.
- තරුණ සංවර්ධනය සඳහා ඉටු කෙරෙන කාර්යයන් වීඩියෝ ගත කිරීම හා සංරක්ෂණය කිරීම.
- හැකියාවන් සහිත තරුණ තරුණියන් ජාතික තලයට හඳුන්වා දීම උදෙසා වූ වැඩසටහන් රූපවාහිනී මාධ්‍යයෙන් ජාතික තලයට රැගෙන ඒම.
- ශ්‍රී ලාංකීය තාරුණ්‍යයේ ආර්ථික සමාජීය, දේශපාලන, මානසික සංවර්ධනය උදෙසා ක්‍රියාත්මක කරනු ලබන විවිධ වැඩසටහන් වීඩියෝ ගත කර අවශ්‍ය අවස්ථාවන් වලදී යළි ප්‍රයෝජනයට ගැනීම සඳහා සංරක්ෂණය කිරීම, අවශ්‍ය අවස්ථාවන් වලදී අවශ්‍යවන්නන් සඳහා ලබාදීම.

වගුව 16 - 2017 වර්ෂය තුල නිස්කෝ වීඩියෝ අංශයේ සංවර්ධන ක්‍රියාකාරකම්.

| අනු අංකය | වැඩ සටහන | වැඩ සටහන් සංඛ්‍යාව | භෞතික ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | | | ක්‍රියාත්මක කළ වැඩසටහන් | සත්‍ය සහභාගීත්වය |
| 01 | ප්‍රවෘත්ති ආවර්ණ (වැඩසටහන් නිෂ්පාදනය හා සංස්කරණය ) | 120 | 184 | අවස්ථානුකූලව |
| 02 | 6 වන කෙටි හා වාර්තා චිත්‍රපට උළෙල | 01 | • වැඩසටහන ප්‍රචාරය කිරීම<br>• වැඩමුලුව පැවැත්වීම<br>• නිර්මාණ භාරගැනීම<br>• නිර්මාණ විනිශ්චය<br>• සම්මාන ප්‍රදාන උළෙල | 867 |
| 03 | චිත්‍රාගාර පවිත්‍රතා හා නඩත්තු කටයුතු සිදුකිරීම | 01 | 01 | අවස්ථානුකූලව |
| 04 | ශාලිකා උපකරණ මිලදී ගැනීම | 01 | - | - |

එමෙන්ම තාරුණ්‍ය නිර්මාණශීලී හැකියාවන් වර්ධනය කිරීම, කුසලතා වර්ධනය කිරීම මෙන්ම මෙම නවීන තාක්ෂණයෙන් යුතු ආර්ථික ශක්තිය වර්ධනය කර ගත හැකි රැකියා අවස්ථා ඇති රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන තාක්ෂණ NVQ 5 මට්ටමේ එක් අවුරුදු පාඨමාලාවක් අභ්‍යන්තර ආදායම් ප්‍රභවය යටතේ 2017/07/21 වන දින අභ්‍යාසලාභීන් 33 ගේ සහභාගීත්වයෙන් ආරම්භ කරන ලදී. පාඨමාලාවේ මෙම කණ්ඩායමේ නිමාව 2018 ජූලි මස 22 දින වේ.

**පින්තූර 06 - නිස්කෝ වීඩියෝ අංශයේ ක්‍රියාකාරකම්වල විශේෂ අවස්ථා.**





## 4.7 ආර්ථික ප්‍රවර්ධන හා ගොවිපළ සංවර්ධන ක්‍රියාකාරකම්.

**i. කෘෂි සංවර්ධන ක්‍රියාකාරකම්.**

- නව තාක්ෂණය හා දැනුම උපයෝගී කර ගනිමින් , පාරිසරික සමතුලිතතාවය රකිමින් , සම්පත් උපරිම ලෙස ප්‍රයෝජනයට ගෙන , මූල්‍ය කළමනාකරණය තුළින් අනාගත ගොවිබිම ජය ගැනීම සඳහා , ශ්‍රී ලාංකීය තරුණයා නිසි මඟට යොමු කිරීම.

**ii. ගොවිපල සංවර්ධනය.**

- ගොවිපල මධ්‍යස්ථාන 18 ක් සංවර්ධනය කිරීම හා නඩත්තු කිරීම.
- ගොවිපල නිෂ්පාදන අලෙවි පොල පැවැත්වීම.
- ගොවිපල නිෂ්පාදන අගය වැඩි කිරීම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- දොළුව , එරමිණියාය , ගොවිපල ආශ්‍රිතව ජංගම කෘෂි සායන පැවැත්වීම .

වගුව 17 - අභ්‍යාසලාභී ශ්‍රමදාන කඳවුරු වල සහභාගීත්වය පිළිබඳ තොරතුරු.

| ගොවිපල මධ්‍යස්ථානය | පැවැත්වූ දිනය | සහභාගික සංඛ්‍යාව |
|---|---|---|
| දොළුව | 2017.06.16 - 19 | 26 |
| එරමිණියාය | 2017.06.12 -15 | 34 |

- ස්වයං රැකියා සඳහා පුහුණු කිරීම.

**iii. කෘෂි පාඨමාලා (NVQ ).**

- කෘෂි පාඨමාලා 14 ක් මධ්‍යස්ථාන 08 කදී පැවැත්විය .
- අභ්‍යාසලාභීන්ගේ ක්ෂේත්‍ර චාරිකා හා දැනුම මිනුම තරඟාවලිය පැවැත්වීම. ( සහභාගිත්වය - අභ්‍යාසලාභීන් 207 . පැවැත්වූ ස්ථානය ගන්නෝරුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව)
- කෘෂි පාඨමාලා :- පැළ තවාන් සංවර්ධන සහායක සහ ක්ෂේත්‍ර සහායක (කෘෂිකර්ම) NVQ4

**iv. විවිධ වැඩසටහන්.**

- ත්‍රිකුණාමලය පැවති යොවුන්පුර වැඩසටහන සඳහා ශ්‍රමදාන, ගවේෂණ , වෙළඳකුටි (හෙළ නිපැයුම්) හා පැළ සිටුවීම වැඩසටහන් සංවිධානය කිරීම.
- ජාතික ආහාර නිෂ්පාදන වගා සංග්‍රාමය - " එක්ව නැගිටිමු , අටුකොටු පුරවමු " වැඩසටහනට දායකත්වය ලබාදීම.
- ඩෙංගු මර්දන වැඩසටහනට සහාය දැක්වීම.
- ඵලදායිතා වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

**වගුව 18 - කෘෂි සංවර්ධන අංශය විසින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සාරාංශය.**

| **අනු අංකය** | **වැඩසටහනේ නම** | **වැඩසටහන් ප්‍රමාණය** | **තරුණ සහභාගිත්වය** |
|---|---|---|---|
| 01 | ගොවිපල සංවර්ධනය | 18 | - |
| 02 | කෘෂිකර්ම පාඨමාලා | 14 | 222 |

**පින්තූරය 07 - කෘෂි සංවර්ධන අංශයේ ක්‍රියාකාරකම් වල විශේෂ අවස්ථා.**





## 4.8 සැළසුම් හා සංවර්ධන ක්‍රියාකාරකම්.

ආයතනික කටයුතු විධිමත්ව සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සඳහා මඟ පෙන්වීම තුළින් ආයතනික කාර්ය සාධනය ඉහළ නැංවීම හා ආයතනයේ සියලුම ප්‍රගති වාර්තාවන් සකස් කිරීම මෙම අංශය මඟින් සිදු කෙරේ.

- ආයතනික සැලසුම් සකස් කිරීම.
- කලාපීය හා මාණ්ඩලික හා විශේෂ රැස්වීම් පැවැත්විම.
- සියලුම ප්‍රගති වාර්තාවන් සකස් කිරීම.
- පුස්තකාල සංවර්ධන කටයුතු.

වගුව 19 - සැලසුම් හා සංවර්ධන අංශයේ වැඩසටහන්.

| අනු අංකය | වැඩසටහනේ නම | වැඩසටහන් ප්‍රමාණය |
|---|---|---|
| 01. | සැලසුම් සකස් කිරීම. | 29 |
| 02. | පුස්තකාල සංවර්ධනය කටයුතු. | 01 |
| 03. | ප්‍රගති සමාලෝචන හා වාර්තා සකස් කිරීම. | 15 |

**පින්තූරය 08 - සැලසුම් හා සංවර්ධන අංශයේ ක්‍රියාකාරකම් වල විශේෂ අවස්ථා.**




## 4.9 කාර්යසාධන ඇගයීම් හා නිලධාරී පුහුණු ක්‍රියාකාරකම්.

දේශීය හා ජාත්‍යන්තර අවස්ථා උපයෝගී කොට ගෙන ජීවිත අභියෝග සඳහා මුහුණු දීමට ශ්‍රී ලාංකික තරුණයා සවිබල ගැන්වීම උදෙසා තරුණ සංවර්ධනයේ ප්‍රමුඛයා වශයෙන් කටයුතු කරමින් සිය සේවාව විශිෂ්ට සහ විශ්වාසනීය අයුරින් සැපයීම සඳහා කාර්ය මණ්ඩල නිලධාරී පුහුණු කිරීමේදී අපේක්ෂිත මට්ටම හා පවතින මට්ටම අතර පරතරය පිරවීම සඳහා නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය (මානව සම්පත් සංවර්ධනය) කිරීම කාර්යසාධන ඇගයීම් හා නිලධාරි පුහුණු අංශයේ ප්‍රධානතම කාර්යයකි.

කාර්යසාධන ඇගයීම් හා නිලධාරී පුහුණු අංශය භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රධාන කොටස් 02ක් යටතේ ක්‍රියාත්මක වේ.

එනම්,

- කාර්ය මණ්ඩල පුහුණු ක්ෂේත්‍රය.
- කාර්යසාධන ඇගයීම් වැඩසටහන වශයෙනි.

කාර්ය මණ්ඩල පුහුණු ක්ෂේත්‍රය යටතේ පහතින් දක්වා ඇති කටයුතු සිදු කරනු ලැබේ.

- කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම.
- ඵලදායිතා සංකල්පය ආයතනය තුළ ස්ථාපිත කිරීම හා දිවයින පුරා පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල, පුහුණු මධ්‍යස්ථාන ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීම.
- කළමනාකරණ කුසලතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- සභාවේ සේවය කරනු ලබන නිලධාරීන් විසින් බාහිර ආයතන වලින් හදාරනු ලබන අධ්‍යයන පාඨමාලා සඳහා උපරිමය ලක්ෂ 02 කට යටත්ව පාඨමාලා ගාස්තු ගෙවීම.
- නිලධාරීන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම සඳහා බාහිර ආයතන විසින් සංවිධානය කරනු ලබන කෙටි කාලීන පාඨමාලා සඳහා නිලධාරීන් යොමු කිරීම.

කාර්යසාධන ඇගයීම් වැඩසටහන මඟින් ජාතික තරුණ සේවා සභාවේ සේවයේ නියුතු නිලධාරීන්ගේ කාර්යසාධනය මැන බැලීම හා ඔවුන්ගේ කාර්යසාධනය ඉහළ නැංවීමට අවශ්‍ය කටයුතු සිදු කෙරේ. ඉහළ කාර්යසාධනයක් සහිත නිලධාරීන් හට තිළිණ, සහතිකපත් ලබා දීම මෙන්ම කාර්යසාධනය අවම මට්ටමක පවතින නිලධාරීන් හට ප්‍රශස්ත මට්ටමකට ඔවුන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප ළඟා කර ගැනීමට අවශ්‍ය කටයුතු කාර්යසාධන ඇගයීම් වැඩසටහන හරහා සිදු කෙරේ.

**වගුව 20 - 2017 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන් හා වැඩමුළු.**

| අනු අංක | පුහුණු වැඩසටහන් ක්ෂේත්‍ර | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගික සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | කාර්ය මණ්ඩල පුහුණු ක්ෂේත්‍රය | 30 | 2112 |
| 02 | කාර්යසාධන ඇගයීම් වැඩසටහන් | 14 | 297 |

**පින්තූරය 09 - කාර්යසාධන ඇගයීම් හා නිලධාරී පුහුණු අංශයේ ක්‍රියාකාරකම් වල විශේෂ අවස්ථා.**





## 4.10 මාධ්‍ය අංශය.

ජාතික තරුණ සේවා සභාවේ මාධ්‍ය අංශය ස්ථාපිත කර ඇත්තේ සුවිශේෂ අරමුණු රැසක් පදනම් කරන ගෙනය. ජාතියක් හමුවේ බලසතු වු තරුණයෙකු නිර්මාණය කිරීම ජාතික තරුණ සේවා සභාවේ දර්ශනයයි.

බලසතු වු තරුණයෙකු නිර්මාණය කිරීමටත් ඔහුට පිළිගැනිමත් ලබා දෙන්නටත්, ඔහු වෙනුවෙන් ස්ථාපිත කර ඇති තරුණ සංවර්ධන වැඩසටහන් සඳහා පුළුල් ප්‍රචාරයක් ලබා දිම සඳහාත්, ශ්‍රව්‍ය, දෘශ්‍ය, මුද්‍රිත මාධ්‍යයෙන් පිරිපුන් තරුණ කණ්ඩායමක් රටට දායාද කිරීමත්, මාධ්‍ය අංශයේ බලාපොරොත්තුවයි.

සන්නිවේදනයෙන් තොරව ජීවත්වීම පවා අපහසු යුගයක මාධ්‍ය අංශය නිරන්තරව ජාතික තරුණ සේවා සභාවේ අරමුණු පරමාර්ථ සාක්ෂාත් කර ගැනිම සඳහා තරුණ සංවර්ධනයට ජවයක් ලබා දිම වෙනුවෙන් මාධ්‍ය අංශය ක්‍රියා කරන අතර ශ්‍රී ලංකාවේ ජනතාව තුළ තරුණ සංවර්ධනයේ වටිනාකම විදහා පෑමට අවශ්‍ය මාධ්‍ය මෙහෙවර ඉටුකරමින් සිටිමු.

වගුව 21 - මාධ්‍ය අංශය මඟින් 2017 වසරේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්.

| අනු අංක | වැඩසටහන | සිදු කළ ක්‍රියාකාරකම් සංඛ්‍යාව | ඉලක්ක පිරිස | සහභාගික සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | මාධ්‍ය ප්‍රචාරණය | 16 | තරුණතරුණියන් හා පොදු මහජනතාව | - |
| 02 | මාධ්‍ය පාසල් | 20 | අවු.15ත් 20ත් අතර පාසල් සිසුන් | 4000 |
| 03 | පළාත් මාධ්‍ය වැඩමුළුව | 12 | මාධ්‍ය සඳහා ඇල්මක් දක්වන වයස අවු.18-27 අතර තරුණ තරුණියන් | 600 |
| 04 | ජාතික මාධ්‍ය වැඩමුළුව | 01 | මාධ්‍ය සඳහා ඇල්මක් දක්වන වයස අවු.18-27 අතර තරුණ තරුණියන් | 100 |

පින්තූර 10 - මාධ්‍ය අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල විශේෂ අවස්ථා.






## 4.11 තොරතුරු තාක්ෂණ ක්‍රියාකාරකම්.

**අංශයේ කාර්ය භාරය;**

ජාතික තරුණ සේවා සභාවේ තොරතුරු තාක්ෂණික සංවර්ධන අංශය මගින් ජාතික තරුණ සේවා සභාවේ සියලුම තොරතුරු තාක්ෂණික අවශ්‍යතා සපුරාලීම වෙනුවෙන් පිහිටුවා ඇත. එම අවශ්‍යතා අතර,

01. ජාතික තරුණ සේවා සභාවේ ක්‍රියාකාරකම් නවීන තාක්ෂණය භාවිතා කර ඉටු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික පහසුකම් සංවර්ධනය කිරීම.
02. කාර්යක්ෂම සන්නිවේදන ක්‍රමවේදයක් සැකසීම මගින් ශ්‍රී ලාංකීය තාරුණ්‍ය වෙත තොරතුරු සන්නිවේදනය
03. ජාතික තරුණ සේවා සභාවේ නිල වෙබ් අඩවිය සංවර්ධනය හා යාවත්කාලින කිරීම තුළින් තොරතුරු ඉක්මනින් ලබා දීම.
04. ජාතික තරුණ සේවා සභාවේ පවතින පරිගණක ජාල පද්ධතිය නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම.

05. ජාතික තරුණ සේවා සභාවේ යෞවන සමාජ /පුහුණු මධ්‍යස්ථාන තරුණ තරුණියන්ගේ තොරතුරු තාක්ෂණ භාවිතය හා ආරක්ෂාව පිලිබදව දැනුවත් කිරීමේ වැඩමුළු සංවිධානය හා ක්‍රියාත්මක කිරීම.

<u>**2017 වසරේ කරන ලද ක්‍රියාකාරකම්.**</u>

1. 2017 ජනවාරි වන විට ජාතික තරුණ සේවා සභාවට සමාන්තර සේවා සපයනු ලබන රාජ්‍ය,පෞද්ගලික,රාජ්‍ය නොවන සංවිධාන පිළිබද තොරතුරු ඒකරාශී කිරීම.
2. තරුණ සේවා සභාව සහ හවුල්කාර ආයතන විසින් සිදු කරන ක්‍රියාකාරකම් පිළිබද ඒකාබද්ධ වාර්තා කාර්තුවට එක බැගින් ගොනු කිරීම.
3. තරුණ සේවා සභාවේ සියලුම නිලධාරීන්ගේ තොරතුරු පද්ධතියක (Database) සැකසීම.
4. ජාතික තරුණ සේවා සභාවේ වෙබ් පිටුව www.nysc.lk භාවිතයෙන් ජාතික තරුණ සේවා සභාවේ ඉතිහාසයේ සිට මේ දක්වා තොරතුරු ද ප්‍රධාන කාර්යාලයේ සියලුම අංශ / දිස්ත්‍රික් කාර්යාල / පළාත් කාර්යාල සහ පුහුණු මධ්‍යස්ථාන තොරතුරු මෙන්ම පුහුණු මධ්‍යස්ථාන වලින් සිදු කරන සියලුම පාඨමාලා සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට පහසු වන සේ ත්‍රෛ භාෂා වෙබ් පිටුව නිර්මාණය කිරීම.
5. ජාතික තරුණ සේවා සභාවේ වෙබ් පිටුවෙහි online chat අයිතමය මගින් සියලුම බාහිර ප්‍රජාවේ ප්‍රතිපොෂණය මත පදනම් සේවාවන් ඉතා ඉක්මනින් සිදු කිරීමට පහසුකම් සැපයීම. (මේ හරහා සියලුම පැමිණිලි / විවේචන අප සමග අන්තර්ජාලය හරහා සාකච්ඡ කල හැකිය.)
6. ජාතික තරුණ සේවා සභාවේ වෙබ් පිටුවේ අන්තර්ගත app part යටතේ ජාතික තරුණ සේවා සභාවට අදාළ සියලුම යෞවන සමාජයන්හි ක්‍රියාකාරී සාමාජිකයන් හට සියලුම තොරතුරු ඇතුලත් කරමින් 40,000 වැඩි දත්ත පද්ධතියක් සැකසීම.
7. ජාතික තරුණ සේවා සභාවේ වෙබ් පිටුවේ පාඨමාලා අයිතමය මගින් දැනට ජාතික තරුණ සේවා සභාවේ සියලුම පාඨමාලා සඳහා online තාක්ෂණය ඔස්සේ ලියාපදිංචි වීමේ හැකියාව සැලසීම.

## 4.12 විභාග හා ඇගයීම් අංශය.

ජාතික තරුණ සේවා සභාවේ පුහුණු මධ්‍යස්ථානයන් හි පවත්වනු ලබන පාඨමාලා සඳහා විධිමත් ලෙස අවසන් පරීක්ෂණ පවත්වා ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිළිගත සහතික පත් ප්‍රදානය කිරීම මෙම අංශය මඟින් සිදු කරන අතර ජාතික තරුණ සේවා සභාවේ සියලුම පුහුණු මධ්‍යස්ථානයන්හි පවත්වනු ලබන පාඨමාලා සඳහා එක් අනුමත කාලසීමාවක් තුළ කටයුතු අවසන් කිරීම හා අවසන් පරීක්ෂණ පැවැත්වීම මෙම අංශයේ මූලික අරමුණ වේ.

- දිවයින පුරා මධ්‍යස්ථාන 52ක පාඨමාලා 64ක් වෙනුවෙන් වර්ෂයකට කාර්තු 02ක් සඳහා ප්‍රායෝගික හා ලිඛිත අවසන් පරීක්ෂණ විධිමත්ව හා ක්‍රමවත් ලෙස පැවැත්වීම ප්‍රධාන කාර්යය වේ.
- අවසන් පරීක්ෂණ නිම කළ පසු තෙමසක් ගතවීමට පෙර විභාග ප්‍රතිඵල මධ්‍යස්ථාන වෙත නිකුත් කරමින් සමත් වූ අභ්‍යාසලාභීන් සඳහා පළාත්,දිස්ත්‍රික් හා මධ්‍යස්ථාන මට්ටමින් NVQ හා Non NVQ සහතිකපත් ඉතා කඩිනමින් හා ක්‍රමවත්ව උත්සවාකාරයෙන් බෙදා දීම සිදු කෙරේ.
- පාඨමාලා අවසන් පරීක්ෂණ නිම වූ පසු අභ්‍යාසලාභීන් සය මාසික රැකියාගත පුහුණුවකට (OJT) යොමු කළ යුතු අතර එසේ එසේ රැකියාගත කළ අභ්‍යාසලාභීන්ගේ සමස්ත ප්‍රගතිය මධ්‍යස්ථාන මට්ටමින් අධීක්ෂණ කටයුතු අප විසින් විධිමත්ව ඉටු කරයි.

- ජාතික තරුණ සේවා සභාවේ පුහුණු මධ්‍යස්ථානයන්හි පවත්වනු ලබන නිපුණතා පාදක පාඨමාලා සඳහා ඇගයීම් පවත්වා ජාතික හා ජාත්‍යන්තරව පිළිගනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් සහිත NVQ සහතික පත් නිකුත් කිරීම.
- ඒ තුළින් වෘත්තීය නිපුණත්වය සපුරනු ලබන තරුණ තරුණියන් හට ඉතා කඩිනමින් රැකියාගත වීමට අවස්ථාව සැළසීම සිදුවේ.
- ජාතික තරුණ සේවා සභාවේ මධ්‍යස්ථානවල ඇති සියලුම පාඨමාලා සඳහා පොදු විෂය මාලාවක් යටතේ ඉගැන්වීම සඳහා විෂයමාලා සංවර්ධනය ද අප අංශය මඟින් ඉටු කරයි.

- ජාතික තරුණ සේවා සභාවේ පුහුණු පාඨමාලා පැවැත්වෙන සියලු මධ්‍යස්ථානවල දරුවන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශන ලබා දීම සඳහා උපදේශක උපදේශිකාවන් පුහුණු කිරීම.

**වගුව 22 - 2017 වර්ෂයේ විභාග හා ඇගයීම් අංශයේ වැඩසටහන් පිළිබඳ විස්තරය.**

| අනු අංක | වැඩසටහනේ නම | සහභාගීත්වය | |
|---|---|---|---|
| | | පළමු කාර්තුව | දෙවන කාර්තුව |
| 01 | ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම | 9420 | 9870 |
| 02 | පාඨමාලා අවසන් විභාග පැවැත්වීම | 9420 | 9870 |
| 03 | සහතිකපත් ප්‍රදානය | 7269 | 7408 |
| 04 | NVQ අවසන් ඇගයීම් කටයුතු | 550 | 700 |
| 05 | NVQ ලිඛිත විභාගය | 924 | 699 |
| 06 | NVQ සහතික පත් නිකුත් කිරීම | 750 | 450 |
| 07 | OJT වැඩසටහන | 1300 | 1520 |

පින්තූරය 11 - විභාග හා වෘත්තීය ඇගයීම් අංශයේ ක්‍රියාකාරකම් වල විශේෂ අවස්ථා.





## 4.13 විශේෂ ව්‍යාපෘති අංශය

**<u>Youth with Talent තුරුණු ශ්‍රම ශක්ති ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති 3000 වැඩසටහන-2017.</u>**

යොවුන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් ග්‍රාමීය හා නාගරික ප්‍රජාව මුහුණ දෙනු ලබන විවිධ ගැටලු හඳුනා ගෙන, ඊට විසඳුම් සෙවීමටත්, රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ කාර්යයෙහිලා තරුණයින්ගේ කාර්යභාරය පිළිබඳ තරුණයින් තුළ අවබෝධය මෙන්ම, ඊට සක්‍රීය දායකත්වය ලබාදීමට අවස්ථාව සැලසීම හා යෞවන සමාජ තරුණ තරුණියන් අතර, තරඟකාරීත්වය සහ ජයග්‍රහණය පිළිබඳ හැඟීම් දිරිගැන්වීම සහ ජාතික තරුණ සේවා සභාව ස්ථාපිත කිරීමේදී ඇතිකරගත් අරමුණු මුදුන්පත් කරලීමට කටයුතු කෙරේ.

**<u>ව්‍යාපෘති ක්‍රියාත්මක ක්ෂේත්‍රයන්.</u>**

1. පොදු අවශ්‍යතා මත පදනම් වූ ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති.
2. පාරිසරික සංවර්ධන හා සංරක්ෂණ ව්‍යාපෘති.
3. තාක්ෂණික හා නව උත්පාදන ව්‍යාපෘති.
4. ආර්ථික හා රැකියා උත්පාදන ව්‍යාපෘති.
5. කෘෂි හා වාරි කර්මාන්ත ව්‍යාපෘති.
6. ප්‍රදේශයට සුවිශේෂී වූ විශේෂ ව්‍යාපෘති.

පින්තූර 12 -තුරුණු ශ්‍රම ශක්ති ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියේ විශේෂ අවස්ථාවන්.





**<u>Youth with Talent Show-2017.</u>**
**<u>(සුවිශේෂී තරුණයා තේරීමේ ප්‍රසාංගික වැඩසටහන) .</u>**

පුද්ගලයාට පමණක් සුවිශේෂී වූ සැඟවුණු විභවතාවන් හා හැකියාවන් ඇති තරුණ තරුණියන් හඳුනාගෙන දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් තරඟ පවත්වා ඔවුන්ගේ කුසලතාවයන් ඔප්නංවා ජාතික තලයට ඔසවා තැබීම හා ජාත්‍යන්තරය ජයගත හැකි අභිමානවත් තරුණ පිරිසක් බිහි කිරීමට කටයුතු කෙරේ.

පින්තූර 13 - Youth With Talent වැඩසටහනේ විශේෂ අවස්ථා.





මෙම වැඩසටහන ජාතික තරුණ සේවා සභාව, ස්වාධීන රූපවාහිනී ආයතනය සමඟ ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වනු ඇත.

## <u>යොවුන් පාර්ලිමේන්තුව-2017/2018.</u>

රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනයේදී හා සැලසුම්කරණයේදී තාරුණ්‍යයට ඉඩ ප්‍රස්ථා ලබාදීමටත්, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රම පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව ලබාදීමටත් විවිධ ජාතීන්ට විවිධ මත, අදහස් දරමින් සම්මුතිවාදීව සංවාද තුලින් සංහිඳියාවක් ගොඩනගමින් අනාගත තරුණ දේශපාලන නායකයින් බිහි කිරීම ශ්‍රී ලංකා යොවුන් පාර්ලිමේන්තුවෙන් අපේක්ෂා කෙරේ.

- කාලය - අවුරුදු 1 1/2 -02
- සංයුතිය - මන්ත්‍රීවරු 225
- යෞවන සමාජ සාමාජික ඡන්දයෙන් මැතිවරණ කොට්ඨාස මට්ටමින් - 160
- ප්‍රසාද මන්ත්‍රී, විශ්ව විද්‍යාල ඇතුළු විවිධක්ෂේත්‍ර නියෝජනය සහ විවිධ වෘත්තීය ක්ෂේත්‍ර නියෝජනයෙන් පත්කල මන්ත්‍රීවරු - 65

පින්තූර 14 - විශේෂ ව්‍යාපෘති අංශයේ විශේෂ අවස්ථාවන්හි ඡායාරූප.





## 4.14 යෞවන තිළිණ අංශය.

<u>අංශය පිළිබඳ හැඳින්වීම.</u>

1980 වසරේ යෞවන කටයුතු හා රැකීරක්ෂා අමාත්‍යාංශය යටතේ ජාතික තරුණ සේවා සභාවට අනුබද්ධිත ආයතනයක් ලෙස ස්ථාපනය කර ඇති ජාතික යෞවන තිළිණ අධිකාරිය වර්ථමානයේ ජාතික තරුණ සේවා සභාවේ ජාතික යෞවන තිළිණ ප්‍රදාන අංශය ලෙස ක්‍රියාත්මක වේ.
2017 වර්ෂය වන විට ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති ජාතික තරුණ සේවා සභාවේ අංශයක් ලෙස යෞවන තිළිණ අංශය ක්‍රියාත්මක විය.

එක්සත් රාජධානියේ දී ආරම්භ කරන ලද එඩින්බරෝ ආදිපාද ජාත්‍යන්තර තිළිණ වැඩසටහන ශ්‍රී ලංකාවේ ආරම්භ කරන ලද්දේ 1980 වර්ෂයේ එවකට යෞවන කටයුතු හා රැකීරක්ෂා අමාත්‍යාවරයාව සිටි වර්තමාන අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා විසිනි.
මෙම වැඩසටහන වයස අවුරුදු 14-24 ත් අතර තරුණ තරුණියන්ගේ විවේක කාලය ඵලදායි ලෙස ගතකිරීම සඳහා සැළසුම් කරන ලද අධ්‍යාපනික ක්‍රියාකාරකම් සහිත තරුණ සංවර්ධන වැඩසටහනකි. සේවා, ගවේෂණ, කුසලතා හා රුචිකත්ව හා ශාරීරික යෝග්‍යතා යන අධ්‍යාපනික ක්‍රියාකාරකම්වල නිරතවන තරුණ තරුණ තරුණයින්ගේ පෞරුෂත්ව වර්ධනය අන්තර්ජාතික සම්බන්ධතා ඇතිකරලීම අභියෝග ජයගැනීම, නව සොයාගැනීම්වලට තරුණයින් උනන්දුව ඇතිකරලීම ආදි අරමුණු තුලින් සමස්ථ සමාජ හා ආර්ථිකයට සුදුසු පරිපූර්ණ තරුණයෙකු නිර්මාණය කිරීම මෙම වැඩසටහනේ මූලික පරමාර්ථය වේ. එසේ තිළිණ ක්‍රියාකාරකම් සම්පූර්ණ කිරීමෙන් අනතුරුව , යෞවන තිළිණ අංශයේ ඇගයීම් කරුවන් විසින් එම සටහන් හා වාර්තා අධීක්ෂණය කිරීමෙන් පසු, සුදුසුකම් සපුරා ඇති තරුණ තරුණියන් හට තිළිණ හා සහතිකපත් ජාතික මට්ටමේ උත්සවයක දී රටේ ප්‍රධානීන් අතින් ප්‍රදානය කරණු ලැබේ.

<u>**2017 වසර තුල යෞවන තිළිණ ප්‍රදාන අංශය මගින් අත්කරගත් විශේෂ ප්‍රතිලාභ.**</u>

1. එඩින්බරෝ ආදිපාද ජාත්‍යන්තර තිළිණ වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් සියලුම පාසල් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශය අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කර අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ අත්සනින් ලිපියක් පාසල් වෙත නිකුත් කිරීමට කටයුතු කිරීම.

2. මෙම ජාත්‍යන්තර යෞවන තිළිණ වැඩසටහන ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක කිරීම සඳහා මෙතෙක් යෞවන තිළිණ ප්‍රදාන අංශයට ලබා දී තිබූ තාවකාලික බලපත්‍රය වෙනුවට 2017 සැප්තැම්බර් මස සිට විධිමත් බලපත්‍රයක් ලබා ගැනීමට හැකිවීම.

3. එඩින්බරෝ ආදිපාද ජාත්‍යන්තර තිළිණ පදනමේ අන්තර් ජාතික සභාවට (International Council ) ආසියා පැසිපික් කළාපය නියෝජනය කරමින් නැගීඑන තරුණ නායිකාව ලෙස ප්‍රථමවරට ශ්‍රී ලංකාවේ ස්වර්ණ තිළිණ ලාභී තරින්ද්‍ර අරුමප්පෙරුම මෙනවිය පැවති ඡන්දයෙන් තේරීපත්වීම වසර 37ක ඉතිහාසය තුළ ශ්‍රී ලංකාව ලබාගත් ජයග්‍රහණයකි.

4. කලාපයේ සාමාජික රටවල් අතර අන්‍යෝන්‍ය අවබෝධය, සහයෝගය, මිත්‍රත්වය, ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ප්‍රථමවරට ශ්‍රී ලාංකික තරුණ කණ්ඩායමක් නේපාලයේ කත්මණ්ඩු නගරයේ ගවේෂණ චාරිකාවක නිරතවීම.

5. දිවයිනේ ඉතා දුෂ්කර දිස්ත්‍රික්ක වන මොණරාගල, පුත්තලම, අම්පාර, බදුල්ල වැනි දිස්ත්‍රික්ක තුල යෞවන තිළිණ වැඩසටහන ආරම්භ කිරීමට හැකිවීම.

6. 2016 වර්ෂයේ 81 ක්ව තිබූ යෞවන තිළිණ ඒකක සංඛ්‍යාව 100 දක්වා වර්ධනය කරගැනීමට හැකි වීම.

**වගුව 23 - 2017 වර්ෂයේ යෞවන තිළිණ ප්‍රධාන අංශය මගින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් තොරතුරු.**

| අනු අංක | ක්‍රියාත්මක කළ වැඩසටහන | සහභාගීත්වය |
|---|---|---|
| 01 | යෞවන තිළිණ ප්‍රදානෝත්සවය | 1281 |
| 02 | යෞවන තිළිණ පුහුණු මණ්ඩල සාමාජිකයන් පුහුණු කිරීමේ වැඩසටහන | 02 |
| 03 | යෞවන තිළිණ නායක නායිකාවන්ගේ කාර්යක්ෂමතාවය වර්ධනය කිරීමේ වැඩසටහන | 52 |
| 04 | 1 නව තිළිණ නායක පුහුණු වැඩසටහන (කුරුණෑගල දිස්ත්‍රික්කය) | 37 |
| | 2 පාසල් සිසුන් දැනුවත් කිරීම | 85 |
| 05 | නව තිළිණ නායක පුහුණු වැඩසටහන(පුත්තලම දිස්ත්‍රික්කය) | 30 |
| 06 | යෞවන තිළිණ වැඩසටහන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීම සඳහා බලපත්‍ර ලබාදීමේ පූර්ණ අධීක්ෂණ කටයුතු හා ඒ සඳහා ජාත්‍යන්තර තිළිණ පදනමේ අධ්‍යක්ෂිකා සුවෝකර් මෙනවිය පැමිණීම. | 82 |
| 07 | ආසියා පැසිපික් කලාපීය වාර්ෂික සමුළුව | 02 |
| 08 | ළමා ආරක්ෂක නියමු නිලධාරීන් දැනුවත්කිරීමේ වැඩසටහන | 52 |
| 09 | යෞවන තිළිණ අපේක්ෂකයින්ගේ ජාත්‍යන්තර අභියෝගාත්මක චාරිකාව | 23 |
| 10 | බන්ධනාගාර හා ළමා නිවාස ආශ්‍රිතව යෞවන තිළිණ වැඩසටහන ක්‍රියාකත්මක කිරීම | 42 |
| 11 | ජාත්‍යන්තර ස්වර්ණ තිළිණ සමුළුව | 01 |
| 12 | එඩින්බරෝ ආදිපාද ජාත්‍යන්තර තිළිණ වැඩසටහන දුෂ්කර පාසල් ආශ්‍රිතව ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතිය (වැඩසටහන් 12) | 258 |

පින්තූර 15 - යෞවන තිළිණ ප්‍රදාන අංශයේ ක්‍රියාකාරකම්.





## 4.15 තරුණ සමුපකාර හා ව්‍යාපාර සහ සංවර්ධන අංශය.

**දැක්ම :-** ලාංකික තරුණ ප්‍රජාවගේ ආර්ථික අස්ථාවරත්වය අවම කිරීමට මඟ පෙන්වමින් ව්‍යවසායක සංස්කෘතියක් රට තුළ ගොඩනංවන පුරෝගාමී ආයතනයක් වීම.

**මෙහෙවර :-** උපරිම ඵලදායීතාවයකින් හා කාර්යක්ෂමතාවයකින් යුතුව දැනුම, ආකල්ප හා කුසලතා පරිපූර්ණ සේවක මණ්ඩලයකින් විවිධ උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කරමින් තරුණ ව්‍යවසායකයින්ට සේවා සැපයීම සඳහා තරුණ සමුපකාර ජාලය ගුණාත්මක, ප්‍රමාණාත්මක හා තිරසාර ලෙස සංවර්ධනය කිරීම අපගේ මෙහෙවරයි.

**වගුව 24 - තරුණ සමුපකාර හා ව්‍යාපාර සංවර්ධන අංශයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්.**

| අනු අංක | වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගික සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන | 17 | 522 |
| 02 | මත්ස්‍ය නිෂ්පාදන පුහුණු වැඩසටහන | 02 | 54 |
| 03 | දේශීය ආහාර වර්ග සැකසීම හා අලෙවිකිරීම | 01 | 30 |
| 04 | නිස්කෝ දිස්ත්‍රික් සමිති ප්‍රගති සමාලෝචන | 01 | 65 |
| 05 | ව්‍යාපාර තාක්ෂණ පාසල | 01 | සහභාගික සංඛ්‍යාව ප්‍රමාණවත් නොවූ හෙයින් වැඩසටහන පැවැත්වීමට නොහැකි විය. |

ඉහත සඳහන් වැඩසටහන් පැවැත්විම ස්වයංරැකියා කෙරෙහි තරුණ තරුණියන් පෙළඹවීම හා එම වසර තුළ ඉදිරිපත් කරන ලද ණයලාභීන්.

I. නිස්කෝ සමිති මඟින් රු: 5000.00 සිට 350,000.00 දක්වා ණය ලබා දී ඇති ප්‍රතිලාභීන්- 598 මුදල රු:13,807,400.00

II. ව්‍යවසායකත්ව වැඩසටහන් පැවැත්වීමෙන් පසු ස්වයං රැකියා සඳහා රු: 500,000.00 ණය නිකුත් කරන ලද ප්‍රතිලාභීන් - 02 මුදල - රු: 1,000,000.00

III. ව්‍යවසායකත්ව වැඩසටහන් පැවැත්වීමෙන් පසු ස්වශක්ති ණය යොජනා ක්‍රමය යටතේ රු;250,000/= ණය ලබාගත් ණයලාභීන් - 24 මුදල - රු:6,000.000.00

පින්තූර 16 - තරුණ සමූපකාර හා ව්‍යාපාර සංවර්ධන අංශයේ වැඩසටහන්වල ඡායාරූප





## 5. පාලන අංශයේ ක්‍රියාකාරකම් - 2017

### 5.1 ආයතනික කටයුතු.

2017.01.01 සිට 2017.12.31 දින දක්වා ජාතික තරුණ සේවා සභාවේ ආයතන අංශය විසින් ඉටු කරන ලද කාර්යභාරය.

1979 අංක 69 දරණ ජාතික තරුණ සේවා පනත යටතේ වැටසටහන් ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය වන සේවක සංඛ්‍යාව බඳවා ගැනීම යටතේ ආයතන අංශයට පැවරී ඇති කාර්යභාරය අනුව 2017 වර්ෂය තුළදී උසස්වීම් ලබා දී ඇත. එහෙත් ස්ථාන මාරුවීම්, විනයානුකූල නියෝග අනුව සේවයෙන් පහ කිරීම්, ධූරය අතහැර යෑම,වැටුප් හා වේතනයන්,සේවයෙන් විශ්‍රාම ගැන්වීම හා සේවයෙන් ඉල්ලා අස්වීමද පූර්ව වර්ෂවලදී කටයුතු කර ඇති ආකාරයෙන්ම සිදුවී ඇත. අනුමත සේවක සංඛ්‍යාව සහ පුරප්පාඩු සේවක සංඛ්‍යාව පිලිබඳ විස්තර පහත දැක්වේ.

**වගුව 25 - ආයතන අංශයේ ආයතනික කටයුතු පිළිබඳ තොරතුරු.**

| අනු අංක | ආයතනික කටයුත්ත | තනතුර | සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | නව බඳවා ගැනීම්(ස්ථිර) | සහකාර අධ්‍යක්ෂ | 01 |
| | | සිවිල් ඉංජිනේරු | 01 |
| | | කාර්මික සහකාර | 03 |
| | | විදුලි කාර්මික | 05 |
| | | සහකාර තරුණ සේවා නිලධාරී | 68 |
| | | කලමණාකරණ සහකාර | 71 |
| | | | |
| 02 | සහකාර අධ්‍යක්ෂ තනතුරේ රාජකාරි ඉටුකිරීම - පත්වීම් ලබාදීම | සහකාර අධ්‍යක්ෂ | 23 |
| | | | |
| 03 | නව බඳවා ගැනිම්(කොන්ත්‍රාත්) | පුහුණු උපදේශක | 24 |
| | | | |
| | | | |
| 04 | නව බඳවා ගැනිම් (අනියම්) | රියදුරු | 03 |

| | | | |
|---|---|---|---|
| | | කාර්යාල කාර්ය සහායක | 05 |
| | | | |
| 05 | උසස්වීම් ලබා දීම | පුහුණු කළමණාකරු | 10 |
| | | ප්‍රසම්පාදන නිලධාරී | 01 |
| | | පරිගණක වැඩසටහන් | 01 |
| | | ප්‍රචාරක නිලධාරී | 02 |
| | | භාෂා පරිවර්තක | 01 |
| | | පුස්තකාලාධිපති | 01 |
| 06 | අනියම් සේවකයින්ට ස්ථිර පත්වීම් ලබාදීම | සහකාර තරුණ සේවා නිලධාරී | 12 |
| | | | |
| 07 | විශ්‍රාම ගැන්වීම | නියෝජ්‍ය අධ්‍යක්ෂ | 01 |
| | | ත.සේ.නි.1 දි.ත.සේ.නි.(ආවරණ) | 01 |
| | | ශිල්පී(නැටුම්) | 01 |
| | | දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරී | 01 |
| | | රියදුරු I ශ්‍රේණිය | 04 |
| | | තරුණ සේවා නිලධාරී 1 | 06 |
| | | කම්කරු | 01 |
| | | කලමනාකරණ සහකාර 1 | 07 |
| | | කාර්මික I ශ්‍රේණිය | 02 |
| | | මුරකරු | 02 |
| | | කලමණාකරණ සහකාර (තාක්ෂණික) | 01 |
| | | පොත් තබන්නා | 02 |
| | | මුරකරු | 01 |
| | | නියෝජ්‍ය අධ්‍යක්ෂ(ආවරණ) | 01 |
| | | පරිපාලන නිලධාරී | 01 |
| | | ප්‍රවාහන නිලධාරී | 01 |
| | | සහකාර අධ්‍යක්ෂ | 01 |
| | | | |
| 08 | **සිය කැමැත්තෙන් විශ්‍රාම ගොස් ඇති නිලධාරීන්ගේ නාම ලේඛනය** | තරුණ සේවා නිලධාරී 1 | 02 |
| | | තරුණ සේවා නිලධාරී 1 (ආශ්‍රිත නිලධාරී II) | 01 |
| | | සහකාර තරුණ සේවා නිලධාරී | 01 |
| | | | |
| 09 | **සේවයෙන් ඉල්ලා අස්වීම** | රියදුරු | 02 |
| | | කළමණාකරණ සහකාර | 02 |
| | | සහකාර තරුණ සේවා නිලධාරී | 21 |
| | | මුරකරු | 01 |
| | | සහාය භාෂා පරිවර්තක | 01 |
| | | කම්කරු | 02 |
| | | කාර්යාල සහයක | 02 |
| | | තරුණ සේවා නිලධාරී | 01 |
| | | පොත් තබන්නා | 01 |
| | | විදුලි කාර්මික ශිල්පී | 01 |
| | | පෞද්ගලික ලේකම්(කොන්ත්‍රාත් ) | 01 |

| | | | |
|---|---|---|---|
| | | ඉංජිනේරු (සිවිල්) | 01 |
| | | නිවාස පාලිකා | 01 |
| | | නිකේතනාධිපති(කොන්ත්‍රාත්) | 01 |
| | | සහකාර තරුණ සේවා නිලධාරී II | 01 |
| | | පටිගත කිරීමේ නිලධාරී II | 01 |
| 10 | **ධූරය අතහැර යාම** | තරුණ සේවා නිලධාරී | 01 |
| | | සහකාර තරුණ සේවා නිලධාරී | 04 |
| | | තරුණ සේවා නිලධාරී I | 01 |
| | | කළමණාකරණ සහකාර III | 01 |
| | | කම්කරු | 01 |
| | | | |
| 11 | **නැවත සේවයේ පිහිටුවීම** | තරුණ සේවා නිලධාරී II | 01 |
| | | | |
| 12 | **සේවය අවසන් කිරීම** | කාර්යාල සහායක (අනියම්) | 01 |
| | | කලමණාකරණ සහකාර | 01 |
| | | | |
| 13 | වැඩ තහනම් කිරීම | - | - |

## 14. කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය.

2017 වර්ෂයේ පහත සඳහන් නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වා ඇත.

01. 2013 හා 2014 වර්ෂවලට අදාල සියළුම තනතුරු I,II,III ශ්‍රේණිවල අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වා ඇත.
02. 2015 වර්ෂයේ III ශ්‍රේණියේ සියළුම තනතුරුවලට කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වා ඇත.
03. 2014, 2015 හා 2016 වර්ෂයේ සියලුම ප්‍රාථමික නිලධාරීන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පවත්වා ඇත.

## 15. දුරකථන පහසුකම් .

| | **දුරකථන අංක** |
|---|---|
| නීති විමර්ෂණ අංශය | 0112089547 |
| තරුණ මධ්‍යස්ථාන අංශය | 0112838952 |
| අධ්‍යක්ෂ පාලන කාර්යාලය | 0112842661 |

නීති විමර්ෂණ අංශය- නීති විමර්ශන අංශය

## 16. ණය අත්තිකාරම් .

සභාවේ සියලුම සේවකයින්ට ආපදා ණය පහසුකම් ලබා ගැනීමට පහසුකම් සළසා ඇත. ඒ අනුව 2017 ජනවාරියේ සිට 2017 දෙසැම්බර් දක්වා ආපදා ණය 220 දෙනෙකුට ලබා දී ඇත. ආපදා ණය වශයෙන් රු.46,899,685.00 ක මුදලක් සේවකයින් හා නිලධාරීන් ට ලබා දී ඇත.

## 17. කම්කරු විනිශ්වය සභාවෙන් අධිකරණමය නඩු විභාග.

සභාව විසින් ගන්නා ලද විනය නියෝගයන්ට විරුද්ධව සේවකයන් විසින් අධිකරණයේ හා කම්කරු විනිශ්වට සභාවේ පවරා ඇති නඩු 2017 වර්ෂයේදී විභාගයට ගන්නා ලදි.

**වගුව 26 - විනය නියෝගයන්ට විරුද්ධව සේවකයන් විසින් අධිකරණයේ හා කම්කරු විනිශ්වය සභාවේ පවරා ඇති නඩු පිළිබඳ විස්තර.**

| අනු අංක | පවරා ඇති නඩුවේ ස්වාභාවය | අධිකරණය/විනිශ්වය සභාවේ ස්වාභාවය | නඩු හෝ පැමිණිලි ගණන |
|---|---|---|---|
| 01 | ජාතික තරුණ සේවා සභාව විසින් හා සභාවට එරෙහිව පවරා විභාග වෙමින් පවතින නඩු | ශ්‍රේෂ්ඨාධිකරණය | 02 |
| | | මහාධිකරණය | 04 |
| | | දිසා අධිකරණය | 14 |
| | | මහේස්ත්‍රාත් අධිකරණය | 04 |
| | | කම්කරු විනිශ්වය සභාව | 02 |
| | | කම්කරු වන්දි කොමිසම | 01 |
| 02 | ජාතික තරුණ සේවා සභාවට එරෙහිව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පවරා ඇති පැමිණිලි | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | 11 |
| 03 | කම්කරු කාර්යාලීය පැමිණිලි | කම්කරු කාර්යාලය | 02 |

## 18. අර්ථසාධක අරමුදල හා සේවානියුක්ති භාර අරමුදල.

2017 වර්ෂයේ විශ්‍රාම ගන්වා ඇති හා ඉල්ලා අස්වී ඇති විශ්‍රාම වැටුප් සහිත රැකියා සඳහා ගොස් ඇති කාර්ය මණ්ඩලය සඳහා හා විශ්‍රාම ගන්නා ලද නිලධාරීන් සඳහා සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ත භාර අරමුදල් දායකය ලබා දීමට කටයුතු කර ඇත.

## 19. ඉඩම් පවරා දීම.

ජාතික තරුණ සේවා සභාවට නීත්‍යානුකූලව පවරා නොගත් සභාවේ ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීමට අදාළ ලිපි ලේඛන සකස් කරගෙන යනු ලබන අතර ඒ සම්බන්ධව කටයුතු සිදුවෙමින් පවතී.

වගුව 27 - නීත්‍යානුකූල ඔප්පු ලැබී ඇති වත්කම් පිළිබඳ විස්තර.

| අනු අංක | පළාත | ඉඩම් සංඛ්‍යාව | ඉඩම්වල ප්‍රමාණය (දළ වශයෙන්) | වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| 01 | ඌව පළාත | 03 | අක්:05 රූඩ්: 03 පර්:25 | ඌව පළාත් කාර්යාලය, බදුල්ල දිස්ත්‍රික් කාර්යාලය,ඔරුබැදිවැව පුහුණු මධ්‍යස්ථානය හා මොණරාගල නිල නිවාසය ක්‍රියාත්මක වේ. |
| 02 | සබරගමු පළාත | 02 | අක්:04 රූඩ්: 02 පර්:10 | සබරගමුව පළාත් කාර්යාලය,දිස්ත්‍රික් කාර්යාලය හා පුහුණු මධ්‍යස්ථානය ක්‍රියාත්මක වේ. කෑගල්ල දිස්ත්‍රික්කයේ ඉඩම සම්බන්ධව නඩුවක් ක්‍රියාත්මක වේ. |
| 03 | බස්නාහිර පළාත | 04 | අක්:20 රූඩ්: 03 පර්:86 | සපුගස්කන්ද පුහුණු මධ්‍යස්ථානය,හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානය හා අත්තනගල්ල පුහුණු මධ්‍යස්ථානය ක්‍රියාත්මක වේ. |
| 04 | උතුරු මැද පළාත | 01 | හෙක්:0.058 | පොළොන්නරුව නිල නිවාසය ක්‍රියාත්මක වේ. |
| 05 | වයඹ පළාත | 01 | අක්:40 රූඩ්: 03 පර්:20.19 | පන්නල පුහුණු මධයස්ථානය ක්‍රියාත්මක වේ. |
| 06 | මධ්‍යම පළාත | 01 | අක්:01 පර්:36 | උලපනේ පුහුණු මධ්‍යස්ථානය ක්‍රියාත්මක වේ. |
| 07 | දකුණු පළාත | 04 | | කහව පුහුණු මධ්‍යස්ථානය,මාතර පළාත් කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාලය හා යායවත්ත පුහුණු මධ්‍යස්ථානය ක්‍රියාත්මක වේ. නිල්වලා තුරුණු උයන ඉදි වෙමින් පවතී. |

වගුව 28 - බදු වශයෙන් ලබා ගෙන ඇති වත්කම් පිළිබඳ විස්තර.

| අනු අංක | පළාත | ඉඩම් සංඛ්‍යාව | ඉඩම්වල ප්‍රමාණය (දළ වශයෙන්) | වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| 01 | බස්නාහිර පළාත | 04 | අක්:18 රූඩ්: 02 පර්:24.69 | පානදුර යොවුන් සවිබලකරණ පුහුණු මධ්‍යස්ථානයද, කළුතර දිස්ත්‍රික් කාර්යාලය හා සහාවෙන් බදු ගිවිසුමක් යටතේ ලබාගෙන වල්පිට පුහුණු මධ්‍යස්ථානයද ක්‍රියාත්මක වේ. |
| 02 | උතුරු මැද පළාත | 01 | අක්:01 රූඩ්: 02 පර්:3.30 | උතුරු මැද පළාත් කාර්යාලය,යොවුන් නිකේතන පුහුණු මධ්‍යස්ථානය ක්‍රියාත්මක වෙමින් පවතී. |
| | | | | |

| | | | | |
|---|---|---|---|---|
| 03 | වයඹ පළාත | 02 | රූඩ්: 03 පර්:03 | පුත්තලම දිස්ත්‍රික් කාර්යාලය,වයඹ පළාත් කාර්යාලය හා නිස්කෝ පුහුණු මධ්‍යස්ථානය ක්‍රියාත්මක වේ. |
| 04 | මධ්‍යම පළාත | 02 | හෙක්:2.188 අක්:10 | පොල්ගොල්ල පුහුණු මධ්‍යස්ථානය හා දඹුල්ල ශ්‍රී ලංකා ස්විස් පුහුණු මධ්‍යස්ථානය ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 05 | නැගෙනහිර පළාත | 01 | පර්:80 | *අම්පාර පුහුණු මධ්‍යස්ථානය ක්‍රියාත්මක වේ. |

*අංක 05 යටතේ අම්පාර පුහුණු මධ්‍යස්ථානය යනු අම්පාර දිස්ත්‍රික් ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කාර්යාල ගොඩනැගිල්ල වන අතර, * අංක 01 යටතේ වල්පිට පුහුණු මධ්‍යස්ථානය ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙන් ලබාගත් එකකි. අනෙකුත් ඉඩම් බදු ලබාගෙන ඇති ඉඩම් වන අතර එම ඉඩම් සඳහා වාර්ෂික බදු මුදල් ගෙවනු ලැබුවද බදු ගිවිසුමක් ලබා දීමක් සිදුවී නොමැත. මෙම බදු ගෙවීම සිදු කරනු ලබන්නේ එකී ඉඩම්වල නොදියුණු වටිනාකම ප්‍රධාන තක්සේරුකරුවන්ගේ වාර්තා කැඳවීමෙන් පසුවය.

**<u>ඉහත වගු දෙකෙහිම සඳහන් නොවන අනෙකුත් ඉඩම් හා ගොඩනැගිලිවල වර්තමාන නීතිමය අයිතිය තහවුරු කරගෙන ඇති ආකාරය හෝ දැනට වත්කම් පරිහරණය කරන පදනම.</u>**

**වගුව 29 - අනෙකුත් ඉඩම් හා ගොඩනැගිලිවල වත්කම් පරිහරණය කරන පදනම.**(ඉහත වගු දෙකෙහිම සඳහන් නොවන)

| අනු අංක | පළාත | ඉඩම් සංඛ්‍යාව | ඉඩම්වල ප්‍රමාණය (දළ වශයෙන්) | වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| 01 | බස්නාහිර පළාත | 10 | හෙක්:0.1004 අක්:10.5 රූඩ්: 05 පර්:2.09 | ප්‍රධාන කාර්යාලය, පාදුක්ක තරුණ මධ්‍යස්ථානය, හෝමගම තරුණ මධ්‍යස්ථානය,කොළොන්නාව මධ්‍යස්ථානය, ලලිත් ඇතුලත්මුදලි පුහුණු මධ්‍යස්ථානය, ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය, මීවනපලාන පුහුණු මධ්‍යස්ථානය,කොබවක පුහුණු මධ්‍යස්ථානය, යෞවන සමාජ ප්‍රාදේශීය බල මණ්ඩලයේ ක්‍රීඩාපිටිය පිහිටා තිබේ. |
| 02 | දකුණු පළාත | 10 | මැනුම් සිදු කිරීමට නියමිතය. | ඇල්පිටිය පුහුණු මධ්‍යස්ථානය,යෞවන සමාජ ප්‍රාදේශීය බල මණ්ඩලය,අක්මීමණ පුහුණු මධ්‍යස්ථානය,අකුරැස්ස පුහුණු මධ්‍යස්ථානය,එරමිණියාය පුහුණු මධ්‍යස්ථානය ක්‍රියාත්මක වෙමින් පවතින ඉඩම් පිහිටා ඇති අතර, නිස්කෝ සමූපකාර සමිතිය ඉදිකිරීමට යෝජිත ඉඩම, තරුණ මධ්‍යස්ථානයක් ක්‍රියාත්මක කිරීමට යෝජිත ඉඩම් 2ක්,පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීමට යෝජිත ඉඩම ආදියද පිහිටා ඇත. |
| 03 | ඌව පළාත | 04 | අක්:4 පර්:5 | සියඹලාණ්ඩුව තරුණ මධ්‍යස්ථානය, මඩුල්ල පුහුණු මධ්‍යස්ථානය,මොණරාගල දිස්ත්‍රික් කාර්යාලය, පුහුණු මධ්‍යස්ථානය හා නිස්කෝ කාර්යාලය ක්‍රියාත්මක වේ. |
| 04 | | | | ඇඹිලිපිටිය පුහුණු මධ්‍යස්ථානය, ගොඩගම පුහුණු |

| | | | | |
|---|---|---|---|---|
| | සබරගමු පළාත | 05 | අක්:42 රූඩ්: 06 පර්:36 | මධ්‍යස්ථානය,ඇල්ලේ අරාව පිහිටි තරුණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල,රත්නපුර පළාත් කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාලයසහ පුහුණු මධ්‍යස්ථානය හා බටංගල පුහුණු මධ්‍යස්ථානය ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 05 | මධ්‍යම පළාත | 04 | අක්:01 රූඩ්: 07 පර්:36 | උලපනේ පුහුණු මධ්‍යස්ථානය,බෙල්වුඩ් පුහුණු මධ්‍යස්ථානය, නුවර එළිය සංචාරක බංගලාව හා නාවුල පුහුණු මධ්‍යස්ථානය ක්‍රියාත්මකව පවතී. |
| 06 | වයඹ පළාත | 07 | අක්:02 රූඩ්: 07 පර්:12.2 | මාවතගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය, ඔරුලියද්ද පුහුණු මධ්‍යස්ථානය, වොලිබෝල පුහුණුව පවත්වන ස්ථානය, ප්‍රාදේශීය බල මණ්ඩලය, ශ්‍රී ලංකා යූත් පුහුණු මධ්‍යස්ථානය, පුත්තලම යූත් පුහුණ මධ්‍යස්ථානය, මහකුඹුක්කඩවල තරුණ මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජිත ස්ථානය ක්‍රියාත්මකව පවතී. |
| 07 | උතුරු මැද පළාත | 07 | හෙක්:0.2530 අක්:86 රූඩ්: 02 පර්:24 | අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය හා නිල නිවස,කැකිරාව පුහුණු මධ්‍යස්ථානය,කහටගස්දිගිලිය වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය,ඇතුනුගම පුහුණු මධ්‍යස්ථානය,පොළොන්නරුව දිස්ත්‍රික් කාර්යාලය,යෞවන සමාජ සම්පත් කේන්ද්‍රය ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 08 | නැගෙනහිර පළාත් කාර්යාලය | 14 | හෙක්:03 අක්:175 රූඩ්:02 පර්:90.27 | අම්පාර යූත් පුහුණු මධයස්ථානය,නැගෙනහිර පළාත් කාර්යාලය,පුහුණු මධ්‍යස්ථානය, දමන පුහුණු මධ්‍යස්ථානය, අම්පාර පුහුණු මධ්‍යස්ථානය,ප්‍රාදේශීය බල මණ්ඩලය ක්‍රියාත්මක ස්ථානය,ලව්ලේන් පුහුණු මධ්‍යස්ථානය, නිලාවෙලි පුහුණු මධ්‍යස්ථානයට යෝජිත ස්ථානය, කන්තලේ පුහුණු මධ්‍යස්ථානය, වෙප්පන්කලම තරුණ යෝජිත ගොවිපල, පුදුකුඩිරුප්පු පුහුණු මධ්‍යස්ථානය, යෝජිත මඩකලපු දිස්ත්‍රික් කාර්යාලය හා පුහුණු මධ්‍යස්ථානය ක්‍රියාත්මක වෙමින් පවතී. |
| 09 | උතුරු පළාත | 06 | හෙක්:0.491 අක්:18 රූඩ්: 01 පර්:39 | මුලතිව් දිස්ත්‍රික් කාර්යාලය,පූනකරි සම්පත් මධ්‍යස්තානය,කිලිනොච්චි දිස්ත්‍රික් කාර්යාලය හා පළාත් කාර්යාලය,වව්නියාව දිසිත්‍රික් කාර්යාලය,මන්නාරම දිස්ත්‍රික් කාර්යාලය ආදිය ක්‍රියාත්මක වෙමින් පවතී. |

**වගුව 30 - වෙනත් රාජ්‍ය ආයතන හෝ අමාත්‍යාංශ වෙත තාවකාලිකව පවරා ඇති ඉඩම් හා ගොඩනැගිලි.**

| අනු අංක | පළාත | ඉඩම් සංඛ්‍යාව | ඉඩම්වල ප්‍රමාණය (දළ වශයෙන්) | වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| 01 | බස්නාහිර පළාත | 03 | අක්:34 රූඩ්: 01 පර්:34 | හෙයියන්තුඩුවේ අක්.11 ක භූමි ප්‍රමාණයක් යුධහමුදා මාණ්ඩලික විද්‍යාලයට පවරා ගෙන ඇති අතර වල්පිට හා අත්තනගල්ල පුහුණු මධ්‍යස්ථාන යොවුන් සේනාංකය විසින් පරිහරණය කරයි. |
| 02 | සබරගමු පළාත | 01 | අක්:41 රූඩ්: 03 පර්:23 | විශ්ව විද්‍යාල විද්‍යායතනයක් සඳහා අක්.05 ක් වෙන් කර ඉදි කිරීම් කටයුතු කරගෙන යනු ලැබේ. |
| 03 | ඌව පළාත | 02 | අක්.05 රූඩ්: 02 පර්:04 | ගලෙන්බිඳුණු වැව හා මාපාකඩ වැව පුහුණු මධ්‍යස්ථාන යොවුන් සේනාංකය විසින් පරිහරණය කරනු ලබයි. |
| 04 | මධ්‍යම පළාත | 03 | අක්:17 | නාවුල හා රිකිල්ලගස්කඩ පුහුණු මධ්‍යස්ථාන යොවුන් සේනාංක විසින් ක්‍රියාත්මක කරනු ලබන අතර අක්.05 රූඩ්.01 ක් පමණ යොවුන් සේනාංකය අත්පත් කරගෙන ගොඩනැගිලි ඉදිකර පවත්වා ගෙන යනු ලබයි. |

5.1.20 මියයෑම්.

**වගුව 31 - ආයතනයේ සේවකයින්ගේ මියයෑම් පිළිබඳ විස්තර.**

| අනු අංක | තනතුරු නාමය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ජ්‍යෙෂ්ඨ උපදේශක | 01 |
| 02 | දිස්ත්‍රික් තරුණ සේවා නිලධාරී (ආවරණ) | 01 |
| 03 | උපදේශන සේවා නිලධාරී | 01 |
| 04 | තරුණ සේවා නිලධාරී | 02 |
| 05 | කළමණාකරණ සහකාර I | 01 |
| 06 | කම්කරු | 01 |
| 07 | මුරකරු | 01 |

## 5.1.21 පුහුණුව ලබාදුන් පුහුණු අභ්‍යාසලාභින්ගේ විස්තර.

**වගුව 32 - 2017 වසරේ පුහුණුව ලබාදුන් පුහුණු අභ්‍යාසලාභීන්ගේ විස්තර.**

| අනු අංක | අංශය | සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ප්‍රධාන කාර්යාලීය අංශ | 75 |
| 02 | පළාත් කාර්යාල | 07 |
| 03 | දිස්ත්‍රික් කාර්යාල | 25 |
| 04 | පුහුණු මධ්‍යස්ථාන | 38 |
| | එකතුව | 145 |

## 5.2 සැපයුම් අංශය.

ප්‍රසම්පාදන අංශය ප්‍රධාන වශයෙන් කරනු ලබන්නේ ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල, පුහුණු මධ්‍යස්ථාන යන මේවායේ ඇති වන අවශ්‍යතා (සේවා හා භාණ්ඩ වශයෙන්) විධිමත් අනුමැතියක් සමඟ කරනු ලබන ඉල්ලීමෙන් පසු ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් එම කාර්යයන් ඉටු කිරීමයි.

2017 වර්ෂයේදී ජාතික තරුණ සේවා සභාවේ ප්‍රධාන කාර්යාලය මඟින්, අනෙකුත් කාර්යාල මඟින් හා පුහුණු මධ්‍යස්ථාන මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සඳහා භාණ්ඩ හා සේවා සපයමින් කටයුතු කර ඇත.

## 5.3 ප්‍රවාහන ක්‍රියාකාරකම්.

ජාතික තරුණ සේවා සභාවේ මූලික අරමුණු සඳහා විවිධ අංශ වලින් ඉදිරිපත් කරන වැඩසටහන් වලදී ප්‍රධානතම සහාය සේවාවක් වශයෙන් ප්‍රවාහන අංශය දායක වන අතර, එම වැඩසටහන්වල ගුණාත්මකභාවය වැඩි කිරීමට හැකි වන අන්දමින් දායක වීම අංශයේ කාර්යභාරය වේ.

## 5.4 අභ්‍යන්තර විගණක අංශය.

ජාතික තරුණ සේවා සභාවට  අදාළව විගණකාධිපති විසින් අනුමත කර ඇති විගණක වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා සභාපතිතුමාගේ උපදෙස් මත කෙරෙන විමර්ශන හා වෙනත් විශේෂ රාජකාරි ඉටුකිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

## 5.5 ලේකම් අංශය.

ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය රැස්වීම් සංවිධානය කිරීම, පවත්වාගෙන යාම, එහිදී ගන්නා ලබන තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අංශ සහ අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් වෙත බෙදාදීම සිදුකරනු ලබයි. ඊට අමතරව ජාතික තරුණ සේවා සභාවේ වෙනත් වැඩසටහන් වලට අදාළ අවස්ථානුකූලව පවරනු ලබන රාජකාරි කටයුතු ද ඉටුකරනු ලැබේ.

**වගුව 33 - 2017 වර්ෂයේ සභා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා ඇති දිනයන්**

| | |
|---|---|
| 2017.01.30 | 2017.07.21 |
| 2017.02.27 | 2017.09.06 |
| 2017.03.24 | 2017.10.09 |
| 2017.05.03 | 2017.11.23 |
| 2017.06.02 | 2017.12.22 |

**වගුව 34 - 2017 වර්ෂයේ සභා රැස්වීම් සඳහා වැය දැරීම්.**

| | |
|---|---|
| සභා අධ්‍යක්ෂ මණ්ඩල දීමනා | රු. 768,000/- |
| සභා අධ්‍යක්ෂ මණ්ඩල සංග්‍රහ | රු. 121,250/- |

## 5.6 නීති විමර්ශන ක්‍රියාකාරකම්.

නීති විමර්ශන අංශය ජාතික තරුණ සේවා සභාව විසින් පහත සඳහන් ආයතනවල පවරා ඇති නඩු සම්බන්ධව හා මෙම සභාවට එරෙහිව පවරා ඇති නඩු පිළිබඳව මෙම සභාව වෙනුවෙන් හා සභාපති අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට පෙනී සිටීම හා කරුණු ඉදිරිපත් කිරීම සිදු කෙරේ.

**වගුව 35 - ජාතික තරුණ සේවා සභාව හා සභාවට එරෙහිව පවරා විභාග වෙමින් පවතින නඩු.**

| අනු අංකය | අධිකරණය | පවරා ඇති නඩු ගණන |
|---|---|---|
| 01 | ශ්‍රේෂ්ඨාධිකරණ | 02 |
| 02 | මහාධිකරණ | 01 |
| 03 | දිසා අධිකරණ | 12 |
| 04 | මහේස්ත්‍රාත් අධිකරණ | 03 |
| 05 | කම්කරු විනිශ්චය සභාව | - |
| 06 | කම්කරු වන්දි උසාවිය | - |
| | | **18** |

**වගුව 36 - නෛතික ආයතන මඟින් පවත්වාගෙන යන පැමිණිලි.**

| අනු අංකය | ආයතනය | පවරා ඇති පැමිණිලි ගණන |
|---|---|---|
| 01. | මානව හිමිකම් කොමිෂන් සභාව | 10 |
| 02. | කම්කරු කාර්යාලීය පැමිණිලි | 01 |

එමෙන්ම ආයතනික විනය ක්‍රියාමාර්ගවලදී විනය බලධාරියාගේ නියෝග මත විනය පරීක්ෂණ පැවැත්වීම, විනය නියෝග ලබාදීම සඳහා වන නිර්දේශ හා /හෝ නිරීක්ෂණ ලබාදීම හා ඉහළ නිලධාරීන් විසින් පවරනු ලබන අනෙකුත් රාජකාරි ඉටු කිරීම.

## 5.7 ඉදිකිරීම් ක්‍රියාකාරකම්.

ඉදිකිරීම්/ නඩත්තු අංශය මඟින්, දිවයින පුරා සියලුම කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල හා තරුණ මධ්‍යස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා වෘත්තීය පුහුණුවට අදාළ ගොඩනැගිලි ඉදිකිරීම් හා නවීකරණය කරන අතර තරුණ මධ්‍යස්ථාන දෛනික නඩත්තු කටයුතු සහ මධ්‍යස්ථාන නවීකරණය හා අලුත්වැඩියා කටයුතු ඉටුකරනු ලබයි.

ඒ අනුව 2017 වර්ෂය සඳහා අමාත්‍යාංශ ප්‍රතිපාදන රු.මිලියන 900 ලැබුණු අතර, එමඟින් ඉදිකිරීම්/ නවීකරණ ව්‍යාපෘති 27ක් ක්‍රියාත්මක කරන ලද අතර, 9.7 ප්‍රාග්ධන ප්‍රතිපාදන රු.මිලියන 82ක් ලැබුණු අතර, එමඟින් ව්‍යාපෘති 4ක් ක්‍රියාත්මක කරන ලද අතර, නිපුණතා ආංශික වැඩසටහන් වලින් රු.මිලියන 80ක් ප්‍රතිපාදන ලැබුණු අතර, එමඟින් ව්‍යාපෘති 3ක් ක්‍රියාත්මක කරන ලදි. එම ව්‍යාපෘති 8ක් සම්පූර්ණයෙන් අවසන් කර අදාළ මධ්‍යස්ථානයට භාර දී ඇති අතර, අනෙකුත් ව්‍යාපෘති 2018 වර්ෂයේ අවසන් වීමයට නියමිතය. වැඩිමනක් තොරතුරු පහත පරිදි වේ.

**වගුව 37 - 2017 වසරේ ඉදිකිරීම් අංශයේ ක්‍රියාත්මක ව්‍යාපෘති පිළිබඳ විස්තර.**

| අනු අංක | ප්‍රතිපාදන ලැබීම | ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අමාත්‍යාංශ ප්‍රතිපාදන(Ministry Fund) | 27 |
| 02 | ප්‍රාග්ධන (Capital) | 04 |
| 03 | නිපුණතා ආංශික සංවර්ධන (SSDP) | 03 |

පින්තූර 17 - ඉදිකිරීම් අංශය මඟින් සිදු කරන පුහුණු මධ්‍යස්ථාන ඉදිකිරීම් වල ඡායාරූප.






## 6. ස්වේච්ඡා වැඩසටහන්.

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වල සේවය කරන තරුණ සේවා නිලධාරීන් යෞවන සමාජ වල සාමාජික සාමාජිකයන් සමග ප්‍රාදේශීයව හා කාලීන අවශ්‍යතාවයන් අනුව ස්වේච්ඡාවෙන් සොයා ගත් ප්‍රතිපාදන මගින් විවිධ වැඩසටහන් සංවිධානය කරන ලදී.

පහත වගුවේ දක්වා ඇති ක්ෂේත්‍රයන් ආශ්‍රිතව එම වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. මෙම වැඩසටහන් තුළින් යෞවන සමාජ වල සාමාජික සාමාජිකාවන් තුළ පමණක් නොව ප්‍රදේශවාසීන් හා යෞවන යෞවනියන් අතර අන්තර් සහජීවනය සමගිය ඇතිවන අතර, සංවර්ධන කාර්යය සඳහා ස්වේච්ඡාවෙන් තරුණ පිරිස් යොදා ගැනීම මෙම ස්වේච්ඡා වැඩසටහන් තුළින් සිදුකෙරේ.

2017 වසරේ ස්වේච්ඡා වැඩසටහන් 3,662 ක් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව මේ සඳහා තරුණ පිරිස 165,243 ක් සහභාගිව ඇත. එමෙන්ම ස්වේච්ඡා වැඩසටහන්හි සමස්ත මූල්‍ය වටිනාකම රුපියල් 45,231,665.00 ක් ලෙස සඳහන් කළ හැක.

# වගුව 38 - ස්වේච්ඡා වැඩසටහන් වගුව

## Progress of Voluntary Programmes Implemented in 2017

| | District | Community & Social Development | | | Environmental Programmes | | | Health & Sanitary Service Programme | | | Sports Development Programme | | | Educational & Development Programme | | | Youth Participatory Development Programme | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure |
| 1 | Urban Youth | 20 | 825 | 48,000 | 10 | 712 | 25,000 | 12 | 500 | 45,000 | 11 | 910 | 66,000 | 5 | 2000 | 12,000.00 | 25 | 1509 | 15,559 |
| 2 | Colombo | 15 | 1502 | 175,203 | 12 | 623 | 50,125 | 12 | 625 | 17,500 | 23 | 102 | 30,000 | 9 | 700 | 75,802 | 42 | 539 | 15,450 |
| 3 | Kaluthara | 7 | 315 | 150,000 | 15 | 893 | 49,200 | 65 | 1020 | 60,000 | 15 | 825 | 75,000 | 5 | 614 | 11,200 | 54 | 12795 | 2,354,175 |
| 4 | Gampaha | 3 | 390 | 291,605 | 6 | 22 | 74,000 | 25 | 1050 | 165,202 | 10 | 1042 | 105,000 | 8 | 53 | 568 | 9 | 1382 | 20,106 |
| 5 | Galle | 176 | 50806 | 5,535,946 | 8 | 50 | 1,000 | 41 | 4279 | 188,900 | 10 | 1055 | 179,000 | 6 | 30 | 8,000 | 5 | 225 | 65,000 |
| 6 | Matahara | 97 | 42088 | 3,531,000 | 26 | 6 | 45 | 32 | 75 | 136 | 34 | 1451 | 320,624 | 42 | 1434 | 89,000 | 40 | 1724 | 158,500 |
| 7 | Hambanthota | 269 | 18982 | 290,000 | 14 | 960 | 14,000 | 23 | 1025 | 95,000 | 35 | 3574 | 220,000 | 10 | 387 | 40,000 | 6 | 328 | 68,000 |
| 8 | Kandy | 10 | 669 | 78 | 12 | 520 | 16,200 | 16 | 1214 | 688,000 | 6 | 1600 | 46,250 | 10 | 500 | 13,450 | 290 | 2520 | 12,600,000 |
| 9 | Mathale | 17 | 2241 | 13,800 | 14 | 200 | 75,000 | 9 | 120 | 300 | 9 | 427 | 261,000.00 | 7 | 230 | 200,000 | 8 | 199 | 57,000 |
| 10 | Nuwara Eliya | 19 | 2284 | 125,122 | 11 | 67 | 15,000 | 10 | 180 | 50,000 | 8 | 1394 | 325,000 | 5 | 20 | 40,000 | 14 | 301 | 14,000 |
| 11 | Rathnapura | 32 | 2618 | 371,500 | 8 | 551 | 178,000 | 15 | 621 | 212,500 | 18 | 1697 | 502,000 | 8 | 25 | 20,000 | 5 | 328 | 6,800 |
| 12 | Kegalle | 20 | 755 | 12,400 | 5 | 195 | 54,000 | 52 | 1200 | 123,000 | 6 | 120000 | 7,500 | 22 | 14 | 65,000 | 12 | 8000 | 14,500 |
| 13 | Badulla | 25 | 353 | 125,000 | 10 | 203 | 65,302 | 10 | 250 | 16,500 | 50 | 30352 | 1,528,650 | 6 | 10 | 5,800 | 12 | 325 | 16,000 |
| 14 | Monaragala | 25 | 2000 | 150,000 | 13 | 300 | 75,000 | 8 | 600 | 56,000 | 15 | 7000 | 20,000 | 10 | 700 | 65,000 | 324 | 8061 | 150,000 |
| 15 | Polonnaruwa | 4 | 105 | 39,000 | 6 | 45 | 16,000 | 30 | 400 | 5,000 | 8 | 102 | 120,000 | 14 | 65 | 7,500 | 10 | 893 | 27,000 |
| 16 | Anuradhapura | 87 | 171 | 360001 | 8 | 43 | 5,000 | 9 | 60 | 6,500 | 25 | 997 | 116,000 | 6 | 55 | 6,000 | 7 | 95 | 6,500 |
| 17 | Trincomalee | 20 | 1560 | 151,200 | 31 | 600 | 175,000 | 25 | 1045 | 125,000 | 15 | 3924 | 1,110,000 | 15 | 300 | 114,000 | 36 | 1241 | 170,000 |
| 18 | Ampara | 12 | 20 | 1,200 | 8 | 152 | 12,000 | 8 | 554 | 18,000 | 9 | 554 | 18,000 | 5 | 99 | 9,500 | 8 | 115 | 7,500 |
| 19 | Batticaloa | 39 | 320 | 2,700 | 8 | 50 | 8,000 | 16 | 1000 | 80,000 | 10 | 116 | 260,000 | 10 | 110 | 1,200 | 7 | 189 | 44,600 |
| 20 | Kurunegala | 80 | 5651 | 2,223,926 | 32 | 55 | 25,000 | 34 | 735 | 233,000 | 20 | 1547 | 100,500 | 5 | 120 | 6,500 | 8 | 250 | 139,000 |
| 21 | Puttalam | 47 | 11780 | 304,954 | 7 | 73 | 5,000 | 9 | 219 | 15,000 | 21 | 1747 | 444,500 | 10 | 301 | 6,000 | 8 | 90 | 3,000 |
| 22 | Jaffna | 19 | 15191 | 20,000 | 11 | 122 | 16,500 | 12 | 305 | 16,000 | 9 | 102 | 30,000 | 10 | 211 | 7,500 | 16 | 5375 | 17,000 |
| 23 | Vavuniya | 6 | 210 | 75,000 | 9 | 56 | 50,000 | 7 | 135 | 4,000 | 6 | 36 | 5,000 | 6 | 121 | 5,000 | 8 | 234 | 144,000 |
| 24 | Mannar | 8 | 119 | 7,450 | 12 | 102 | 36,000 | 15 | 112 | 8,000 | 12 | 56 | 8,000 | 13 | 150 | 8,000 | 18 | 800 | 14,000 |
| 25 | Mulathivu | 10 | 152 | 45,000 | 52 | 450 | 16,000 | 6 | 65 | 4,000 | 18 | 300 | 13,500 | 5 | 201 | 4,300 | 3 | 300 | 60,000 |
| 26 | Kilinocchi | 7 | 228 | 65,345 | 8 | 35 | 2,500 | 9 | 88 | 63,000 | 10 | 185 | 10,000 | 12 | 11 | 4,500 | 47 | 5220 | 803,125 |
| | Total | 1074 | 161335 | 14115430 | 356 | 7085 | 1058872 | 510 | 17477 | 2295538 | 413 | 181095 | 5921524 | 264 | 8461 | 825820 | 1022 | 53038 | 16990815 |

| | District | Providing of job information | | | Religious Programme | | | Enterpreneurship & Economic Development Programme | | | Leadership & Personality Development Programme | | | Counseling Programme | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure |
| 1 | Urban Youth | 25 | 825 | 125,366 | 12 | 522 | 75,000 | 12 | 425 | 125,000 | 20 | 893 | 114,500 | 5 | 192 | 40,000 |
| 2 | Colombo | 17 | 625 | 15,425 | 13 | 792 | 70,297 | 15 | 453 | 95,000 | 103 | 2500 | 144,500 | 5 | 125 | 12,000 |
| 3 | Kaluthara | 36 | 503 | 15,200 | 13 | 122 | 40,000 | 10 | 120 | 75,000 | 145 | 1450 | 150,000 | 10 | 45 | 165,000 |
| 4 | Gampaha | 15 | 200 | 17,000 | 13 | 2229 | 156,000 | 16 | 125 | 30,000 | 50 | 65 | 22,000 | 10 | 205 | 50,000 |
| 5 | Galle | 14 | 25 | 18,000 | 61 | 51959 | 245,562 | 13 | 145 | 65,000 | 45 | 359 | 58,905 | 4 | 90 | 66,000 |
| 6 | Matahara | 37 | 90 | 1,500 | 72 | 9766 | 461,500 | 61 | 70 | 40,000 | 135 | 84 | 150,000 | 48 | 85 | 55,000 |
| 7 | Hambanthota | 5 | 38 | 77,220 | 6 | 385 | 65,500 | 12 | 166 | 35,000 | 48 | 145 | 56,000 | 12 | 150 | 66,000 |
| 8 | Kandy | 6 | 101 | 4,000 | 60 | 405 | 58,000 | 13 | 250 | 18,000 | 270 | 2500 | 195,000 | 12 | 174 | 44,564 |
| 9 | Mathale | 15 | 300 | 15,000 | 24 | 3210 | 686,000 | 10 | 155 | 23,000 | 10 | 235 | 5,000 | 5 | 147 | 5,000 |
| 10 | Nuwara Eliya | 5 | 35 | 4,500 | 4 | 2731 | 130,000 | 11 | 45 | 40,000 | 13 | 102 | 75,000 | 6 | 120 | 56,000 |
| 11 | Rathnapura | 12 | 300 | 12,500 | 38 | 3373 | 1,342,500 | 14 | 230 | 65,000 | 11 | 666 | 175,000 | 3 | 100 | 14,000 |
| 12 | Kegalle | 2 | 198 | 76,000 | 36 | 2318 | 26,000 | 13 | 165 | 40,000 | 8 | 189 | 27,500 | 7 | 321 | 14,500 |
| 13 | Badulla | 6 | 400 | 15,000 | 15 | 1745 | 121,000 | 10 | 362 | 35,000 | 10 | 200 | 25,000 | 5 | 200 | 20,000 |
| 14 | Monaragala | 15 | 325 | 6,000 | 22 | 300 | 33,000 | 10 | 255 | 65,425 | 15 | 600 | 3,000 | 10 | 105 | 45,000 |
| 15 | Polonnaruwa | 32 | 1002 | 75,000 | 23 | 140 | 137,500 | 6 | 455 | 75,000 | 12 | 500 | 4,000 | 15 | 613 | 264,000 |
| 16 | Anuradhapura | 10 | 300 | 6,000 | 8 | 1102 | 109,500 | 13 | 856 | 45,000 | 21 | 600 | 60,000 | 8 | 781 | 6,000 |
| 17 | Trincomalee | 21 | 1491 | 216,720 | 15 | 1625 | 193,700 | 12 | 725 | 66,900 | 12 | 200 | 75,000 | 10 | 120 | 7,000 |
| 18 | Ampara | 11 | 825 | 45,000 | 7 | 85 | 3,000 | 15 | 300 | 35,000 | 10 | 400 | 5,000 | 13 | 120 | 7,000 |
| 19 | Batticaloa | 13 | 200 | 15,000 | 12 | 359 | 4,700 | 18 | 200 | 121,000 | 11 | 450 | 75,000 | 11 | 450 | 8,000 |
| 20 | Kurunegala | 98 | 2500 | 35,000 | 50 | 43943 | 1,920,983 | 14 | 98 | 3,600 | 13 | 120 | 5,000 | 61 | 105 | 75,000 |
| 21 | Puttalam | 15 | 1100 | 50,000 | 11 | 549 | 50,500 | 10 | 158 | 15,000 | 14 | 895 | 172,035 | 20 | 45 | 8,000 |
| 22 | Jaffna | 25 | 300 | 3,000 | 21 | 1035 | 159,490 | 6 | 200 | 5,000 | 15 | 603 | 80,000 | 12 | 300 | 56,000 |
| 23 | Vavuniya | 14 | 400 | 56,000 | 8 | 175 | 30,000 | 11 | 700 | 50,000 | 23 | 1500 | 125,000 | 13 | 150 | 65,000 |
| 24 | Mannar | 12 | 125 | 8,000 | 14 | 300 | 25,000 | 13 | 145 | 3,000 | 16 | 400 | 7,000 | 14 | 276 | 40,000 |
| 25 | Mulathivu | 8 | 200 | 45,000 | 14 | 400 | 46,000 | 10 | 800 | 65,000 | 12 | 200 | 45,400 | 8 | 400 | 65,000 |
| 26 | Kilinocchi | 13 | 684 | 6,000 | 11 | 345 | 20,000 | 11 | 1924 | 35,345 | 10 | 67 | 44,200 | 10 | 169 | 15,000 |
| | Total | 482 | 13092 | 963431 | 583 | 129915 | 6210732 | 359 | 9527 | 1271270 | 1072 | 15923 | 1899040 | 337 | 5588 | 1268064 |

| | District | Easthetic Programme | | | Decision Making & policy Development Programme | | | Other Programmes | | | Total Number of Programme | Total Number Youth participation | Total Expanditure |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure | Number of Programme | Number of Participation | Expenditure | | | |
| 1 | Urban Youth | 23 | 265 | 76,000 | 5 | 30 | 5,000 | 10 | 203 | 30,000 | 195 | 9811 | 802,425 |
| 2 | Colombo | 12 | 145 | 55,000 | 7 | 15 | 3,000 | 10 | 145 | 25,000 | 295 | 8891 | 784,302 |
| 3 | Kaluthara | 8 | 330 | 1,415,000 | 6 | 52 | 4,000 | 6 | 13 | 7,500 | 395 | 19097 | 4,571,275 |
| 4 | Gampaha | 11 | 100 | 33,000 | 7 | 101 | 5,500 | 8 | 145 | 75,000 | 191 | 7109 | 1,044,981 |
| 5 | Galle | 4 | 295 | 200,000 | 6 | 75 | 2,000 | 15 | 9883 | 743,500 | 51206 | 119276 | 7,376,813 |
| 6 | Matahara | 57 | 6216 | 123,100 | 8 | 105 | 6,000 | 20 | 1080 | 30,000 | 42771 | 64274 | 4,966,405 |
| 7 | Hambanthota | 12 | 400 | 45,000 | 6 | 75 | 2,000 | 12 | 122 | 40,000 | 490 | 26737 | 1,112,720 |
| 8 | Kandy | 10 | 150 | 43,000 | 10 | 45 | 3,500 | 10 | 145 | 20,000 | 735 | 697579 | 13,750,042 |
| 9 | Mathale | 22 | 1654 | 3139000 | 7 | 20 | 3,000 | 11 | 345 | 12,000 | 261159 | 3146829 | 4,495,100 |
| 10 | Nuwara Eliya | 10 | 120 | 65,000 | 10 | 120 | 6,000 | 15 | 45 | 30,000 | 141 | 7564 | 975,622 |
| 11 | Rathnapura | 8 | 250 | 55,000 | 11 | 125 | 4,000 | 5 | 60 | 3,000 | 188 | 185278 | 2,961,800 |
| 12 | Kegalle | 7 | 76 | 48,500 | 13 | 201 | 6,000 | 5 | 25 | 7,500 | 208 | 133657 | 522,400 |
| 13 | Badulla | 10 | 275 | 75,000 | 11 | 25 | 5,000 | 10 | 175 | 8,500 | 190 | 34875 | 2,061,752 |
| 14 | Monaragala | 14 | 95 | 25,000 | 12 | 122 | 7,000 | 15 | 200 | 6,500 | 508 | 20663 | 706,925 |
| 15 | Polonnaruwa | 12 | 300 | 35,000 | 13 | 145 | 9,000 | 8 | 123 | 4,500 | 193 | 4888 | 818,500 |
| 16 | Anuradhapura | 13 | 220 | 78,000 | 5 | 133 | 6,500 | 10 | 23 | 2,500 | 230 | 365266 | 813,501 |
| 17 | Trincomalee | 8 | 300 | 45000 | 10 | 150 | 7,500 | 4 | 20 | 2,300 | 234 | 162941 | 2,459,320 |
| 18 | Ampara | 11 | 360 | 36,000 | 15 | 205 | 8,000 | 14 | 21 | 1,250 | 146 | 3810 | 206,450 |
| 19 | Batticaloa | 15 | 560 | 63,000 | 12 | 210 | 10,000 | 6 | 65 | 500 | 169 | 5519 | 842,200 |
| 20 | Kurunegala | 38 | 250 | 50,000 | 14 | 260 | 12,500 | 17 | 668 | 35,158 | 484 | 50671 | 4,865,167 |
| 21 | Puttalam | 10 | 326 | 25,000 | 13 | 36 | 5,000 | 6 | 92 | 29,000 | 201 | 17411 | 1,132,989 |
| 22 | Jaffna | 12 | 400 | 45,000 | 8 | 102 | 6,000 | 10 | 102 | 31,500 | 186 | 24348 | 492,990 |
| 23 | Vavuniya | 14 | 401 | 80,000 | 5 | 33 | 5,000 | 11 | 125 | 22,000 | 141 | 4276 | 716,000 |
| 24 | Mannar | 11 | 121 | 75,000 | 9 | 45 | 3,000 | 5 | 50 | 3,000 | 172 | 2801 | 245,450 |
| 25 | Mulathivu | 10 | 120 | 45,000 | 8 | 60 | 2,000 | 9 | 60 | 4,000 | 173 | 3708 | 460,200 |
| 26 | Kilinocchi | 8 | 25 | 56,000 | 10 | 138 | 25,000 | 8 | 62 | 3,500 | 174 | 9181 | 1,153,515 |
| | Total | 370 | 13754 | 6030600 | 241 | 2628 | 161500 | 260 | 13997 | 1177708 | 361175 | 5136460 | 60338844 |

## ආශ්‍රිත වාර්තා / ලේඛන.

- මූල්‍ය වාර්තාව 2012, ජාතික තරුණ සේවා සභාව.
- මූල්‍ය වාර්තාව 2013, ජාතික තරුණ සේවා සභාව.
- මූල්‍ය වාර්තාව 2014, ජාතික තරුණ සේවා සභාව.
- මූල්‍ය වාර්තාව 2015, ජාතික තරුණ සේවා සභාව.
- මූල්‍ය වාර්තාව 2016, ජාතික තරුණ සේවා සභාව.
- මූල්‍ය වාර්තාව 2017, ජාතික තරුණ සේවා සභාව.
- සංයුක්ත සැලැස්ම 2013 – 2017, ජාතික තරුණ සේවා සභාව.
- ක්‍රියාත්ම සැලැස්ම 2017, ජාතික තරුණ සේවා සභාව.
- දිස්ත්‍රික් ප්‍රගති වාර්තා, ජාතික තරුණ සේවා සභාව.
- ජාතික තරුණ සේවා සභාව ප්‍රධාන කාර්යාලීය අංශ ප්‍රගති වාර්තා.
- භාණ්ඩාගාර /අමාත්‍යාංශ සංවර්ධන වියදම් වාර්තාව - 2017, ජාතික තරුණ සේවා සභාව.

## ඇමුණුම් 1. විගණක කමිටු වාර්තාව.

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සම්බන්ධව නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව විධායක නොවන සාමාජිකයින් තිදෙනෙකු, රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක- (නිරීක්ෂක), විගණන අධිකාරීවරයෙකු (ආරාධිත) භාණ්ඩාගාර නියෝජිතයකුගේ සභාපතිත්වයෙන් කමිටුව සමන්විත වේ. වසරකදී පැවැත්විය යුතු කමිටු සංඛ්‍යාව 4 ක් ලෙස නිර්ණය කර ඇති අතර, 2017 වර්ෂයට අදාලව කමිටු රැස්වීම් 04 ක් පවත්වා ඇත.

අදාල රැස්වීම් පැවැත්වීමෙන් අනතුරුව ගන්නා ලද කමිටු තීරණ ඇතුලත් වාර්තාවන් සහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියන් සඳහා ඉදිරිපත් කර ඇත. ගන්නා ලද කමිටු තීරණයන්හි සම්පිණ්ඩනයක් පහත දක්වා ඇත.

- වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම අනුමත කිරීම.
- රජයේ විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති අඩුපාඩු අවම කිරීම සඳහා කටයුතු කිරීම.
- අභ්‍යන්තර විගණන හා විමර්ශන වාර්තා මගින් පෙන්වා දී ඇති අඩුපාඩු මග හරවා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිරීක්ෂණ ලබාදීම.
- සමස්ත ඉඩම් හා දේපල පවරා ගැනීමේ පටිපාටිය පිළිබඳ ප්‍රගති සමාලෝචනය.
- කාර්ය මණ්ඩල හා පරිපාලන කටයුතු සමාලෝචනය.
- තරුණ සංවර්ධන කටයුතු පිළිබඳ සමාලෝචනය.
- ඉඩම්, ගොඩනැගිලි, වාහන ඇතුළු වත්කම් ප්‍රත්‍යාගණනය සමාලෝචනය.
- වත්කම් භාරකාරත්වය හා භාණ්ඩ සමීක්ෂණ කටයුතු විධිමත් කිරීම සඳහා වූ ක්‍රියාමාර්ග ගැනීම.
- වාර්ෂික ගිණුම් කටයුතු පිළිබඳ සමාලෝචනය.
- ජාතික තරුණ සේවා සභාවට අනුබද්ධිත ආයතනයන්හි කටයුතු පිළිබඳ විමර්ශනයට ලක්කිරීම.
- ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර කාරක සභාව හා පොදු ව්‍යාපාර අනුකමිටු වලදී පැන නගින කරුණු වලට අදාළව නිකුත් කරනු ලබන නිර්දේශ හා නිරීක්ෂණ සම්බන්ධව පිළිතුරු හා ප්‍රගතිය සමාලෝචනය කිරීම.

ඇමුණුම් 2. මූල්‍ය විගණක ප්‍රකාශය.

ජාතික තරුණ සේවා සභාව
**2017** දෙසැම්බර් **31** දිනට
මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය

(රු.,000)

| | උප. අංක | 2017 | 2016 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම වත්කම්** | 1 | | |
| මුදල් සහ මුදල් සමාන දෑ | | 8,268 | 7,028 |
| ලැබිය යුතු දෑ | | 298,665 | 164,069 |
| තොග | | 13,272 | 11,175 |
| වෙනත් ජංගම වත්කම් | | 319 | 1,604 |
| | | 320,524 | 183,876 |
| **ජංගම නොවන වත්කම්** | 2 | | |
| වෙනත් මූල්‍ය වත්කම් | | 755,703 | 271,283 |
| පිරියත හා උපකරණ | | 333,793 | 390,888 |
| ඉඩම් හා ගොඩනැගිලි | | 748,046 | 801,763 |
| | | 1,837,542 | 1,463,934 |
| **මුළු වත්කම්** | | 2,158,066 | 1,647,810 |
| **බැරකම්** | | | |
| **ජංගම බැරකම්** | 3 | | |
| ගෙවිය යුතු දෑ | | 129,506 | 90,301 |
| වෙනත් බැරකම් | | 18,590 | 12,821 |
| | | 148,096 | 103,122 |
| ජංගම නොවන බැරකම් | 4 | | |
| පාරිතෝෂික වෙන්කිරීම් | | 433,167 | 439,211 |
| මුළු බැරකම් | | 581,263 | 542,333 |
| ශුද්ධ වත්කම් | | **1,576,803** | **1,105,477** |
| **ශුද්ධ වත්කම්/ ස්කන්ධය** | 5 | | |
| වෙනත් රාජ්‍ය අස්තිත්වයන්ගේ දායක වූ ප්‍රාග්ධනය | | 4,506,286 | 3,742,440 |
| සංචිත | | 34,155 | 34,155 |
| සමුච්චිත අතිරික්තය /(ඌනතාවය) | | (2,963,638) | (2,671,118) |
| **මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | **1,576,803** | **1,105,477** |

ජී.සී.ටී.එස්. පෙරේරා
අධ්‍යක්ෂ (මුදල්)
ජාතික තරුණ සේවා සභාව

නීතිඥ ඩබ්. ජී. එස්.එරන්දික
සභාපති / අධ්‍යක්ෂ ජෙනරාල්
ජාතික තරුණ සේවා සභාව

ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 01 සිට 02 දක්වා ද, ගිණුම්කරණ සටහන් පිටු අංක 05 සිට 08 දක්වා ද, ඇතුලත් මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම සභාවේ කළමනාකරණ මණ්ඩලය විසින් දරනු ලැබේ. මෙම මූල්‍ය ප්‍රකාශනය කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන් අනුමත කර පහත අත්සන් යොදා මේ සමඟ ඉදිරිපත් කෙරේ.

01. රවි ක්‍රිෂාන් ජයවර්ධන - සභා අධ්‍යක්ෂ ....................
02. ජේ.වී. හර්ෂනී සඳරුවනි - සභා අධ්‍යක්ෂ ....................

ජාතික තරුණ සේවා සභාව
2017.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

| විස්තරය | උප අංක | 2017 | 2016 |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| රජයේ දායකය (පුනරාවර්තන) | | 918,170 | 849,999 |
| රජයේ දායකය සංවර්ධන (පුනරාවර්තන) | | 304,969 | 286,039 |
| | | 1,223,139 | 1,136,038 |
| **බාහිර දායකය (පුනරාවර්තන)** | | | |
| පළාත් සභා | | 150 | 198 |
| අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන (පුනරාවර්තන) | | 749,745 | 374,861 |
| විදේශ සංවිධාන | | 30,128 | 14,534 |
| වෙනත් බාහිර ආයතන | | 2,090 | - |
| | | 782,113 | 389,593 |
| **අභ්‍යන්තර ඉපයීම්** | | | |
| ජාතික තරුණ මධ්‍යස්ථාන අදායම් (මහරගම) | 6-1 | 41,594 | 38,595 |
| පුහුණු මධ්‍යස්ථාන ආදායම් | 6-2 | 146,888 | 140,306 |
| සරසවි ආදායම් | 6-3 | - | 25 |
| විවිධ ආදායම් | 6-4 | 10,932 | 9,273 |
| සංදර්ශන ආදායම් | | 3,823 | 5,270 |
| ලැබිය යුතු රක්ෂණ වන්දි | | - | 32 |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම් ලාභය | | 597 | 665 |
| ගොවිපල කාරක ගිණුම | 6-5 | 7,931 | 7,332 |
| අඩමාණ ණය අධි වෙන්කිරීම | | 993 | 232 |
| | | 212,758 | 201,730 |
| | | 2,218,010 | 1,727,361 |
| **මෙහෙයුම් වියදම්** | | | |
| අඩු කළා :- | | | |
| ආයතන හා පරිපාලන වැය | 7-1 | 1,075,990 | 1,014,398 |
| ස්ථාවර වත්කම් ක්ෂය | 2-4 | 189,495 | 199,530 |
| | | (1,265,485) | (1,213,928) |
| | | 952,525 | 513,433 |
| තරුණ සංවර්ධන වියදම් | 07 | | |
| සෞන්දර්ය කුසලතා සංවර්ධන අංශය | 2-1 | 39,019 | 48,403 |
| මාධ්‍ය අංශය | 2-2 | 6,438 | 5,983 |
| පර්යේෂණ හා සැලසුම් අංශය | 2-3 | 1,803 | 3,749 |
| කාර්මික හා වෘත්තිය පුහුණු අංශය | 2-6 | 56,289 | 21,571 |
| ජාතික තරුණ මධ්‍යස්ථාන නඩත්තු අංශය | 2-7 | 2,121 | 1,051 |
| ජාත්‍යන්තර තරුණ සම්බන්ධතා අංශය | 2-8 | 45,315 | 26,221 |
| යෞවන තිළිණ අධිකාරී අංශය | 2-9 | 6,564 | 3,502 |
| ක්‍රීඩා සංවර්ධන අංශය | 2-10 | 107,630 | 98,146 |
| තරුණ සංවිධාන හා සංවර්ධන අංශය | 2-11 | 94,778 | 23,610 |
| ගොවිපල සංවර්ධන අංශය | 2-12 | 9,509 | 7,091 |
| තරුණ සමූපකාර හා ව්‍යාපාර සංවර්ධන අංශය | 2-13 | 2,600 | 4,858 |
| නිස්කෝ විඩියෝ අංශය | 2-14 | 3,277 | 3,146 |
| ඇගයීම් අංශය | 2-15 | 8,356 | 6,773 |
| තොරතුරු තාක්ෂණ අංශය | 2-17 | 1,714 | 1,279 |
| විශේෂ ව්‍යාපෘති අංශය | 2-18 | 697,245 | 374,351 |
| පුහුණු මධ්‍යස්ථාන | 2-6 | 145,524 | 134,179 |
| ජාතික තරුණ මධ්‍යස්ථානය - මහරගම | 2-6-1 | 16,863 | 19,307 |
| | | 1,245,045 | 783,220 |
| වර්ෂයේ වියදම් අතිරික්තය | | (292,520) | (269,787) |
| එකතු කළා :- | | | |
| වියදම් අතිරික්තය (2017.01.01) | | (2,671,118) | (2,401,239) |
| පෙර වර්ෂයට ගැලපීම | | | (92) |
| ඉදිරියට ගෙනා ශේෂය | | (2,963,638) | (2,671,118) |

ඇමුණුම් 3. විගණනකාධිපති වාර්තාව.

# ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | විවිඑයි/ඒ/එන්වයිඑස්සී/ 1/17/17 | |
| මබේ අංකය / உமது இல. / Your No. | | |
| දිනය / திகதி / Date | 2018 ඔක්තෝබර් 23 දින | |

ජාතික තරුණ සේවා සභාව
31 OCT 2018
අභ්‍යන්තර විගණන අංශය

සභාපති
ජාතික තරුණ සේවා සභාව

**ජාතික තරුණ සේවා සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික තරුණ සේවා සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වන වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පනතේ 29(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.


අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලැසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික තරුණ සේවා සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

ජාතික තරුණ සේවා සභාවේ සියයට 98 ක කොටස් හිමිකාරත්වයක් ඇතිව 1981 වර්ෂයේ ආරම්භ කරන ලද සී/ස තරුණ සේවා (පුද්) සමාගම ස්ථාපිත කර මෙහෙයුම් කටයුතු සිදුකරමින් පැවතුණද, සභාවේ මූල්‍ය ප්‍රකාශන සමග එම සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඒකාබද්ධ කර පිළියෙල කර නොතිබුණි.

#### 2.2.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

(i) ප්‍රමිතයේ 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු ගොඩනැගිලි 477 ක් මෝටර් රථ 84 ක් හා ලී බඩු උපකරණ ඒකක 5,608 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව, ඇතිවූ ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද එහි දළ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ii) ප්‍රමිතයේ 25 ඡේදය ප්‍රකාරව යම් වත්කමක් හුවමාරු නොවන ගනුදෙනුවක් හරහා අත්පත්කරගෙන ඇතිවිට අත්පත් කරගත් දිනට සාධාරණ වටිනාකමට ගිණුම් තැබිය යුතු වුවත් පුහුණු මධ්‍යස්ථාන 12 ක් පවත්වාගෙන යනු ලබන ඉඩම්වල ආරක්ෂක වැටවල් සහ බැම් ඉදිකිරීම වැනි කටයුතු වෙනුවෙන් දරන ලද වියදම පමණක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණි.

### 2.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ස්කන්ධය යටතේ දක්වා තිබූ ශ්‍රී ලංකා රජයෙන් හා විදේශ රාජ්‍ය වලින් ලැබී තිබූ ප්‍රදාන ක්‍රමානුකූල පදනමක් යටතේ ආදායම් ලෙස හඳුනාගැනීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොතිබුණි.

(ආ) වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙන ආ පසු වුවද ඊට පටහැනි ලෙස ස්ථාවර වත්කම් මිලටගත් වර්ෂයෙන් පසු වර්ෂයේ සිට ක්ෂයවීම ආරම්භ වන පරිදි ප්‍රතිපත්තිය හඳුනාගෙන තිබුණි.

(ඇ) පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන වටිනාකමින් අඩු අගයට තොග අගය කළ යුතු වුවද එයට පටහැනිව තොග පිරිවැයට අගය කරන පරිදි තොග ප්‍රතිපත්තිය හඳුනාගෙන තිබුණි.

### 2.2.4 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සභාවට නීත්‍යානුකූල අයිතිය තිබූ ඉඩම් 05 ක වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2000 වර්ෂයේ නාගරික සංවර්ධන අධිකාරියෙන් වර්ෂ 50 ක දීර්ඝ කාලීන බදු පදනම මත ලබාගෙන තිබූ ඉඩමේ 2017 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු. 2,131,200 ක් බදු දේපල යටතේ දැක්වීම වෙනුවට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉඩම් හා ගොඩනැගිලි යටතේ ඇතුළත් කර තිබුණි.

(ඇ) ජාතික තරුණ සේවා සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන ගොවිපලවල් 20 කට අදාල වාර්ෂික ලාභය වශයෙන් රු. 7,931,519 ක් දක්වා තිබුණද ගොවිපල වලට අදාල වත්කම් ක්ෂයවීම්, කෘෂි භෝගවල අවසන් තොගය හා ගොවිපල නිෂ්පාදන ණයට විකුණුම්වලට අදාල ගැලපීම් සිදුකර නොතිබුණි.

(ඈ) ජාතික තරුණ සේවා සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු. 753,903,484 ක් වූ කෙරීගෙන යන වැඩවල වටිනාකම, අනුචිත ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් මූල්‍ය වත්කම් යටතේ දක්වා තිබුණි.

### 2.2.5 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාගමේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සීමාසහිත ශ්‍රී ලංකා තරුණ සේවා සමාගම වෙත ගෙවිය යුතු ණය හිමි ශේෂය රු. 3,602,190 ක් ලෙස දක්වා තිබුණ ද එම සමාගම විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එදිනට සභාවෙන් අයවිය යුතු ණය ශේෂයන්ගේ එකතුව රු.73,427,936 ක් වූයෙන් එම ශේෂයන් දෙක අතර රු. 69,825,746 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.2.6 ලැබිය යුතු ගිණුම්

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු 2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 07 කට වඩා පැරණි රු. 538,950 ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂය තුළ දී ද අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය රු. 292,520,000 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.269,787,000 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 22,733,000 ක පිරිහීමක් පෙන්නුම් කර තිබුණි.

වර්ෂයේ මුළු ආදායම රු.490,649,000 කින් වැඩිවී තිබුණද මෙහෙයුම් වියදම රු.51,557,000 කින්ද තරුණ සංවර්ධන වියදම රු.461,825,000 කින්ද වැඩිවීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී, 2013 වර්ෂයේ රු.253,277,000 ක් තිබුණු ඌනතාවය උච්චාවචනයන් සහිතව වර්ධනය වී 2017 වර්ෂයේ රු. 292,520,000 ක් වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය ගැලපීමෙන් පසු රු.1,124,581,000 ක් වූ දායකත්වය අඛණ්ඩව වර්ධනය වී 2017 වර්ෂයේදී රු.1,993,313,000 ක් වී තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

---

### 4.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

---

1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පනතේ 4 වන වගන්තියේ සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද වැඩසටහන් සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් වැඩසටහන් 03 ක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, ඒ තුළ ව්‍යාපාරවල නිරතවීමට අදහස් කරන තරුණ ව්‍යාපාරිකයින්, දැනට ව්‍යාපාරවල යෙදෙන හා වෘත්තීය පුහුණු ආයතනවල සිසුන් සඳහා ව්‍යාපාරයක් වඩා ඵලදායි ලෙස පවත්වාගෙන යාමට සහායවීම හා අවශ්‍ය පුහුණුව ලබාදීම සඳහා ව්‍යාපාර තාක්ෂණ පාසල් 02 ක් ආරම්භ කිරීමට රු. 500,000 ක් වෙන්කර තිබුණි. ඒ සඳහා රු. 1,454,417 ක් වැයකර පුවත්පත් දැන්වීම් පල කර තිබුණද ලැබී තිබූ අයදුම්පත් සංඛ්‍යාව ප්‍රමාණවත් නොවීම හේතු වශයෙන් දක්වමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් වැඩසටහන් බොහොමයකින් අපේක්ෂිත ඉලක්කයට ළඟාවී තිබුණද, පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පාසල් හැර ගිය ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක කර නොතිබුණු අතර, ඒවායේ ප්‍රගතිය පිළිවෙළින් සියයට 38 ක් හා සියයට 48 ක් විය.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 වර්ෂයේදී ජාතික තරුණ සේවා සභාවේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් නිකුත් කරන ලද පරීක්ෂණ වාර්තා 11 ක් මගින් අනාවරණය කර තිබූ නිරීක්ෂණ 21 ක් සම්බන්ධයෙන් 2018 අගෝස්තු 14 දින වන විටද අදාල නිවැරදි කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.

(ආ) සභාව විසින් බාහිර ආයතන සතු වාහන 03 ක් වසර 03 කට අධික කාලයක සිට විධිමත් පවරා ගැනීමකින් තොරව පරිහරණය කරමින් පැවතුණි.

4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉඩම් අංශය විසින් විගණනය වෙත ලබා දුන් තොරතුරු අනුව, 2017 දෙසැම්බර් 31 දින වන විට සභාව විසින් භුක්ති විඳිනු ලබන ඉඩම් 59 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. ඊට අමතරව දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් පොල්ගහවෙල පුහුණු මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන ඉඩම සහ බොරැල්ල පිහිටි ඉඩම පිළිවෙලින් අවුරුදු 32 ක් සහ අවු 30 කට අධික කාලයක සිට සභාව විසින් භුක්ති විඳිමින් සිටියද ඒවායේ නීත්‍යානුකූල අයිතිය නිරවුල් කර ගැනීමට නොහැකිව තිබුණි.

(ආ) නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන

(i) ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ ජාතික තරුණ සේවා සභාව විසින් අධ්‍යයන කාර්ය මණ්ඩලයට ගෙවනු ලබන කාර්යසාධන දීමනාව සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේදී නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර තිබූ නිර්ණායකයන් නිවැරදිව අර්ථකථනය කිරීමකින් තොරව හා කාර්යසාධනය පිළිබඳ විධිමත් අගය කිරීමකින් තොරව එම දීමනාව ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. 2017 වර්ෂය තුළදී ජාතික තරුණ සේවා සභාව විසින් කාර්යසාධන දීමනා වශයෙන් රු. මිලියන 4.002 ක් ගෙවා තිබුණි.

(ii) නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අංක MSDVT/SSDP/2016-1 හා 2016 පෙබරවාරි 26 දිනැති, පුහුණු මධ්‍යස්ථානවල තත්ත්ව කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීම හා තත්ත්ව සංස්කෘති (culture) සංවර්ධනය කිරීමට අදාල චක්‍රලේඛය මගින් ජාතික තරුණ සේවා සභාව සඳහා 2016 වර්ෂයට අදාලව පුහුණු මධ්‍යස්ථාන 10 ක සහ 2017 වර්ෂයට අදාල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව පුහුණු මධ්‍යස්ථාන 20 ක තත්ත්ව කළමනාකරණ පද්ධති ස්ථාපිත කර අදාල සහතික ලබා ගැනීම ඉලක්ක ගත කර තිබූ නමුත් 2018 අප්‍රේල් 30 දින වන විට සභාවට අයත් පුහුණු මධ්‍යස්ථාන 52 න් පුහුණු මධ්‍යස්ථාන 07 ක් සඳහා පමණක් තත්ත්ව කළමනාකරණ සහතික ලබාගෙන තිබුණි.

(iii) උක්ත වැඩසටහනේ 2014 වර්ෂයේ සිට 2020 දක්වා අනුමත කර තිබූ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මෙහි සභාවට අදාලව ක්‍රියාකාරකම් අංක 1.4.6 යටතේ මූල්‍යමය උපකාර අවශ්‍ය සිසුන් හඳුනාගෙන එවැනි සිසුන් 100 දෙනෙකු සඳහා මාසිකව රු. 4,000 බැගින් වූ දීමනාවක් ගෙවීම සඳහා මාසිකව රු. 4,800,000 ක් බැගින් මුළු කාල පරිච්ඡේදය වෙනුවෙන් රු. 33,600,000 ක් වෙන්කර තිබුණද, 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ සභාවේ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම්වල එම ක්‍රියාකාරකම ඇතුළත් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ගේ අවශ්‍යතා සඳහා මනා ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය තිරසාර සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට අදාල රජයේ හැකියා ධාරිතාවය ශක්තිමත් කිරීම අරමුණු කරගෙන (ESCAP) එක්සත් ජාතීන්ගේ ආසියානු හා පැසිපික් කලාපයේ ආර්ථික හා සාමාජයීය කොමිසමේ රු. 2,961,000 ක මූල්‍යමය ආධාර යටතේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කරනු ලැබේ.

(i) ජාතික තරුණ සේවා සභාවේ තරුණ සංවිධාන සංවර්ධන අංශය මෙම වැඩසටහනට සම්බන්ධ වී තිබුණු අතර මෙම ප්‍රතිපත්තිමය උපායමාර්ග සැකසීමට අවශ්‍ය කරන සියළුම තොරතුරු සඳහා ප්‍රවිෂ්ඨ වීමේ හැකියාව පැවති අතර, ESCAP සමග පැවති සියළු වැඩසටහන්, දේශන හා සාකච්ඡා සඳහා තරුණ සංවිධාන සංවර්ධන අංශය භාර සහකාර අධ්‍යක්ෂවරයා සහ තවත් නිලධාරීන් දෙදෙනෙකු සහභාගී වී තිබුණි. වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ හැකියාව සභාව සතුව පැවතියද සභාව විසින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා හවුල්කරුවකු ලෙස රාජ්‍ය නොවන සංවිධානයක් තෝරාගෙන තිබුණි.

(ii) එම ආයතනයේ ලියාපදිංචිය හා පැවැත්ම සනාථ කර ගැනීමකින් තොරව හා නිසිදු ඇප සුරක්ෂණයක් ලබා ගැනීමකින් තොරව 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ඡේදයට පටහැනි ලෙස අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත අත්තිකාරම් ලෙස 2017 ඔක්තෝබර් 17 දින රු.1,005,000 ක් රාජ්‍ය නොවන සංවිධානයකට ගෙවා තිබුණි.

(ඇ) ජාතික තරුණ සේවා සභාවේ පුහුණු මධ්‍යස්ථාන 48 ක ක්‍රියාත්මක පූර්ණ කාලීන පාඨමාලා සඳහා වූ ශිෂ්‍ය ලියාපදිංචිය 2016 වර්ෂයේදී 8,557 ක් එනම් ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සියයට 14.66 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි. එහෙත් 2017 වර්ෂයේදී සිසුන් 9,169 ක් වූයෙන් එහි සියයට 7.15 ක වර්ධනයක්ද නිරීක්ෂණය විය. ඒ අනුව, වාර්ෂික ශිෂ්‍ය ලියාපදිංචිය ඉහළ ගොස් තිබූ නමුත් 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ බඳවා ගැනීමේ වර්ධන වේගය සියයට 7.51 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

(ඉ) ලියාපදිංචි සිසුන්ගේ පාඨමාලා හැරයාමේ ප්‍රතිශතය 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ සියයට 20 ත් සියයට 21 ත් අතර පරාසයක පැවති අතර, 2017 වර්ෂයේදී එය සියයට 27.89 ක් දක්වා තවදුරටත් ඉහළ ගොස් තිබුණි.

### 4.4 අරමුදල් ඌන උපයෝජනය

2015 වර්ෂයේදී Active Citizen Training Programme යටතේ එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ජාතික තරුණ සේවා සභාව වෙත රු. 2,215,328 ක් ලැබී තිබූ අතර, 2018 ජූනි 30 දින වන විටත් අදාල කාර්යය සඳහා එය උපයෝජනය කර නොතිබුණි.

### 4.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ ගබඩාවේ තොග සමීක්ෂණ වාර්තා අනුව වර්ෂ දෙකකට අධික කාලයක සිට පැවති එකතුව රු. 405,850 ක් වූ කාණ්ඩ 09 කට අයත් ක්‍රීඩා උපකරණ ඒකක 368 ක් ද වර්ෂයකට අධික කාලයක සිට පැවති එකතුව රු.837,952 ක් වූ කාණ්ඩ 09 කට අයත් අනෙකුත් භාණ්ඩ ඒකක 2,207 ක් ද ශාඛාව තුළ ප්‍රයෝජනයට ගැනීමකින් තොරව නිරීක්ෂණය විය.

(ආ) නාගරික සංවර්ධන අධිකාරිය සමග 2003 ජූනි 23 දින ඇතිකරගත් ගිවිසුම අනුව රු. 2,960,000 ක් ගෙවීම කර ඊට අමතරව වාර්ෂික බිම් බදු මුදල් ලෙස රු. 1,000 බැගින් ගෙවීමේ කොන්දේසි මත තරුණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා බදු පදනමින්

ලබාගෙන තිබූ බෙරුවල ප්‍රදේශයේ අක්කර 01 ක් වූ ඉඩම 2018 මාර්තු 15 දින තෙක් කිසිදු ඉදිකිරීමක් නොකර නිෂ්කාර්යව පැවතුනි.

(ඇ) වර්ෂ තුනක් ඇතුළත වර්ග අඩි 3000 කින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදිකර ජාතික තරුණ සේවා සභාව විසින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම අරමුණු කර පුද්ගලික පාර්ශවයකට අයිතිව තිබුණු සියනෑ කෝරලයේ අධිකාරී පත්තුවේ ගෝනහේන ප්‍රදේශයේ පිහිටි පර්චස් 20 ක ඉඩම 1996 ඔක්තෝබර් 09 වන දින තෑගි ඔප්පුවක් මගින් සභාවට පවරා ගෙන තිබුණු අතර, 2017 දෙසැම්බර් 31 දින වන විටත් එම ස්ථානයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. ඒ අනුව, වසර 21 ක් තිස්සේ මෙම ඉඩම නිෂ්ක්‍රීය වත්කමක් ලෙස පවතින බව නිරීක්ෂණය විය.

## 4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සභාවේ සම්පත්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය සතු පිරිවැය රු. 24,100,000 ක් වූ වාහන 02 ක් 2012 වර්ෂයේ සිට ද, එක් වාහනයක් 2013 වර්ෂයේ සිට ද රේඛීය අමාත්‍යාංශයේ පරිහරණය සඳහා ලබා දී තිබුණි.

(ආ) ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිලධාරීන් 03 දෙනෙකු හා සහකාර තරුණ සේවා නිලධාරියකු 2017 වර්ෂය තුළ ජාතික තරුණ සේවා සභාවට සම්බන්ධ නොවූ බාහිර ආයතන 03 ක රාජකාරි කටයුතු සඳහා සේවයේ නියුක්ත කර තිබුණි.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ජාතික තරුණ සේවා සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 1431 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය1245 ක් විය. ඒ අනුව තනතුරු 186 ක් පුරප්පාඩු පවතින බව නිරීක්ෂණය විය.

(ආ) ජාතික තරුණ සේවා සභාවේ ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරු 03 ක් සඳහා නිලධාරීන් තිදෙනෙකු මාස 18 සිට සහ වර්ෂ 03 ක කාලපරිච්ඡේදයක සිට ද්විතීයන පදනමින් අනුයුක්ත කර තිබූ අතර නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු සඳහා නිලධාරීන් 10 දෙනෙකු වැඩබැලීම සඳහා පත්කර තිබුණි.

(ඇ) 2016 නොවැම්බර් 08 දිනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත තනතුරු සංඛ්‍යාවට අතිරේකව නියෝජ්‍ය අධ්‍යක්ෂක තනතුරු 15 ක්ද සහකාර අධ්‍යක්ෂක තනතුරු 12 ක්ද මධ්‍ය මට්ටමේ නිලධාරීන් 04 දෙනෙකුද වැඩබැලීමේ හා රාජකාරි ආවරණය කිරීමේ පදනමින් අනුයුක්ත කර තිබුණි. මේ සම්බන්ධව කළමනාකරණ සේවා අධ්‍යක්ෂතුමාගේ අංක DMS/1671- V – II හා 2016 නොවැම්බර් 08 දිනැති ලිපිය මගින් කුමන හෝ තනතුරක් සඳහා වැඩබැලීම, රාජකාරි ආවරණය හෝ ස්ථිරව පත්කළ හැක්කේ අනුමත තනතුරු සංඛ්‍යාව තුළ පමණක් බවත් මෙම තත්ත්වය නිවැරදි කළ යුතු බවත් දන්වා තිබූ අතර, 2017 දෙසැම්බර් 31 දින දක්වා එවැනි නිවැරදි කිරීමක් සිදුකර නොතිබුණි.

(ඈ) අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇතුළත් නොවූ මාධ්‍ය උපදේශක තනතුරෙහි රාජකාරි ඉටු කිරීමේ පදනමින් ඉන්ධන සමග වාහනයක්ද හා මාසිකව රු. 40,000 ක දීමනාවක් ද සමග මාධ්‍ය උපදේශකවරයකු 2015 අප්‍රේල් 30 දින සිට පත්කර තිබූ අතර, 2017 දෙසැම්බර් 31 දින වන විට මාසික දීමනාව වශයෙන් එකතුව රු.1,281,333 ක් ගෙවා තිබුණි.

(ඉ) ජාතික තරුණ සේවා සභාවේ කාර්මික හා වෘත්තීය පුහුණු අංශයේ අනුමත කාර්ය මණ්ඩලය 176 ක් වූ අතර, අධ්‍යක්ෂ (පුහුණු) හා නියෝජ්‍ය අධ්‍යක්ෂ (කාර්මික හා වෘත්තීය පුහුණු) යන තනතුරුද ඇතුළත්ව 2018 මාර්තු 31 දිනට පුරප්පාඩු 61 ක් පැවති අතර, ඉන් පුරප්පාඩු 59 ක් අධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් බව නිරීක්ෂණය විය.

(ඊ) ජාතික තරුණ සේවා සභාවේ සහකාර තරුණ සේවා නිලධාරියකු ලෙස සේවය කර අසතුටුදායක රාජකාරි තත්ත්වය මත ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 7 වන ඡේදය ප්‍රකාරව සේවය අතහැර ගිය පුද්ගලයකුගෙන් අයකරගත යුතුව පැවති රු.59,875 ක මුදල අයකර ගැනීමකින් තොරව සම්පූර්ණ පාරිතෝෂිත මුදල් ගෙවා තිබුණි. තවද එම නිලධාරියා විසින් සේවයේ යෙදී සිටි කාලය තුළ සහකාර අධ්‍යක්ෂවරයකුගේ නිලමුද්‍රාව අනවසරයෙන් තබා ව්‍යාජ අත්සනක් සහිතව රජයේ බැංකුවකින් රු. 50,000 ක ණය මුදලක් ලබාගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 29,31 වගන්ති ප්‍රකාරව ඔහුට එරෙහිව කිසිදු විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 4.8 වාහන උපයෝජනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2015 ජූලි 10 දිනැති අංක 2015/02 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ උපදෙස් අනුගමනය කරමින් 2018 ජූනි 30 දිනට පෙර අපහරණය කොට 2018 ජූලි 30 දින හෝ ඊට පෙර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට දැන්විය යුතු වුවද 2017 දෙසැම්බර් 31 දින වන විට අපහරණය කළ යුතු තත්ත්වයේ පැවති වාහන 07 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දින වන විට සභාව සතු / භාවිතා කරන වාහන 06 ක් වර්ෂ ගණනාවක් තිස්සේ අළුත්වැඩියා තත්ත්වයේ පැවති අතර, අදාල අළුත්වැඩියා කටයුතු කිරීමෙන් තොරව සභාවේ විවෘත භූමියේ ගාල්කර පැවතුණි.

## 5. තිරසාර සංවර්ධනය

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය අංශයක් විසින්ම කටයුතු කළ යුතුව පැවති අතර සාමාලෝචිත වර්ෂයට අදාලව ජාතික තරුණ සේවා සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද, යන්න පිළිබඳ දැනුවත් වී නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

#### 6.1.1 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය තීන්ත ආලේප කිරීම - ගිවිසුම්ගත වටිනාකම රු.956,845

(i) උක්ත කර්මාන්තය සඳහා වෙළඳපොල මිල සැදහුම් ක්‍රමය අනුගමනය කළ බව දක්වා තිබුණද මිල ගණන් කැඳවීමේදී ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීම හෝ වෙනත් පිළිගත හැකි ක්‍රමවේදයක් හෝ අනුගමනය කර නොතිබුණු අතර, කොන්ත්‍රාත්කරු තෝරාගැනීම පිළිබඳව විගණනයේදී ගැටළුකාරී විය.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 දරන මාර්ගෝපදේශයට පටහැනි ලෙස පිළිගත හැකි අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් ලබාගැනීමකින් තොරව රු. 191,369 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි.

(ආ) ප්‍රධාන කාර්යාලයේ තීන්ත ආලේප කිරීම II අදියර - ගිවිසුම්ගත වටිනාකම - රු. 8,692,720

---

වෙළඳපොල මිල සැදහුම් ක්‍රමය අනුගමනය කල බව දක්වා තිබුණද එම ක්‍රමය අනුගමනය කර නොතිබුණු බවත් ව්‍යාජ මිල කියුම් භාවිතා කර තිබුණු බවත් 2017 ඔක්තෝබර් 24 දින විගණනයේදී සිදුකල භෞතික විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. එසේම මෙම කොන්ත්‍රාත්තුව වෙනුවෙන් සකස් කරන ලද ඉංජිනේරු ඇස්තමේන්තුවේ සඳහන් අයිතම 08 ක රේටයන් හා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ රේටයන් අතර සියයට 20 සිට සියයට 167 දක්වා පරාසයක විචලනයන් පැවතුණි. ඒ සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ ප්‍රසම්පාදන කමිටුවේ අවධානය යොමුවී නොතිබුණි. තවද, විගණනය විසින් මේ සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදු කරන අතරතුර කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු අතරමග නතර කර තිබූ අතර, සභාව විසින් මෙම කොන්ත්‍රාත්කරුගෙන් කාර්යසාධන ඇපකරයක්ද ලබාගෙන නොතිබුණි.

තවද, 2017 දෙසැම්බර් 28 දින ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ පැවති විගණන හා කළමනාකරණ කමිටුවේදී තීන්ත ආලේප කිරීමට අදාල බිල්පත වෙනත් ආයතනයක තාක්ෂණික නිලධාරියකුගේ නිර්දේශය මත ගෙවීම් සිදුකරන ලෙසට නිර්දේශ ලබා දී තිබුණි. එසේ වුවද ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ ව්‍යාජ ලේඛන සකස් කර වැරදි ක්‍රමවේදයන් ඉටු කිරීම සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

### 6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 මැයි 21 දිනැති අංක 13/0502/639/014 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් මාතර නිල්වලා යොවුන් උද්‍යානය ඉදිකිරීමට තීරණය කර තිබුණද මේ සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර නොතිබුණි. යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය විසින් අදාල ඉඩම් හිමිකරුවන්ට වන්දි හා පොලිය වශයෙන් එකතුව රු. 142,810,543 ක් ද 2014 දෙසැම්බර් 31 දින වන විට ජාතික තරුණ සේවා සභාව විසින් උපදේශක ගාස්තු ද ඇතුළුව එහි ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රු. 7,657,349 ක් වැය කර තිබුණි. එසේ වුවද, 2014 දෙසැම්බර් 31 දිනෙන් පසුව අමාත්‍යාංශයේ ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අතරමග නතර කර තිබුණි. 2017 ඔක්තෝබර් 16 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී එම භූමිය වල් බිහිවී නිශ්කාර්යයව පැවති බව නිරීක්ෂණය විය.

(ආ) ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2017 මාර්තු 28 දිනැති MNPEA/YAD/03/01 දරන ලිපියට අනුව, ජාතික තරුණ සේවා සභාව සතු හැඩිගම මාදන්ගහවත්ත නමැති ඉඩම විවිධ අවශ්‍යතා සඳහා අගනුවරට පිවිසෙන තරුණ තරුණියන්ගේ කෙටිකාලීන නවාතැන් පහසුකම් සලසා දීම පිණිස ක්‍රීඩා පිටියක් හා නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා යෝජිතව තිබුණි. ඒ අනුව තරුණ සේවා සභාව විසින් 2017 සැප්තැම්බර් 18 දින වන විට මූල්‍ය සැලසුම් සඳහා රු. 2,400,601 ක් ගෙවා තිබුණද 2018 ජූනි 30 දින දක්වාම එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. තවද, එම උපදේශක ආයතනය සමග ඇතිවී තිබූ නෛතික ගැටළු හේතුවෙන් ඇතිකරගෙන තිබූ ගිවිසුම් අවසන් කර ඉදිරි කටයුතු සඳහා වෙනත් උපදේශන ආයතනයක් තෝරා ගැනීමට කටයුතු කර ඇති බව විගණනයට දැනුම් දී ඇත.

### 6.1.3 ප්‍රමාද වූ ව්‍යාපෘති

ජාතික තරුණ සේවා සභාව මගින් 2016 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කර 2017 වර්ෂයේදී නිම කිරීමට නියමිතව තිබූ ගිවිසුම්ගත වටිනාකම රු. 141,910,758 ක් වූ ව්‍යාපෘති 02 ක් සඳහා අවස්ථා දෙකකදී දින දීර්ඝ කිරීම් ලබාදී තිබුණද, 2018 ජූනි 30 දින වන විටද ඉදිකිරීම් නිම කර නොතිබුණු අතර, 2018 ජූනි 20 දිනට භෞතික ප්‍රගතිය සියයට 62 ක් වූ අතර එදිනට එකතුව රු. 87,153,099 ක් වැය කර තිබුණි.

### 6.2 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සභාවේ අංශ 9 ක් සඳහා අයවැය ප්‍රතිපාදන හා සත්‍ය වියදම අතර සියයට සියයට 25 සිට සියයට 93 දක්වා වූ පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ අයවැය විචලතා සහ වියදම් සාරාංශ උපලේඛන පරීක්ෂාවේදී එක වැය විෂයයක වියදම රු. 315,055 කින් වැඩියෙන්ද වැය විෂයන් 4 ක වියදම එකතුව රු. 32,683,429 කින් අඩුවෙන්ද අයවැය විචලතාවය යටතේ දක්වා තිබුණි.

### 6.3 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2006 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ප්‍රකාරව වාර්ෂික වාර්තාව ගිණුම් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත් 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2018 ජූලි 31 දින වන විටද පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 6.4 නොවිසඳී ඇති විගණන ඡේද

2015 වර්ෂයේ විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී ඇති ආයතනයේ මූල්‍ය හා පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් බලපෑමක් සිදුවී ඇති විගණන සොයාගැනීම් 02 ක් සම්බන්ධයෙන් හා ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දුන් ප්‍රමාණවත් විගණන සොයාගැනීම් 05 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය නිමවන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද විගණන සොයාගැනීම් 04 ක් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව විගණනයට පැහැදිලි පිළිතුරක් ලබාදීමට අපොහොසත් වුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනය පිළිබඳ අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) ප්‍රසම්පාදනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල වන පරිදි විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ස්ථාපිත නොකිරීම හා ඒ තුළින් රජයේ මුදල් කාර්යක්ෂමව, ඵලදායීව හා ආර්ථිකව උපයෝජනයෙ නොකිරීම. |
| (ආ) ගිණුම්කරණය | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කරමින් මූල්‍ය තොරතුරු නිවැරදිව වාර්තා වන පරිදි විධිමත් ගිණුම්කරණ පද්ධතියක් පවත්වා නොගැනීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | අනුමත කාර්යය මණ්ඩලයට සහ බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව බඳවාගැනීම්, උසස් කිරීම්, පුහුණුව හා සංවර්ධනය කිරීම හා ආයතනයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමට හැකිවන පරිදි මානව සම්පත් සැලැස්මක් සකස් කර සමාලෝචනය කර යාවත්කාලීන නොකිරීම. |
| (ඈ) පුහුණු පාඨමාලා පැවැත්වීම | ආයතන විසින් ක්‍රියාත්මක කරන පුහුණු වැඩසටහන් සඳහා උපදේශකවරුන් බඳවාගැනීම හා ගෙවීම් කිරීම මෙන්ම වර්තමාන තරුණ අවශ්‍යතා සපුරාගත හැකි පරිදි පුහුණු වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක නොකිරීම. |
| (ඉ) වත්කම් පාලනය | සභාව සතු වත්කම්වල ආරක්ෂාව හා පැවැත්ම තහවුරු වන පරිදි විධිමත් ලේඛන පවත්වා ගැනීම හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මඟින් හෙළිදරව් වන කරුණු පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග නොගැනීම. |

එච්. එම්. ගාමිණී විජේසිංහ
විගණකාධිපති

ජාතික තරුණ සේවා සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

| | | |
|---|---|---|
| 2.2 | මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම | |
| 2.2.1 | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන | |
| | ජාතික තරුණ සේවා සභාවේ සියයට 98 ක කොටස් හිමිකාරත්වයක් ඇතිව 1981 වර්ෂයේ ආරම්භ කරන ලද සී/ස තරුණ සේවා (පුද්) සමාගමේ මූල්‍ය ප්‍රකාශන, සභාවේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඒකාබද්ධ කර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ගිණුම් සටහන් අංක 10 මගින් හෙළිදරව් කර ඇත. |
| 2.2.2 | සම්බන්ධිත පාර්ශවයන් සමඟ ඇති ගනුදෙනු හෙළිදරව් නොකිරීම | |
| (අ) | ජාතික තරුණ සේවා සභාවේ සභාපති, සීමා සහිත ශ්‍රී ලංකා තරුණ සේවා (පුද්) සමාගමෙහිද සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමයෙහි ද ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයේද සභාපති ලෙස කටයුතු කරනු ලබන අතර ඒ පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ගිණුම් සටහන් අංක 10 මගින් හෙළිදරව් කර ඇත. |
| (ආ) | සීමාසහිත ශ්‍රී ලංකා තරුණ සේවා (පුද්) සමාගමෙහි පරිපාලන කටයුතු සහ ව්‍යාපාරික ස්ථානය ද ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමූපාකාර සමිති සංගමයේ ප්‍රධාන පරිපාලන කාර්යාලයද ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයේ ප්‍රධාන පරිපාලන කාර්යාලයද සභාවෙහි ප්‍රධාන කාර්යාලය පිහිටි භූමියෙහි සභාවට අයත් ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන අතර ඊට අවශ්‍ය විදුලිය, ජලය ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් ද කිසිදු අයකිරීමකින් තොරව සභාව විසින්ම සපයනු ලබයි. එහෙත් ඒ පිළිබඳ කිසිදු හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශන තුළ සිදුකර නොතිබුණි. | ඉහත සඳහන් ආයතන සඳහා කළමණාකරණය මගින් තීරණයක් ගෙන විදුලිය, ජලය ඇතුළු අනෙකුත් යටිතල පහසුකම් සඳහා අයකිරීමක් කරන්නේද, නොකරන්නේද යන්න සලකා බලා 2018 වර්ෂයේදි මෙය මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| 2.2.3 | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | |

| | | |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 53 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කෙරෙන සියළුම සංඛ්‍යාත්මක තොරතුරු සඳහා සංසන්දනාත්මක තොරතුරු හෙළිදරව් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු ගොඩනැගිලි 477 ක් මෝටර් රථ 84 ක් හා ලී බඩු උපකරණ ඒකක 5608 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව, ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. තවද එහි දළ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | වාහන 84 න් 05 ක් හැර ඉතිරි වාහන ප්‍රත්‍යාගණනය කර ඇති අතර, මේ වර්ෂ යේ අවසානයට පෙර සම්පූර්ණ වාහන 84 ම ප්‍රත්‍යාගණනය කර එම අගය ගිණුම් සඳහ අනාවරණය කිරීමට කටයුතු කරන්නෙමු. ගොඩනැගිලි හා ලීබඩු උපකරණ වල ප්‍රත්‍යාගණනය කිරීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී. |
| ඇ) | ජාතික තරුණ සේවා සභාවේ පහත සඳහන් පුහුණු මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය සභාව සතු නොවූ අතර අදාල පවරාගැනීමේ කටයුතු සිදුකරමින් පවතී. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 25 ඡේදය ප්‍රකාරව යම් වත්කමක් හුවමාරු නොවන ගනුදෙනුවක් හරහා අත්පත්කරගෙන ඇතිවිට එහි පිරිවැය මැනිය යුත්තේ එම වත්කම අත්පත් කරගත් දිනට සාධාරණ වටිනාකමට වුවත්, සභාව විසින් එම ඉඩම්වල ආරක්ෂක වැටවැටවල් සහ බැම් ඉදිකිරීම වැනි කටයුතු වෙනුවෙන් දරන ලද වියදම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඉඩම් හා ගොඩනැගිලි යටතේ ගිණුම්ගත කර තිබුණි. තවද එම ඉඩම් සම්බන්ධයෙන් ගිණුම්ගත කර තිබූ වටිනාකම, ඒවායේ සාධාරණ අගයට වඩා අඩු වටිනාකම් වූ අතර මූල්‍ය ප්‍රකාශන තුළින් එම වත්කම් වල නිවැරදි අගය නිරූපනය නොවන බවට නිරීක්ෂණය කෙරේ.<br><br>තවද මහරගම බෙල්වුඩ් හා කුරුණෑගල ඉඩම්වල විශාලත්වය හා ප්‍රාදේශීය වටිනාකම සලකා බැලීමේදී ගිණුම්ගත කර තිබූ වටිනාකම පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි බව තවදුරටත් නිරීක්ෂණය කෙරේ. | මහරගම , බෙල්වුඩ් හා කුරුණෑගල ඉඩම් ,ඉඩම් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත තක්සේරු කිරීම් කටයුතු සඳහා යවා ඇති බැවින් තක්සේරු අගයන් ලද පසු ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. |

| | | |
|---|---|---|
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09 හි 15 වන ඡේදයට අනුව තොග ගණනය කිරීමේදී පිරිවැය හෝ ශුද්ධ උපලබ්දි අගය යන වටිනාකමින් අඩු අගයට තොග ගණනය කළ යුතු වුවද මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ප්‍රතිපත්ති යටතේ පිරිවැයට තොග අගය කර ඇති බව දක්වා තිබුණි. 2016 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මගින් විනාශ කළ යුතු බවට නිර්දේශ කර තිබූ පිරිවැය රු. 86,840 ක් වූ අයිතම 14 කට අයත් ඒකක 1885 ක් විනාශ කිරීමකින් තොරව 2017 දෙසැම්බර් 31 දිනට වූ තොග වටිනාකම තුළ ඇතුළත් කර තිබුණි. | විනාශ කළ යුතු රු.86,840 ට අදාල භාණ්ඩ 2018 වර්ෂයේදි තොග ගණනය කිරිමේදි නිවැරදි කර ගණනය කිරීමට කටයුතු කරන බවද දන්වා සිටිමි. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 09 හි 29 ඡේදය ප්‍රකාරව සභාව සතු ගොවිපල 20 හි වර්ෂ අවසාන කෘෂිකාර්මික තොගයෙහි වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. | වර්ෂය අවසානයෙහි අදාල ගොවිපොළවල කෘෂිකාර්මික තොග වාර්තා කරන මෙන් දන්වා ඇතත් වාර්තා නොවීම නිසා ගිණුම් වල සටහන් කිරීමට අගයක් නොතිබුණි. නැවතත් මේ සම්බන්ධව දැනුවත් කර එවැනි තොග වාර්තා කරන මෙන් අදාල ගොවිපොළ භාර අංශයට දැනුවත් කිරීම සඳහා ලිපි යවා ඇත. |
| 2.2.4 | ගිණුම්කරණ ප්‍රතිපත්ති<br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 හි 12 ඡේදය ප්‍රකාරව ගනුදෙනුවක්, වෙනත් සිදුවීමක් හෝ තත්ත්වයක් කෙරෙහි ව්‍යවහාර වන නිශ්චිත ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියක් නොමැති විට කළමනාකරණය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් නිර්මාණය කර ව්‍යාවහාර කිරීම පිණිස සිය විනිශ්චය උපයෝගී කරගත යුතු වුවත්, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ස්කන්ධය යටතේ දක්වා තිබූ ශ්‍රී ලංකා රජයෙන් හා විදේශ රාජ්‍ය වලින් ලැබී තිබූ ප්‍රදාන ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් නිර්මාණය කර නොතිබුණි. | 2018 වර්ෂයේ මූල්‍ය ප්රකාශන පිළියෙළ කිරීමේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 69 ඡේදය අනුව වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීම සඳහා සූදානම් තත්ත්වයට ගෙනආ පසු වුවද ඊට පටහැනි ලෙස මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ප්‍රතිපත්ති අංක 02 යටතේ ස්ථාවර වත්කම් ක්ෂය ප්‍රතිපත්තිය දක්වා තිබුණි. | ගිණුම් ප්‍රතිපත්ති අංක 02 හි සඳහන් පරිදි ස්ථාවර වත්කම් ක්ෂය වීම මිලදීගත් වර්ෂයට පසු වර්ෂයේ සිට කරගෙන යනු ලබන අතර 2018 වර්ෂයේ සිට නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති | ගිණුම් ප්‍රතිපත්ති අංක 08 යටතේ ජාතික තරුණ සේවා |

| | | |
|---|---|---|
| | අංක 08 යටතේ සභාවට අනුබද්ධිතව පිහිටා ඇති අභ්‍යන්තර සංවිධාන වලට ලබාදී ඇති වත්කම් සභාවේ අයහාර වියදමක් සේ සලකනු ලබන බව දක්වා තිබුණද එසේ ලබාදී ඇති වත්කම් සමාගමේ දේපල පිරියත හා උපකරණ තුළ ප්‍රාග්ධනිත කර ඇති බව අනාවරණය විය. | සභාව අනුබද්ධිතව ඇති ආයතන සඳහා ආධාර ප්‍රධාන යටතේ දරණ වියදම් අයහාර වියදම් ලෙසද වත්කම් මිලදී ගැනීම් ස්ථාවර වත්කම් ලෙසත් ඉදිරිපත් කර ඇත. |
| 2.2.5 | ගිණුම්කරණ අඩුපාඩු<br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| (අ) | ඉඩම් අංශයෙන් ලබා දුන් තොරතුරු අනුව සභාවට නීත්‍යානුකූල අයිතිය ඇති පහත සඳහන් ඉඩම් 05 ක වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කර නොතිබුණි. | 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (I) | ඌව පළාත් කාර්යාලය හා බදුල්ල දිස්ත්‍රික් කාර්යාලය පිහිටි ඉඩම. | |
| (II) | සපුගස්කන්ද පුහුණු මධ්‍යස්ථානය, කොරියා ශ්‍රී ලංකා තාක්ෂණික හා වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය. | |
| (III) | පෞද්ගලික පාර්ශවයක් විසින් පරිත්‍යාග කරන ලද ගෝනහේන ප්‍රදේශයේ පිහිටි ඉඩම. | |
| (IV) | මාතර දිස්ත්‍රික්කය - පළාත් කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාලය පිහිටි ඉඩම. | |
| (V) | යායවත්ත පුහුණු මධ්‍යස්ථානය පිහිටි ඉඩම | |
| (ආ) | 2000 වර්ෂයේ නාගරික සංවර්ධන අධිකාරියෙන් වර්ෂ 50 ක දීර්ඝ කාලීන බදු පදනම මත ලබාගෙන තිබූ ඉඩමක 2017 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු. 2,131,200 ක් බදු දේපල යටතේ නොදක්වා මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ඉඩම් හා ගොඩනැගිලි යටතේ ඇතුළත් කර තිබුණි. | 2018 වර්ෂයේදී මාරු කිරීමේ වවුචර් පත්‍රයකින් නිවැරදි කර ඇත. (J/180) |
| (ඇ) | ජාතික තරුණ සේවා සභාව මගින් ක්‍රියාත්මක කරනු ලබන ගොවිපලවල් 20 කට අදාල වාර්ෂික ලාභය වශයෙන් රු. 7,931,519 ක් දක්වා තිබුණද ගොවිපල වලට අදාල වත්කම් ක්ෂයවීම්, කෘෂිභෝගවල අවසන් තොගය හා ගොවිපල නිෂ්පාදන ණයට විකුණුම්වලට අදාල ගැලපීම් සිදුකර නොතිබුණි. | ගොවිපොළ වලට අදාල නිෂ්පාදන හා ණයට විකුණුම් වර්ෂය අවසානයේ ගොවිපළවල් වෙතින් වාර්තා වී නොමැති බැවින් ගිණුම් වල හෙළිදරව් නොවේ. |
| (ඈ) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ස්කන්ධයෙහි ඇතුළත් වෙනත් රාජ්‍ය අස්තිත්වයන්ගේ දායක වූ ප්‍රාග්ධනය යටතට සංරචකයන් 04 ක් ඇතුළත් වී තිබුණද | ප්‍රමිති අංක 01 අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ නිවැරදි ආකෘතියට අනුව උපලේඛන අංක 05 හි ඇති අතර, මූල්‍ය ප්‍රකාශනයේ 96 පිටුවේ විස්තරාත්මකව පෙන්වා දී ඇත. |

| | | |
|---|---|---|
| | ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයේ රජයේ දායකයට අදාල වෙනස්වීම් පමණක් හෙලිදරව් කර තිබුණි. | |
| (ඉ) | ජාතික තරුණ සේවා සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු. 753,903,484 ක් වූ කෙරීගෙන යන වැඩවල වටිනාකම, මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වෙනත් මූල්‍ය වත්කම් යටතේ දක්වා තිබුණි. | ප්‍රමිත අංක 01 අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ නිවැරදි ආකෘතියට අනුව උපලේඛන අංක 02 හි ඇති අතර මූල්‍ය ප්‍රකාශනයේ 68 පිටුවේ විස්තරාත්මකව පෙන්වා දී ඇත. |
| (ඊ) | ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශනවල රේඛීය අයිතමයන්ට අදාලව ඉදිරියෙන් දක්වා තිබූ උපලේඛන මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. | 2018 වර්ෂයේදී නිවැරදි කිරිමට කටයුතු කරගෙන යනු ලැබේ. |
| 2.2.6 | පැහැදිලි නොකළ වෙනස්කම් | |
| | මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සීමාසහිත ශ්‍රී ලංකා තරුණ සේවා සමාගම වෙත ගෙවිය යුතු ණය හිමි ශේෂය රු. 3,602,190 ක් ලෙස දක්වා තිබුණ ද එම සමාගම විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එදිනට සභාවෙන් අයවිය යුතු ණය ශේෂයන්ගේ එකතුව රු. 73,427,936 ක් වූයෙන් එම ශේෂයන් දෙක අතර රු. 69,825,746 ක වෙනසක් නිරීක්ෂණය විය. | 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව ණය හිමි උපලේඛනයේ සීමාසහිත තරුණ සේවා සමාගම නමින් ගිණුම් ගත ශේෂයන් පහත සඳහන් වේ.<br>2015 වර්ෂයේ ණය හිමි ශේෂය රු. 110,000.00<br>2017 වර්ෂයේ ණය හිමි ශේෂය රු. 3,492,189.79<br>ඉහත සඳහන් ශේෂයන්ගෙන් 2017 වර්ෂයට අදාල රු.3,492,189.79 මේ වන විට ගෙවීම් කර ඇත.<br>ගිණුම් පියවීමේදී ඉදිරිපත් වූ වටිනාකමට අමතරව, 2017 වර්ෂයට අදාල 2018 වර්ෂයේ ගෙවීම් සඳහා ඉදිරිපත් වී ඇති වවුචර්පත් වටිනාකම රු.9,151,487.61 ක් වේ. මෙම මුදලද මේ වන විට ගෙවීම් කර ඇත.<br>2015 වර්ෂයේ රු. 110,000/- ක මුදල සඳහා මේ දක්වා ඉන්වොයිස් ඉදිරිපත් වී නැත. ඒ අනුව විගණන විමසුමේ සඳහන් රු. 73,427,936 ක් නොව රු.60,784,258.60 ක් වන අතර ඒ සඳහා ඉන්වොයිස් ඉදිරිපත් වී නොමැත. |
| 2.2.7 | ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්<br>පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | |
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් නිලධාරී 06 දෙනෙකුට අදාලව එකතුව රු. 118,065 ක ණය ශේෂ වලින් කිසිඳු වාරිකයක් සමාලෝචිත වර්ෂය තුළ අයකරගෙන නොතිබුණි. | එච්.කාලිංගමුදලි මහතා - රු.71,953.67<br>මේ වන විට අයවිය යුත්තේ රු.65,402.45 කි. එම මුදල අයකර ගැනීම සඳහා ගම්පහ දිසා අධිකරණයේ නඩු අංක 43010/එම් යටතේ නඩු පවරා තිබූ අතර, තීන්දුව 2018.05.31 දින ලබාදෙමින් සිවිල් නඩු විධිවිධාන සංග්‍රහයේ 225(3) වගන්තිය ප්‍රකාරව ඇස්කිසි ක්‍රියාත්මක කිරීමට අවසර දී ඇත.<br>එස්.අමරා කුමාරි මිය - රු. 6,164.00<br>2018 වර්ෂයේදී පාරිතෝෂික මුදලින් හිලව් කරගෙන ඇත.<br>ඩබ්.ඒ.ආනන්ද මහතා - රු.22,049.00<br>එස්.විජේකුමාරන් මහතා - රු. 7,531.79<br>එච්.එම්.සරත් මහතා - රු. 5,496.50<br>එස්.කේ.පොන්නයියා මහතා - රු. 4,870.84<br>ඉහත නිලධාරින් 04 දෙනාගේ පදිංචිය සනාථ කරගැනීමෙන් |

| | | |
|---|---|---|
| | | අනතුරුව නෛතික ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කරනු ලැබේ. |
| (ආ) | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු 2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ 07 කට වඩා පැරණි රු. 538,950 ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂය තුළ දී ද අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | දිගින් දිගටම මේ පිළිබඳව ලිපි යොමු කොට ඇති අතර ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් නිසි පිළිතුරක් ලබාදී නොමැත. විගණන හා කළමණාකරණ කමිටුවේදී මේ පිළිබඳව සාකච්ඡා කරන ලද අතර, අයවීම් සම්බන්ධයෙන් වන ලිඛිත තොරතුරු ඇතුලත් කොට සහා සංදේශයක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී ඒ අනුව 2017-07-21 දින අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සංදේශයක් ඉදිරිපත් කර ඇත. (32/2017) ඉදිරියේදී ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම සම්බන්ධයෙන් සහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කිරීමට අපේක්ෂා කෙරේ. |
| 2.2.8 | පිළිතුරු නොලත් විගණන විමසුම් | |
| | 2016 වර්ෂයේදී නිකුත් කරන ලද අංක VTY/A/NYSC/2015/29 දරන විගණන විමසුම සඳහා 2018 ජුනි 30 දින වන විටත් පිළිතුරු ලබාදී නොතිබුණි. | මෙයට අදාළ පිළිතුර 2016.05.06 දින ලබාදී ඇත. |
| 2.3 | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම<br>පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය. | |
| (අ) 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනතේ III වන කොටසේ 13 වගන්තිය | සේවය අවසන් කරන ලද නිලධාරියාගේ පාර්තෝෂික මුදලින් අයකර ගත හැකිව තිබූ රු. 59,875 ක් අය කර ගෙන නොතිබුණි. | මෙම නිළධාරියාගෙන් අයවිය යුතුව තිබූ රු.59,875 ක මුදල අයකර ගැනීම සඳහා පුද්ගලික ලිපිගොනුවෙන් මොහු වෙත සිහිකැඳවීම් 02කින් දැන්වීමට කටයුතු කර ඇත. නමුත් මේ දක්වා ප්‍රතිචාර නොමැති වීම නිසා සිවිල් නීතිය යටතේ පැමිණිල්ලක් ගොනුකිරීමට කටයුතු කර ඇත.ඒ අනුව ඉදිරි කටයුතු සිදුවන බව දන්වා සිටිමි.<br><br>තවද මෙම ලිපිගොනුව භාරව සිටි නිළධාරිනියට තරයේ අවවාද කිරීමක් නිකුත් කර ඇත. තවද, රු.59,875/-ක මුදල අදාළ නිළධාරියාගෙන් අයකර ගැනීමට නොහැකි වුවහොත් අදාළ විෂය ලිපිකරුගෙන් අයකර ගැනීමට කටයුතු කරන බවද දන්වා සිටිමි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 757(2) | සමාලෝචිත වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව 2018 ජූලි 20 දින | මේ වන විට භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇත. |

| | | |
|---|---|---|
| රෙගුලාසිය | තෙක් විගණකාධිපති වෙත ඉදිරිපත් නොකෙරුණි. | |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආයතන සංග්‍රහයේ V වන පරිච්ඡේදයේ 7 වන වගන්තිය හා VII පරිච්ඡේදයේ 1.6 හා 1.8 වගන්ති | නොදන්වා සේවයට නොපැමිණෙන නිලධාරීන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබූ අතර, නිවාඩු ලබා නොගෙන සේවයට නොපැමිණි හා සේවයට වාර්තා නොකර සිටි නිලධාරීන් 04 දෙනෙකු සඳහා වැටුප් ගෙවා තිබුණි. | මෙම නිළධාරියා විසින් 2016.11.20 දින 2016.12.01 දින සිට සේවයෙන් ඉල්ලා අස්වන බවට ලිපියක් ලබාදී ඇති අතර, ඔහුට හිමි පාරිතෝෂික මුදල හෝ සේවක අර්ථසාධක මුදල හෝ සේවක භාරකාර අරමුදල් මේ දක්වා ලබාදී නොමැත.මොහු විසින් සේවයට වාර්තා නොකිරීම මත 2016.08.11 දිනැති ලිපිය මගින් වැටුප් ගෙවීම නතර කර ඇත.ඒ අනුව 2016 ජුලි මස දක්වා වැටුප් ඔහුගේ ගිණුමට බැරවී ඇති බව නිරීක්ෂණය විය.මොහු සේවයට නොපැමිණි කාලය වැටුප් රහිත සේ සලකා අයකර ගැනීමට කටයුතු කර ඇත.<br>ඒ අනුව මොහුගේ පාරිතෝෂික මුදලින් අයවීමට ඇති මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව දන්වා සිටිමි.<br>මෙහි ඉදිරිපත් කර ඇති කරුණු හා පෙන්වා දී ඇති අඩුපාඩු සම්බන්ධයෙන් ඉරිදියේදී කටයුතු කල යුතු ආකාරය පිලිබඳව ආයතන අංශයේ විෂය ලිපිගොනු කරන සියළු ලිපිකරුවන් වෙත ලිපියක් මගින් උපදෙස් ලබාදී ඇත.<br>සේ.අ.අ 2798 දරණ නිළධාරියා 2016.08.25 දින සිට ධූරය හැරයාම නිකුත් කල අතර,මොහුට ඒ වන විට සැප්තැම්බර් මස වැටුප සකසා ඇත.නමුත් මොහුගේ සැප්තැම්බර් මස වැටුප රු.191.16/-ක් පමණි.එම මුදල ගිණුම් අංශයේ වැටුප් ගිණුමට මාරුකර ඇත. එම නිසා මොහුගේ මෙම සැප්තැම්බර් මස වැටුප ඔහු විසින් ලබා දී නොමැත.2016 අගෝස්තු, සැප්තැම්බර් මසට අදාළ සේවා අර්ථසාධක අරමුදල් 12%, 8% හා සේවා නියුක්තිභාර අරමුදලේ 3% ද නැවත අයකර ගැනීමට කටයුතුකර ඇත.තවද මොහුගේ පාරිතෝෂික මුදලින් 2015 වර්ෂයේ වැටුප් රහිත දින 142ක් සඳහා රු.145,689.56ක්ද, 2016 වර්ෂයේ වැටුප් රහිත දින 86ක් සඳහා 115,822.69ක්ද අයකර ගෙන ඇත.එම නිසා ඔහුගෙන් රජයට පාඩු වූ මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇත.<br>සේ.අ.අ 1698 දරණ නිළධාරියා 2016 වර්ෂය සඳහා දින 114ක් වැටුප් රහිත නිවාඩු ලබාගෙන ඇති අතර, 2017.09.15 දින ගිණුම් අංශය වෙත යොමුකල ලිපිය මගින් වාරික 10කින් අදාළ මුදල් අයකර ගැනීමට ලිපියක් නිකුත් කර ඇත.ඒ අනුව එයට අදාළ සම්පූර්ණ මුදල රු.200286.60ක් වන අතර, ඉන් 2017.12.27 වන විට රු.46,065.92ක මුදලක් අයකර ගෙන ඇති අතරම, තවදුරටත් 154,220.68 ක මුදලක් අයකර අවසන්ව ඇත.<br>-සේ.අ.අංක 3592 දරණ නිළධාරියාට රාජකාරී නිවාඩු අනුමත කරදී ඇති දින ප්‍රමාණයෙන් දින 03ක් පෙරදින රාජකාරි සඳහා වාර්තාකර නොතිබීම මත එම දින 03 2017 වර්ෂයේ නිවාඩු ගණනය කිරීමේදී වැටුප් රහිත නිවාඩු ලබා ඇත්නම් ඒ සමඟ අයකිරීමට කටයුතු කරන අතර, 2017 මාර්තු, අප්‍රේල්, මැයි මාස සඳහා නොදන්වා නොපැමිණි දින වැටුප් රහිත දින සේ සලකා කටයුතු |

| | | |
|---|---|---|
| | | කිරීමට නියෝග ලබා දී ඇති නමුත් එම නියෝගය මේ දක්වා ක්‍රියාත්මක වී නොමැති බව ගොනුව පරීක්ෂාවේදී නිරීක්ෂණය වේ.ඊට අදාළ ඉදිරි පියවර පුද්ගලික ලිපිගොනුවෙන් සිදුකරමින් පවතී.<br><br>සේ.අ.අංක 1391 හිමි නිළධාරියාගේ 2014 වර්ෂයේ ලබාගත් නිවාඩු දින 102 ක් සඳහා රු.104,754/-ක් නැවත අයකර ගෙන ඇති අතර, 2014 වර්ෂයේ මොහු විසින් ලබාගෙන ඇති පෙර දින රාජකාරියට වාර්තා නොකර පසුදින සිට ලබාගත් රාජකාරී නිවාඩු සහ වැටුප් රහිත දිනයන්ට අදාළ සෙනසුරාදා ,ඉරිදා සහ නිවාඩු දිනයන් වැටුප් රහිත සේ සලකා කටයුතුකර ඔහුගේ පාරිතෝෂික මුදලින් අයකර ගැනීමට කටයුතු කර ඇත. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ ආයතන සංග්‍රහයේ XII පරිච්ඡේදයේ 22.1 වගන්තිය හා 22.3 වගන්තිය. | ජාතික තරුණ සේවා සභාවේ කාර්ය මණ්ඩලයේ වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමේදී දෙපාර්තමේන්තු ප්‍රධානියා ලවා අනුමත කරවාගෙන නොතිබූ අතර, වැටුප් රහිත නිවාඩු කාලයක් අතරට වැටෙන සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දින වැටුප් රහිත නිවාඩු ලෙස සලකා කටයුතු කර නොතිබුණි.<br>විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, 2017 දෙසැම්බර් 27 දිනට එසේ සාවද්‍ය ලෙස ගණනය කරන ලද 2015 වර්ෂය සඳහා නිලධාරීන් 38 | 2015 /2016 වර්ෂයන්හි වැටුප් රහිත නිවාඩු වලට අදාළව සෙනසුරාදා,ඉරිදා හා රාජකාරි නිවාඩු ගණනය කිරීම් සිදුකරමින් පවතී. කඩනමින් අදාළ රාජකාරිය නිමකර ප්‍රගතිය දැන්වීමට කටයුතු කරමි. |

| | | |
|---|---|---|
| | දෙනෙකුට අදාල වැටුප් රහිත නිවාඩු දින 1062 ½ ක් හා 2016 වර්ෂය සඳහා නිලධාරීන් 47 දෙනෙකුට අදාල වැටුප් රහිත නිවාඩු දින 1250 ක් සඳහා පිළිවෙලින් රු. 352,747 ක් හා රු. 1,175,260 ක් ලෙස එකතුව රු. 1,528,007 ක් තවදුරටත් අයකර ගත යුතුව තිබුණි. | |
| 3. | මූල්‍ය සමාලෝචනය | |
| 3.1 | මූල්‍ය ප්‍රතිඵල | |
| | සමාලෝචිත වර්ෂයේ සභාවේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 292,520,000 ක ඌනතාවක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 269,787,000 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 22,733,000 ක පිරිහීමක් පෙන්නුම් කර තිබුණි. වර්ෂයේ මුළු ආදායම රු. 490,649,000 කින් වැඩිවී තිබුණද මෙහෙයුම් වියදම රු. 51,557,000 කින්ද තරුණ සංවර්ධන වියදම රු. 461,825,000 කින්ද වැඩිවීම ඉහත පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි. | |
| 4 | මෙහෙයුම් සමාලෝචනය | |
| 4.1 | කාර්ය සාධනය | |
| | | |

| | | |
|---|---|---|
| | ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය<br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| (අ) | 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පනතේ 4 වන වගන්තියේ සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා 2017 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද වැඩසටහන් සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| (i). | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ක්‍රියාත්මක කිරීම අතහැර දැමූ වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ. | |

| සැලසුම් කරන ලද වැඩසටහන | ඉලක්කය | ප්‍රතිපාදනය රු.මි | |
|---|---|---|---|
| යෞවන සමාජ සාමාජිකයන්ගේ ඉංග්‍රීසි භාෂා පුහුණුව | වැඩසටහන් 49<br>ප්‍රතිලාභීන් 1935 | 3.5 | 2017 වර්ෂයේ විදේශ සංචිතය සඳහා 104 දෙනෙකු තෝරාගැනීමට යෝජිත වුවද , 2017 වර්ෂයේ විදේශ සංචිතය සඳහා එක් දිස්ත්‍රික්කයකින් 08 දෙනෙකු බැගින් තෝරාගෙන 208 කු පමණ විදේශගත කරවීමට කටයුතු කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්තුමා උපදෙස් දෙන ලදී.<br>ඒ අනුව එම වැඩසටහන යටතේ වර්ෂය මුල වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවූ නිසා හා 2017 ක්‍රියාත්මක කිරීමට යෝජිතව පැවති ENGLISHLANGUAGE TRAINING<br><br>PROGRAMME<br>FOR YOUTH CLUB MEMBERS වැඩසටහන යටතේ දිසත්‍රික් මට්ටමින් ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමට අපේක්ෂිත තරුණ පිරිස සංචිතයේ ඇතුලත් වන බැවින් එම වැඩසටහන ක්‍රියාත්මක නොකොට, ඒ සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන වලින් කොටසක් ගෙන සමස්ත සංචිතයේ |

| | | | |
|---|---|---|---|
| | | | 208 දෙනාට බටංගල පුහුණු මධ්‍යස්ථානයේ කණ්ඩායම් දෙකක් යටතේ පැය 150 කුට ඉංග්‍රීසි භාෂා පාඨමාලාවක් ක්‍රියාත්මක කරන ලදී.<br>ENGLISH LANGUAGE TRAINING PROGRAMME FOR YOUTH CLUB MEMBERS වැඩසටහන යටතේ වෙන්කරන ලද ප්‍රතිපාදන වලින් ඉතිරි ප්‍රතිපාදන එම වර්ෂයේ ක්‍රියාතමක කල වෙනත් වැඩසටහන් සඳහා මාරු පත්‍ර මගින් මාරු වැයදරනලද බවද දන්වමි. |
| බහුවිධ තොරතුරු තාක්ෂණ උපකරණ ලබා ගැනීම | වැඩසටහන් 01<br>ප්‍රතිලාභීන් 360 | 27 | යෞවන සමාජ සමාජික සාමාජිකාවන්ට ප්‍රාදේශිය මට්ටමින් සංවිධානය කරනු ලබන යොවුන් කඳවුරු, පුහුණු වැඩමුළු වැනි වැඩසටහන් වලදී ප්‍රයෝජනය සඳහා බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර 360 ක් ලබා දීමට සැලසුම් කල අතර, ඒ සඳහා ප්‍රතිපාදන ලෙස රුපියල් මිලියන 27 ක් වෙන් කර තිබුනි.<br>බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් තරුණ සේවා නිළධාරී මගින් යෞවන සමාජ ප්‍රාදේශී මණ්ඩල වලට ලබා දීමට සැලසුම් කලද, මෙම උපකරණ වල ආරක්ෂාව පිළිබඳ පහත සඳහන් ගැටළු ඇති විය.<br><br>1. මෙම උපකරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් රඳවා තැබීමට ආරක්ෂිත ස්ථාන (ගබඩා පහසුකම්) නොමැති වීම.<br>2. ප්‍රාදේශිය මණ්ඩල සඳහා ස්ථිර කාර්යාල හෝ මධ්‍යස්ථාන පහසුකම් නොමැතිකම නිසා උපකරණ වලට ආරක්ෂාවක් නොමැති කම.<br>ඉහත කරුණු සැලකිල්ලට ගෙන බහු මාධ්‍ය ප්‍රක්ෂේපන යන්ත්‍ර ලබා ගැනීම තාවකාලිකව නතර කිරීමට සිදු වූ බව සඳහන් කරමි. |

| | | | |
|---|---|---|---|
| වාවසායකත්ව සංවර්ධන වැඩසටහන් - වෘත්තීය තාක්ෂණික විද්‍යාල | පාසල් 02<br>ප්‍රතිලාභීන් 150 | 0.5 | 2017 වර්ෂයේ ව්‍යාපාර තාක්ෂණ පාසල ක්‍රියාත්මක කිරිම සඳහා රු:500,000.00 ක මුදලක් වෙන් කරන ලදි. මෙම පාඨමාලාව පිළිබඳ දැනුම හා ව්‍යවසායකත්ව පුහුණුව ලබා ඇති සම්පත්ධාරින් විසින් සති අන්ත දිනවලදි දින 08 ක් වනසේ පෙ.ව.9.00 සිට ප.ව.4.00 දක්වා පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදි.<br><br>මෙම ව්‍යාපාර තාක්ෂණ පාසලේ මුලීක අරමුණ වනුයේ ව්‍යාපාරවල නිරතවීමට අදහස් කරන තරුණ ව්‍යාපාරිකයින්, දැනට ව්‍යාපාරවල යෙදෙන හා වෘත්තීය පුහුණු ආයතනවල සිසුන් සඳහා ව්‍යාපාරයක් වඩා ඵලදායි ලෙස පවත්වාගෙන යාමට සහායවීම හා අවශ්‍ය පුහුණුව ලබාදිමයි. මේ දැනුම ලබා ගැනිමට කැමති . අප අංශය මඟින් දින 05 නේවාසිකව පවත්වන ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහනට සහභාගාවීමට නොහැකි ඕනෑම තරුණයකුට හා තරුණියකට පාඨමාලා ගාස්තු වශයෙන් රු: 5,000/= ක මුදලක් ගෙවා ඇතුලත්විය හැකි බව විස්තර ඇතුලත් කර රු: 1,454,417.50 ක මුදලක් වැය කර සිළුමිණ හා වීරකේසරි පුවත්පත්වල දැන්වීමක් පල කරන ලදි.<br>එම පාඨමාලාව සඳහා අයදුම්පත් කිහිපයක් පමණක් ලැබි තිබු බැවින්, වැඩසටහන ක්‍රියාත්මක කිරිමට නොලැබුනි.<br><br>ඉහත රු: 633,549.00 ක ප්‍රතිපදන ඉතුරුවීමට හේතුවුයේ ව්‍යාපාර තාක්ෂණ පාසල නොපැවැත්විම හා දිස්ත්‍රික් වැඩසටහන් වලින් ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහනේ මහනුවර පැවැත්වීමට සැළසුම් කරන ලද |

| | | | |
|---|---|---|---|
| | | | වැඩසටහන නොපැවැත්වීමත්, නිස්කෝ ප්‍රගති සමාලෝචන වැඩසටහන් 02 ක් පැවැත්වීමට ප්‍රතිපාදන වෙන් කර තිබු අතර, ඉන් එක් වැඩසටහනක් පමණක් පැවැත්වීම හේතුවෙනි.<br><br>2017 වර්ෂයේ සැළසුමට අනුව සියළු වැඩසටහන් ක්‍රියාත්මක කර නැවත ඉතිරි වු ප්‍රතිපාදන මාරු පත්‍රයක් මඟින් මාරු කර සැළස්මට අමතරව ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් 08 ක් දිස්ත්‍රික්කවල පවත්වන ලදි. |
| 17 වන ජාතික තරුණ සන්ධාන පුහුණුව (17 TH National Youth Federation Training) | වැඩසටහන් 01<br>ප්‍රතිලාභීන් 52 | - | 2017 වර්ෂයේ ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයේ නිල කාලය මැයි මසින් අවසන් වීමට නියමිතව තිබිණි.<br><br>එහෙත් ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයේ/ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ හා එවකට සැලසුම් කර තිබූ වැඩසටහන් නියාමනය කිරීමට ජාතික සම්මේලනයේ තරුණයන්ට අවස්ථාව ලබා දිය යුතු බැවින් ජාතික සම්මේලනයේ නිල කාලය 2017 දෙසැම්බර් දක්වා දීර්ඝ කරන ලදී.<br><br>මේ නිසා නව ජාතික මණ්ඩල නියෝජිතයන් පත් නොකළ බැවින් පුහුණු කිරීමක් ලබා දීමට අවශ්‍ය නොවිණි. |

| | | | |
|---|---|---|---|
| | | | |

(ii). ක්‍රියාකාරී සැලැස්ම අනුව සැලසුම් කරන ලද පහත සඳහන් වැඩසටහන් 2 ක් සඳහා වෙන් කරන ලද මුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අපේක්ෂිත ඉලක්කයට ළඟා වීමට නොහැකි වී තිබුණි.

| සැලසුම් කරන ලද වැඩසටහන | වෙන් කරන ලද මුදල - රු.මි | |
|---|---|---|
| යෞවන සමාජ බලාත්මක කිරීම සඳහා ක්‍රීඩා භාණ්ඩ සැපයීම. | 2.00 | 2017 වර්ෂයේදී වාර්ෂික සැලැස්මට අනුව ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ මිළදී ගැනීම වෙනුවෙන් රු.මි.2.00 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන්කර තිබූ අතර, ජාතික යෞවන ක්‍රීඩා උළෙල පැවැත්වීම සඳහා දිස්ත්‍රික් තරඟාවලි පැවැත්වීමේදී අත්‍යාවශ්‍ය සාධකයක් වූ කඩුලු 90 ක් මිළදී ගැනීම සඳහා දීර්ඝ කාලීන ආයෝජනයක් සිදුකරමින් මෙම පතිපාදන උපයෝගී කෙට ගනිමින් ක්‍රීඩා භාන්ඩ මිළදී ගන්නා ලදී.<br><br>එසේම 2017 වර්ෂයේ ජාතික යෞවන ක්‍රීඩා උළෙල සඳහා වූ අමතර ප්‍රතිපාදන අවශ්‍ය වීම හේතුවෙන් ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම සඳහා වූ ප්‍රතිපාදන වල ඉතිරිය මාරු පත්‍රයක් මගින් යෞවන ක්‍රීඩා උළෙලට වෙන්කරන ලදී. |
| තරුණයන් සඳහා ආධුනිකත්ව පුහුණුව - තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසමෙහි තත්ත්ව කළමනාකරණ පද්ධති නියෝග අනුව තත්ත්ව කළමනාකරණ පද්ධතියේ තහවුරුව මගින් ප්‍රමාණනය කිරීම. | 3.00 | කාර්මික හා වෘත්තීය පුහුණු අංශය වෙත 2017 වසරේ වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා පරිපාලන කටයුතු, මෙහෙයුම් කටයුතු හා ප්‍රතීතන කටයුතු සඳහා ප්‍රතිපාදන යොදා ගෙන ඇත. |

| | | |
|---|---|---|
| | | |

(iii).

සභාවෙහි සංවර්ධන සැලැස්මට අනුව ක්‍රියාත්මක කළ වැඩසටහන් බොහොමයකින් අපේක්ෂිත ඉලක්කයට ළඟාවී තිබුණද පහත වැඩසටහන් අපේක්ෂිත පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි.

| | වැඩසටහන | වැඩසටහන් සංඛ්‍යාව | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | |
|---|---|---|---|---|---|---|
| | | ඉලක්ක | තත්‍ය | ඉලක්ක | තත්‍ය | |
| 01 | නිලධාරීන්ගේ විදේශ පුහුණු වැඩසටහන් - ජාත්‍යන්තර යෞවන සම්මන්ත්‍රණ, වැඩමුළු, | 07 | 04 | 28 | 17 | ජාත්‍යන්තර තරුණ සම්බන්ධතා අංශයේ 2017 ක්‍රියාත්මක සැලැස්මට අනුව, යෝජිත Officers Oversees Training Programme වැඩසටහනේ ප්‍රගතිය වැරදි ලෙස යතුරු ලියනය වී ඇති අතර, එම වැඩසටහනේ ප්‍රගතිය Sri Lankan Youth Actively Contribute at Regional Work Shop/ Youth Forums & Meeting වැඩසටහන යටතේ යතුරු ලියනය වී ඇත. ඒ අනුව එය නිවැරදි වියයුතු බව කාරුණිකව සඳහන් කරමි. |
| 02 | 2017 HOPE වැඩසටහන ස්ථාපිත කිරීම හා යෞවන සමාජ ප්‍රතිසංවිධානය කිරීම. | 12,600 | 12,133 | 405,000 | 291,625 | 2017 වර්ෂයේ සිට පාසැල්/ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ආශ්‍රිතව යෞවන සමාජ පිහිටුවීම ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයේ ජාතික මණ්ඩල රැස්වීමකදී ගරු සභාපතිතුමා වෙත කරන ලද යෝජනාවක් අනුව නතර කරන ලදී. ඒ වන විට වාර්ෂික ඉලක්කයන් ඇතුලත් කර වාර්තා සකසා තිබුනි. මෙකී තත්වය මත යෞවන සමාජ ප්‍රමාණාත්මකව අඩු විය. ඒ අනුව අදාල ඉලක්කයන් ලගා කර ගැනීමට නොහැකි වූ අතර යෞවන සමාජ ප්‍රමාණාය සහ යෞවන සමාජ සමාජික සංඛ්‍යාව, සංඛ්‍යාත්මකය අඩු විමට එකී තත්වය හේතුකාරක විය. එසේ නමුදු 2017.11.30 වන විට යෞවන සමාජ 12178 හා සාමාජිකත්වය 337875 දක්වා වර්ධනය වී ඇත. |
| 03 | පාසල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 168 | 63 | 16,800 | 6,794 | මෙම වැඩසටහන් ස්වේච්ඡා පදනම මත සංවිධානය කල වැඩසටහන් |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | මෙහෙයවීම. | | | | | බැවින් වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සදහා ජාතික තරුණ සේවා සභාව මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර නොමැත.<br><br>තවද ජාතික තරුණ සේවා සභාවේ ප්‍රධාන වැඩසටහන් සංවිධානය කිරිමේදී ( උදා:- යොවුන් පුරය, ජාතික ක්‍රීඩා, යොවුන් කඳවුරු ආදිය) වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන භාර උක්ත ස්වේච්ඡා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකිම දරන නිලධාරින් එම ජාතික වැඩසටහන් වලද රාජකාරි ඉටු කිරිම සදහා යොදවන අතර එම ජාතික වැඩසටහන් සාර්ථක කර ගැනිම පිණිස කටයුතු කිරීමේදී ස්වේච්ඡා වැඩසටහන් ප්‍රමාණාත්මකව අඩුවෙන් ක්‍රියාත්මක විම මත අදාල ඉලක්කයන් ලගා කරගෙන නොමැති බව නිරීක්ෂණ කරමි.<br>දිස්ත්‍රික්ක වල වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථානභාරව කටයුතු කරන නිලධාරින් එම වගකීම් දරන අතරතුරම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසභාර තරුණ නිලධාරී ලෙස හෝ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වල හෝ මධ්‍යස්ථාන භාර නිලධාරින් ලෙස හෝ කටයුතු කරති. එහිදී ස්වේච්ඡා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සදහා ප්‍රමාණවත් කාලයක් නොමැති බැවින් ද එම ස්වේච්ඡා වැඩසටහන් වල ප්‍රගතිය අඩු වී ඇති බව නිරීක්ෂණය කරමි. |
| 04 | පාසල් හැර ගිය ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙයවීම. | 231 | 112 | 11,550 | 8,381 | මෙම වැඩසටහන් ස්වේච්ඡා පදනම මත සංවිධානය කල වැඩසටහන් බැවින් වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සදහා ජාතික තරුණ සේවා සභාව<br><br>මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර නොමැත. තවද ජාතික තරුණ සේවා සභාවේ ප්‍රධාන<br>වැඩසටහන් සංවිධානය කිරිමේදී ( උදා:- යොවුන් පුරය, ජාතික ක්‍රීඩා, යොවුන් කඳවුරු ආදිය) වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන භාර උක්ත ස්වේච්ඡා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ වගකිම දරන නිලධාරින් එම ජාතික වැඩසටහන් |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| | | | | | | වලද රාජකාරි ඉටු කිරිම සඳහා යොදවන අතර එම ජාතික වැඩසටහන් සාර්ථක කර ගැනිම පිණිස කටයුතු කිරීමේදී ස්වේච්ඡා වැඩසටහන් ප්‍රමාණාත්මකව අඩුවෙන් ක්‍රියාත්මක විම මත අදාල ඉලක්කයන් ලගා කරගෙන නොමැති බව නිරීක්ෂණ කරමි.<br><br>දිස්ත්‍රික්ක වල වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථානභාරව කටයුතු කරන නිලධාරින් එම වගකීම් දරන අතරතුරම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසභාර තරුණ නිලධාරී ලෙස හෝ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන වල හෝ මධ්‍යස්ථාන භාර නිලධාරින් ලෙස හෝ කටයුතු කරති. එහිදී ස්වේච්ඡා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් නොමැති බැවින් ද එම ස්වේච්ඡා වැඩසටහන් වල ප්‍රගතිය අඩු වී ඇති බව නිරීක්ෂණය කරමි. |
| 05 | තරුණයන් සඳහා "ජීවන ඉලක්ක ජයගැනීම" උපදේශනාත්මක දැනුවත් කිරීමේ වැඩසටහන්. | 24 | 310 | 1,200 | 617 | ජීවන ඉලක්ක සපුරා ගැනීමේ වාර්ෂික ඉලක්ක වැඩසටහන් 24 ක් වුවද හම්බන්තොට දිස්ත්‍රික්කයේ උපදේශන නිලධාරිනියගේ හදිසි අභාවය නිසා වෙන් කල වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. මේ අනුව ක්‍රියාත්මක වැඩසටහන් ප්‍රමාණය 20 කි.<br>එහෙත් 2017 දෙසැම්බර් මස අග වන විට ක්‍රියාත්මක කර ඇති වැඩසටහන්වල සමස්ථ ප්‍රගතිය ලබා ගත් අතර ඒ අනුව සම්පූර්ණ සහභාගිත්වය 1384 කි. |
| (ආ) | 2017 වර්ෂයේ ආදායම් ප්‍රවර්ධනය හා ගොවිපල සංවර්ධන කටයුතුවලට වෙන් කළ වාර්ෂික ප්‍රතිපාදනය වූ රු. මිලියන 23.76 න් සියයට 60 ක් එනම් රු. මිලියන 14.25 ක් අදාල සංවර්ධන කටයුතු සඳහා යොදවා නොතිබුණු අතර විගණනයට ලබා දුන් තොරතුරු අනුව ගොවිපල 13 ක 2018 මැයි 23 දින වන විට වගා කළ හැකි අක්කර 406.5 ක් වූ භූමි ප්‍රමාණයෙන් ආසන්න වශයෙන් අක්කර 230.5 ක් හෙවත් සියයට 56.7 ක් වගා කිරීම සඳහා යොදාගෙන නොතිබුණි. | | | | | 2017 වර්ෂයේ ආදායම් ප්‍රවර්ධන හා ගොවිපල සංවර්ධන අංශය වෙත වෙන් කළ රු මිලියන 23.76 න් රු මිලියන 9.51 ක් වැය දරා ඇති බව 2017 ගිණුම් අංශයේ මූල්‍ය ප්‍රකාශනයේ අයවැය විචලාතාවය යටතේ පෙන්නුම් කළද එම වියදමට ගොවිපල කාරක ගිණුම්වල වියදම් එකතු කර නොමැත.<br>ගොවිපල කාරක ගිණුම අනුව ගොවිපල සංවර්ධන වියදම යටතේ රු මිලියන 12.64 ක් 2017 වර්ෂයේදී වැය දරා ඇත.ඒ අනුව වැය දරා ඇති මුළු මුදල රු මිලියන 9.509 +12.640 =22.140 වේ.<br>ඒ අනුව සංවර්ධන කටයුතු සඳහා යොදවා නොතිබුණ ප්‍රතිපාදන 60 % ක් වීම සාවද්‍ය ප්‍රකාශයක් වන අතර මෙය මූල්‍ය ප්‍රකාශනයේ දෝශ සහිත |

| | | |
|---|---|---|
| | | වීම නිසා තොරතුරුවල නිරවද්‍යතාවයක් නොමැති බව පෙනී යයි.<br><br>ගොවිපල 13 ක 2018 මැයි 23 දින වන විට වගා කළ හැකි අක්කර 406 ක් ලෙස වාර්තා වන නමුත් එම මුළු ඉඩම් ප්‍රමාණය තුළ පිහිටා ඇති මොරවැව (අක්කර 4) නිලාවැලි (අක්කර 200) නිත්‍යානුකූලව පවරා ගැනීම් කටයුතු සිදුකරමින් පවතින අතර ඉඩම් පවරා ගැනීමේදී අදාල ආයතන වල ප්‍රමාදයන් හේතුවෙන් තවමත් පවරාගෙන නොමැත.එම හේතුව නිසා අක්කර 204 ක් වගා නොකළ ඉඩම් ලෙස ගණනය කළ නොහැකි බැව් කාරුණිකව සඳහන් කරමි.නුවරඑළිය බඳු දීමට තීරණය කර ඇති බැවින් තාවකාලිකව වගා කටයුතු නවතා ඇත.<br><br>දොළුව ගොවිපල මෙම වසරේදී ආරම්භ කල බැවින් මූලික බිම් සකස් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.<br><br>තවද ඇතුන්ගම පුහුණු මධ්‍යස්ථානය අයත් අනුරාධපුර දිස්ත්‍රික්කයට වසර කිහිපයක සිට දැඩි නියඟය පැවති බැවින් වගා කිරීමේ කටයුතු වලින් පාඩු සිදුවන නිසා කාලීන බෝග වගා කටයුතු තාවකාලිකව නතර කර ඇත.ස්ථිර බෝග හා සත්ව පාලන කටයුතු පමණක් සිදු කරනු ලබයි.<br><br>අංශයේ ප්‍රධාන අරමුණ වන තරුණ තරුණියන්ට කෘෂි කාර්මික දැනුම ලබා දීමේ මූලිකත්වය ඇතිව NVQ පාඨමාලා පවත්වාගෙන යාම මෙම ගොවිපල 10 ක් (එරමිණියාය,<br><br>පන්නල , බටංගල, පුනගරී, අක්මීමන, දොළුව, දඹුල්ල,ලෙව්වේගොඩ, මොණරාගල, ඇතුන්ගම ) ආශ්‍රීතව සිදු කෙරේ.<br><br>ගොවිපල සඳහා කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම හා කෘෂි යන්ත්‍රෝපකරණ හිඟ වීම යන කරුණු ගොවිපල සංවර්ධනය අඩාල වීම සඳහා බලපාන ලදී.ඒ අනුව වගා කල හැකි අක්කර ප්‍රමාණය වූ අක්කර 200 |

<table>
<tr><td></td><td colspan="2"></td><td>න් අක්කර 176 ක් වගා කර ඇති බැවින් වගා කිරීම සඳහා මෙතෙක් යොදවා ගෙන නොමැති ප්‍රමාණය 12% ක් බව කාරුණිකව දන්වමි.</td></tr>
<tr><td>4.2</td><td colspan="2">කළමනාකරණ ක්‍රියාකාරකම්<br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.</td><td></td></tr>
<tr><td>(අ)</td><td colspan="2">සභාව විසින් පවත්වාගෙන යනු ලබන නිස්කෝ වීඩියෝ චිත්‍රාගාරය නඩත්තු කිරීම සහ නිස්කෝ වීඩියෝ අංශය මගින් මෙහෙයවන රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන ශිල්පක්‍රම හා වීඩියෝ තාක්ෂණ පාඨමාලාවේ විෂය නිර්දේශයේ ඇතුළත් විෂයය මොඩියුල සඳහා අත්‍යවශ්‍ය ඇතැම් ඉගෙනුම් උපකරණ හා නිස්කෝ වීඩියෝ අංශයට අවශ්‍ය කැමරා උපකරණ ලබාදෙන ලෙස එම අංශයේ සහකාර අධ්‍යක්ෂ වරයා විසින් අවස්ථා කිහිපයකදී ඉල්ලීම් කර<br>තිබුණද, එම අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට කළමනාකරණය අපොහොසත් වී තිබුණි. විස්තර පහත දැක්වේ.</td><td></td></tr>
<tr><td></td><td>ඉල්ලුම් කරන ලද දිනය</td><td>විස්තරය</td><td></td></tr>
<tr><td></td><td>2015.06.15</td><td>2015 සංවර්ධන සැලැස්මට අනුව, වීඩියෝ අංශයට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම.</td><td rowspan="9">මේ වන විට මෙම භාණ්ඩ මිළදී ගැනීම සඳහා අවශ්‍ය පිරිවිතර අනුව මිළ ගණන් කැඳවා ප්‍රසම්පාදන ක්‍රමවේදය යටතේ මිලදී ගැනීමේ කටයුතු සිදුකරමින් පවතින බැවින් මෙම වසර අවසාන වන විට අදාළ උපකරණ ලබාගැනීමේ හැකියාව ඇත.<br><br>මිලදී ගැනීමට අදාළ විස්තර ඇතුලත් ලේඛණ ඇත.</td></tr>
<tr><td></td><td>2017.06.12</td><td>නිස්කෝ වීඩියෝ අංශය සඳහා කැමරා උපකරණ මිලදී ගැනීම.</td></tr>
<tr><td></td><td>2017.06.27</td><td>නිස්කෝ වීඩියෝ අංශය සඳහා පරිගණක උකරණ මිලදී ගැනීම.</td></tr>
<tr><td></td><td>2017</td><td>පාඨමාලාවේ ප්‍රායෝගික අභ්‍යාස සඳහා අවශ්‍ය ශබ්දාගාර උපකරණ</td></tr>
<tr><td></td><td>2018.01.02</td><td>සංස්කරණ කට්ටලයක් ලබාගැනීම.</td></tr>
<tr><td></td><td>2017.11.24</td><td>නිස්කෝ වීඩියෝ අංශය සඳහා රූපවාහිනී යන්ත්‍රයක් ලබාගැනීම.</td></tr>
<tr><td></td><td>2017</td><td>චිත්‍රාගාර ආලෝකකරණ පද්ධතිය යාවත්කාලීන කිරීම.</td></tr>
<tr><td></td><td>2017.09.20</td><td>සංස්කරණ කට්ටලයක් ලබාගැනීම.</td></tr>
<tr><td></td><td>2017.07.07</td><td>චිත්‍රාගාරය නඩත්තු කටයුතු කිරීම.</td></tr>
<tr><td>(ආ)</td><td colspan="2">2017 වර්ෂයේදී සභාවේ අභ්‍යන්තර විගණන අංශය විසින් නිකුත් කරන ලද පරීක්ෂණ වාර්තා මඟින් අනාවරණය කර තිබූ නිරීක්ෂණ සම්බන්ධයෙන් විගණනය විසින් සිදුකළ නියැදි පරීක්ෂාවට අනුව පහත සඳහන් නිරීක්ෂණ වෙනුවෙන් 2018 ජූලි 31 දින වන විටද අදාල නිවැරදි කිරීමේ කටයුතු සිදුකර නොතිබුණි.</td><td></td></tr>
</table>

| | | |
|---|---|---|
| | | |
| (i) | ශ්‍රී ලංකා යූත් නිවාස ව්‍යාපෘතිය 2012 යටතේ නිකුත් කර තිබූ අංක තසංසං/2-11/12/18 දරන 2012 මාර්තු 08 දිනැති හා 2012 දෙසැම්බර් 02 දිනැති චක්‍රලේඛවලට අනුව පළමු හා දෙවන ස්ථාන ලද යෞවන සමාජ ප්‍රාදේශීය මණ්ඩලවලට හා මෙහෙයවීම් කළ තරුණ සේවා නිලධාරීන්ට ලබාදිය යුතුව තිබූ රු. 137,500 ක් වටිනා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ගෙවීමට කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ලංකා යූත් නිවාස ව්‍යාපෘතිය 2012 යටතේ ගම්පහ දිස්ත්‍රික්කයේ ජයග්‍රහණය කරන නිවාසවලට අදාලව<br>ත්‍යාග මුදල් නොදීම සම්බන්ධව විගණනයට භාජනය කර 2017.10.10 දින වාර්තාවක් ඉදිරිපත් කර ඇත. එම වාර්තාවට අනුව අදාළ නිලධාරීන්ගෙන් කරුණු විමසූ අතර ඒ සඳහා පිළිතුරු 2018.08.07 වන විට ලැබී ඇත. වරස 05 ක පැරණි ගෙවීමක් බැවින් සභා අධ්‍යක්ෂ මණ්ඩලයේ හා අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය ලබාගෙන ගෙවීම් කිරීමට හැකිවේ. |
| (ii) | ජාතික තරුණ සේවා සභාවේ මාතලේ දිස්ත්‍රික් කාර්යාලයට අයත්, ඇලෙක් අළුවිහාර පෙදෙස, මාතලේහි පිහිටා ඇති ගොඩනැගිල්ලේ නේවාසිකව සිටින නිලධාරීන්ගෙන් ආර්ථික කුලියක් අයකරගත හැකිව තිබියදී ඒ සඳහා කටයුතු කර නොතිබුණි. | 2018 වර්ෂයේ පාලන අංශයේ මූලා ප්‍රතිපාදන වැය දැරීම කාර්යාල නියෝගය -01/2018 මඟින් ආර්ථික කුලී අය කිරීම සම්බන්ධයෙන් පළාත් අධ්‍යක්ෂවරුන් දැනුවත් කර ඇත. ඒ අනුව ආර්ථික කුලිය අයකිරීම මේ වන විට සිදුවෙමින් පවතී.<br>මෙම සභාවේ මාතලේ දිස්ත්‍රික් කාර්යාලයට අයත් කාර්ය මණ්ඩලයේ ආර්ථික කුලී අයකර ගැනීමට පළාත් අධ්‍යක්ෂ (මධ්‍යම) වෙත ආර්ථික කුලී වහාම අයකර ගන්නා ලෙස දන්වා ලිපියක් යොමුකර ඇත. |
| 4.3 | මෙහෙයුම් අකාර්යක්ෂමතා<br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| (අ) | ඉඩම් අංශය විසින් විගණනය වෙත ලබා දුන් තොරතුරු අනුව, 2017 දෙසැම්බර් 31 දින වන විට සභාව විසින් භුක්ති විඳිනු ලබන ඉඩම් 59 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීම සඳහා අපොහොසත් වී තිබුණි. මෙම ඉඩම් තුළ, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් 07 ක් ද මහවැලි අධිකාරියට අයත් | සවිස්තරාත්මක වාර්තාව මගින් දැක්වේ. |

<table>
<tr><td></td><td>ඉඩම් 05 ක් ද දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් 03 ක් ද වශයෙන් පවතින බව නිරීක්ෂණය විය.<br>දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් පොල්ගහවෙල පුහුණු මධ්‍යස්ථානය පවත්වාගෙන යනු ලබන ඉඩම සහ බොරැල්ල පිහිටි ඉඩම පිළිවෙලින් අවුරුදු 32 ක් සහ අවු 30 කට අධික කාලයක සිට සභාව විසින් භුක්ති විඳිමින් සිටියද ඒවායේ නීත්‍යානුකූල අයිතිය නිරවුල් කර ගැනීමට නොහැකිව තිබුණි.</td><td></td></tr>
<tr><td>(ආ)</td><td>නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන</td><td></td></tr>
<tr><td>(i)</td><td>ජාතික තරුණ සේවා සභාවේ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් අංක 3.2.1 යටතේ වාර්ෂිකව ශ්‍රම වෙළඳපල ඉල්ලුමට සරිලන නව පුහුණු වැඩසටහන් ආරම්භ කර පවත්වාගෙන යාමට හා එම පුහුණු වැඩසටහන් සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය ඉහළ දැමීමට සැලසුම් කර තිබුණි. 2017 වර්ෂය සඳහා සභාව විසින් පිළියෙළ කළ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ද ඉහත ක්‍රියාකාරකම ඇතුළත් කර තිබූ නමුත් 2017 වර්ෂය තුළදී සභාවේ එකදු පුහුණු මධ්‍යස්ථානයක හෝ නව පුහුණු පාඨමාලා හඳුන්වා දී නොතිබුණි.</td><td>රැකියා ශ්‍රම වෙළඳපොල ඉල්ලුම මෙන්ම කාලීන අවශ්‍යතාවන් හඳුනාගෙන සභාවේ වෘත්තීය ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන් ව්‍යාප්ත කිරීම සහ නව පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීම සඳහා සභාවේ සංයුක්ත සැලැස්මට අනුව මහා භාණ්ඩාගාරය වෙත හා නිපුණතා හා ආංශික සංවර්ධන වැඩසටහන් වෙත සැළසුම් පහත සඳහන් පරිදි ඉදිරිපත් කරන ලදී.<br><br>නමුත් වැඩසටහන් සඳහා පහත සඳහන් ප්‍රතිපාදන 2017 වර්ෂය සඳහා ජාතික තරුණ සේවා සභාව වෙත ලබා දෙන ලදී.<br><br><table><tr><th>මූල්‍ය ප්‍රභවය</th><th>වර්ෂය</th><th>ලබාදෙන ලද ප්‍රතිපාදන</th></tr><tr><td>01.භාණ්ඩාගාර ප්‍රතිපාදන</td><td>2017</td><td>මිලියන 53</td></tr></table></td></tr>
</table>

| | | |
|---|---|---|
| 02.නිපුණතා ආංශික සංවර්ධන ඩසටහන (SSDP) | 2017 | මිලියන 88 |

| **මූල්‍ය ප්‍රභවය** | **වර්ෂය** | **ඉල්ලුම් කල ප්‍රතිපාදන** |
|---|---|---|
| 01.භාණ්ඩාගාර ප්‍රතිපාදන | 2017 | මිලියන 120 |
| 02.නිපුණතා ආංශික සංවර්ධන ඩසටහන (SSDP) | 2017 | මිලියන 751.76 |

ඒ අනුව අපේක්ෂිත සැළසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නොලැබීම මත සංයුක්ත සැළැස්මේ සඳහන් ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වී ඇත.

එසේ වුව ද සභාව වෙත ලැබුණු ප්‍රතිපාදන කළමනාකරණය කිරීමේ සහ ILO සංවිධානය මඟින් බාහිර මූල්‍යාධාර ලබා ගෙන පහත සඳහන් පරිදි පාඨමාලා ක්‍රියාත්මක කර ඇත. එසේම 2017 වර්ෂයේ දී දෙහිඅත්තකණ්ඩිය පුහුණු මධ්‍යස්ථාන නව පුහුණු

මධ්‍යස්ථානයක් ලෙස ආරම්භ කර ඇත. එමෙන් ම සභාව මඟින් ඉදිකරන රිකිල්ලගස්කඩ යොවුන් සවිබලකරන මධ්‍යස්ථානය යොවුන් සේනාංකය නමින් භාවිත කරමින් තිබූ අතර 2017 වර්ෂයේ සිට මධ්‍යස්ථානයේ ගොඩනැඟිලි කිහිපයක් නැවත සභාව වෙත ලබා ගෙන රිකිල්ලගස්කඩ පුහුණු

මධ්‍යස්ථානයේ නව පහසුකම් යටතේ ආරම්භ කර ඇති අතර කන්තලේ නව පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කරන ලදී.
මීට අමතරව 2017 වර්ෂයේදී අධ්‍යක්ෂ ජනරාල් තුමාගේ විශේෂ ඉල්ලීම මත ලබාගත් ප්‍රතිපාදන තුලින් දිවයින පුරා පිහිටි පුහුණු මධ්‍යස්ථාන වල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම යටතේ නවීකරණ කටයුතු සිදුකර ඇත. ඒ අනුව පුහුණු මධ්‍යස්ථාන රාශියක පුහුණු ධාරිතාව වැඩිවන අතර නව පුහුණු පාඨමාලා ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.
මේ වන විට පානදුර හා රත්මලාන පුහුණු මධ්‍යස්ථාන නවීන තාක්ෂණ පහසුකම් යටතේ නවීකරණය කර සිසු අයිතියට
පවරා ඇත.
ඒ අනුව 2017 වර්ෂය තුල ක්‍රියාත්මක කරන ලද නව පාඨමාලා පහත සඳහන් කර ඇත.

| අනු අංකය | පුහුණු මධ්‍යස්ථානය | පාඨමාලාව |
|---|---|---|
| 01 | රිකිල්ලගස්කඩ පුහුණු මධ්‍යස්ථානය | රූපලාවන්‍ය ශිල්පී පාඨමාලාව |
| | | කේෂලාවන්‍ය ශිල්පී පාඨමාලාව |
| | | විදුලි කාර්මික ශිල්පී පාඨමාලාව |
| | | ටේලරින් පාඨමාලාව |
| | | තොරතුරු තාක්ෂණ හා සන්නිවේදන ශිල්පී |
| | | දෙමළ භාෂාව |
| | | වෘත්තීය ඉංග්‍රීසි පාඨමාලාව |
| 02 | දෙහිඅත්තකණ්ඩිය | ජලනල කාර්මික ශිල්පී පාඨමාලාව |

| | | |
|---|---|---|
| | පුහුණු මධ්‍යස් ථානය | පෙදරේරු ශිල්පී පාඨමාලාව* |
| | | දෙමළ භාෂාව |
| | | ගෘහස්ථ විදුලි රැහැන් ඇදීම |
| 03 | කන්තලේ පුහුණු මධ්‍යස් ථානය | ටේලරින් පාඨමාලාව |
| | | වෙල්ඩින් පාඨමාලාව |
| | | ඉංග්‍රිසි පාඨමාලාව |
| | | දෙමළ පාඨමාලාව |

නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන වෙත යොමුකර ඇති විගණන වාර්තාවේ යන්ත්‍ර ශිල්පි පාඨමාලාව ලෙස සටහන් කර ඇති අතර එය නිවැරදි කර පෙදරේරු ශිල්පී පාඨමාලාව ලෙස සකස්කර ඇති බව දන්වමි.

02. ජාත්‍යන්තර කම්කරු සංවිධානය (ILO) මගින් දිවයිනේ නැගෙනහිර හා වන්නි පලාත් වල තෝරාගත් පුහුණු මධ්‍යස්ථාන තුල පෙදරේරු,ජලනල කාර්මික සහ ජංගම දුරකථන අළුත්වැඩියාව පුහුණු පාඨමාලා 2017 වර්ෂයේ ක්‍රියාත්මක කළ අතර ඒ සඳහා අභ්‍යාසලාභීන් 203 බඳවාගන්නා ලදී.

පෙදරේරු, ජලනල කාර්මික සහ ජංගම දුරකථන අළුත්වැඩියාව පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කල මධ්‍යස්ථාන.

| පුහුණු මධ්‍යස්ථානය | පාඨමාලාව පෙදරේරු | ජලනල කාර්මික | ජංගම දුරකථන අළුත් වැඩියාව |
|---|---|---|---|
| පුදුකුඩිඉරිප්පු | √ | √ | - |
| වෙල්ලාවේලි | - | √ | - |
| සයින්දමරදු | - | - | √ |
| දෙහිඅත්තකණ්ඩිය | √ | | |

| | | |
|---|---|---|
| | | √ -<br>අම්පාර - √<br>√<br>සමන්තුරෙයි -<br>√ -<br>පදියතලාව(මහඔය) √<br>- √<br>වව්නියාව -<br>√ -<br>වව්නියාව (බෝගස්වැව) - √<br>-<br>මන්නාරම -<br>√ -<br>මන්නාරම (ආන්දම්කුලම) -<br>√ - |
| (ii) | ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ ජාතික තරුණ සේවා සභාව විසින් අධ්‍යයන කාර්ය මණ්ඩලයට ගෙවනු ලබන කාර්ය සාධන දීමනාව සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේදී නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර තිබූ නිර්ණායකයන් සාවද්‍ය ලෙස අර්ථකථනය කරමින් හා කාර්ය සාධනය පිළිබඳ විධිමත් අගය කිරීමකින් තොරව එම දීමනාව ගෙවා තිබූ බව නිරීක්ෂණය විය. 2017 වර්ෂය තුළදී ජාතික තරුණ සේවා සභාව විසින් කාර්ය සාධන දීමනා වශයෙන් රු. මිලියන 4.002 ක් ගෙවා තිබුණි. | (ii) නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ අධ්‍යාන කාර්ය මණ්ඩලයට සඳහා දීමනා ගෙවීමේ දී ජාතික තරුණ සේවා සභාව ඵලදායි ලෙස එම දීමනා ගෙවීම සඳහා කාර්ය සාධන ආකෘති පත්‍රයක් හඳුන්වා දුන් අතර එම ආකෘතිය මගින් නිවැරදිව එක් එක් ක්‍රියාකාරකම් ආවරනය වන සේ අධ්‍යාන කාර්ය මණ්ඩලය ඇගයීමට ලක් කරමින් නිර්නායක මත පදනම්වනිවැරදිව දීමනා ගෙවීම සිදුකර ඇති අතර නිර්නායකයන් සපුරා නොමැති අධ්‍යාන කාර්ය මණ්ඩල නිලධාරීන් සඳහා දීමනා ගෙවීම අඩු කිරීම සිදුකර ඇත.<br><br>එබැවින් ජාතික තරුණ සේවා සභාව වෙත කාර්ය සාධන දීමනා ගෙවීම සඳහා වෙන්කර ඇති මුදලින් රුපියල් මිලියන 4.002 ගෙවා ඇති අතර රුපියල් මිලියන 10.998 මුදලක් ඉතිරි කරගැනීමට හැකිවී ඇත. |
| (iii) | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අංක MSDVT/SSDP/2016 – 1 හා 2016 පෙබරවාරි 26 දිනැති, පුහුණු මධ්‍යස්ථානවල තත්ත්ව | (iii) ජාතික තරුණ සේවා සභාව විසින් 2016 වර්ෂයේදී පුහුණු මධ්‍යස්ථාන 10 ක තත්ව කළමනාකරණ පද්ධතිය |

| | | |
|---|---|---|
| | කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීම හා තත්ත්ව සංස්කෘති (culture) සංවර්ධනය කිරීමට අදාල චක්‍රලේඛය මගින් ජාතික තරුණ සේවා සභාව සඳහා 2016 වර්ෂයට අදාලව පුහුණු මධ්‍යස්ථාන 10 ක සහ 2017 වර්ෂයට අදාල වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව පුහුණු මධ්‍යස්ථාන 20 ක තත්ත්ව කළමනාකරණ පද්ධති ස්ථාපිත කර අදාල සහතික ලබා ගැනීම ඉලක්ක ගත කර තිබූ නමුත් 2018 අප්‍රේල් 30 දින වන විට සභාවට අයත් පුහුණු මධ්‍යස්ථාන 52 න් පුහුණු මධ්‍යස්ථාන 07 ක් සඳහා පමණක් තත්ත්ව කළමනාකරණ සහතික ලබාගෙන තිබුණි. තවද, 2017 වර්ෂයේදී පුහුණු මධ්‍යස්ථාන 20 ක තත්ත්ව කළමනාකරණ පද්ධති ස්ථාපිත කිරීමට සැලසුම් කර තිබූ නමුත් ඊට අදාල ප්‍රතිපාදන ලබාදී තිබුණේ පුහුණු මධ්‍යස්ථාන 10 ක් සඳහා පමණි. | ස්ථාපනය කිරීමට සැලසුම් කර තිබූ අතර මේ වන විට එම මධ්‍යස්ථාන 7 ක් සහ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් තත්ව සහතිකය ප්‍රදානය කර ඇති අතර තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචිය දෙහිවල පුහුණු මධ්‍යස්ථානය වෙත ලබා ගැනීමට ප්‍රමාද වීම හා අවශ්‍ය සංවර්ධන කටයුතු අවශ්‍ය ප්‍රතිපාදන එම මධ්‍යස්ථානයේ පාලක සභාව මගින් ප්‍රතිපාදන නිදහස් කිරීම ප්‍රමාද වීම නිසා සංවර්ධන කටයුතු ඉටුකිරීම 2018 වර්ෂය දක්වා දීර්ඝ විය. ඒ අනුව තත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීමට අදාලව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමු විගණනයේ දක්වා ඇති අපගමනයන් මේ වන විට නිවැරදි කර ඇති බැවින් 2018 සැප්තැම්බර් මසට පෙර දෙහිවල පුහුණු මධ්‍යස්ථානයට අදාල තත්ව සහතිකය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.දෙහිවල පුහුණු මධ්‍යස්ථානය, දෙහිවල නගර සභාව සමග පාලක සභාවකින් පාලනය වන බැවින් ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු ජාතික තරුණ සේවා සභාවට තනිව මැදිහත් වී සිදුකල නොහැක.<br><br>දඹුල්ල හා හලාවත යන පුහුණු මධ්‍යස්ථානයන්හි ඉදිකිරීම් කටයුතු සිදුකරනු ලබන බැවින් තත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීම ප්‍රමාදව ඇති අතර ඉදිකිරීම් කටයුතු අවසන් වූ වහාම තත්ව සහතිකය ලබා ගැනීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කර ඇත. 2017 වර්ෂයේ නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ ජාතික තරුණ සේවා සභාවේ පුහුණු මධ්‍යස්ථාන 20 ක තත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා රු. මිලියන 20 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කල අතර නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන මගින් 2017 වර්ෂය සඳහා නිදහස් කල |

| | | |
|---|---|---|
| | | ප්‍රතිපාදන ප්‍රමාණය රු. මිලියන 10 කි. එම නිසා ප්‍රගති සමාලෝචන රැස්වීමේදී එම ආයතනයට දැනුම් දී 2017 වර්ෂයේදී මධ්‍යස්ථාන 10 ක් පමණක් තත්ව කළමනාකරණ පද්ධතිය ස්ථාපනය කිරීමට සැලසුම් කර එම මධ්‍යස්ථාන සඳහා පමණක් ප්‍රතිපාදන නිදහස් කර ඇත.<br><br>එම මධ්‍යස්ථාන සඳහා තත්ව සහතිකය ලබා ගැනීමට අවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කර තත්ව සහතිකය ලබා දීමට අවශ්‍ය විගණනයන් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් සිදුකරමින් පවතින අතර 2018 සැප්තැම්බර් මස අවසන් වීමට ප්‍රථම එම මධ්‍යස්ථාන සඳහා තත්ව සහතිකය ලබා ගැනීමට සැලසුම් කර ඇත. |
| (iv) | විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම 2014 – 2020 හි ක්‍රියාකාරකම් අංක 1.4.6 යටතේ මූල්‍යමය උපකාර අවශ්‍ය සිසුන් හඳුනාගෙන එවැනි සිසුන් 100 දෙනෙකු සඳහා මාසිකව රු. 4,000 බැගින් වූ දීමනාවක් ගෙවීම සඳහා රු. 4,800,000 ක් වෙන්කර තිබුණද, 2014 – 2017 දක්වා වූ වාර්ෂික ක්‍රියාකාරී සැලසුම් සඳහා එම ක්‍රියාකාරකම ඇතුළත් කර නොතිබුණි. | 2014 – 2020 ක්‍රියාකාරී සැලැස්ම කාලයේ අප ආයතනයේ රේඛීය අමාත්‍යාංශය වූයේ යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයයි. එම අමාත්‍යාංශයේ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම තුල මූල්‍යමය උපකාර අවශ්‍ය සිසුන් හඳුනාගෙන එවැනි සිසුන් 100 දෙනෙකු සඳහා මාසිකව රු. 4,000 බැගින් වූ දීමනාවක් ගෙවීමට ප්‍රතිපාදන වෙන්කර තිබුණි. නමුත් 2015 වර්ෂයේදී අමාත්‍යාංශ මාරුවීමත් සමඟ අප ආයතනයට ප්‍රතිපාදන වෙන්කිරීමක් සිදුකර නොමැති බව පෙන්වා දෙමි. |
| (ඇ) | ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ගේ අවශ්‍යතා සඳහා මනා ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය තිරසර සංවර්ධන ප්‍රතිපත්ති සම්පාදනය කිරීමට අදාල රජයේ හැකියා ධාරිතාවය ශක්තිමත් කිරීම අරමුණු කරගෙන එක්සත් ජාතීන්ගේ ආසියානු හා පැසිපික් කලාපයේ ආර්ථික හා සාමාජයීය කොමිසමේ රු. 2,961,000 ක මූල්‍යමය ආධාර යටතේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදුකෙරේ. | |

| | | |
|---|---|---|
| (i) | ජාතික තරුණ සේවා සභාවේ තරුණ සංවිධාන සංවර්ධන අංශය මෙම වැඩසටහනට සම්බන්ධ වී තිබුණු අතර මෙම ප්‍රතිපත්තිමය උපායමාර්ග සැකසීමට අවශ්‍ය කරන සියළුම තොරතුරු සඳහා ප්‍රවිෂ්ඨ වීමේ හැකියාව පැවති අතර, ESCAP සමග පැවති සියළු වැඩසටහන්, දේශන හා සාකච්ඡා සඳහා තරුණ සංවිධාන සංවර්ධන අංශය භාර සහකාර අධ්‍යක්ෂවරයා සහ තවත් නිලධාරීන් දෙදෙනෙකු සහභාගී වී තිබුණි.<br><br>එසේ වුවද සභාව, විසින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ හවුල්කරුවකු වශයෙන් රාජ්‍ය නොවන සංවිධානයක් තෝරාගෙන තිබුණු අතර එම ආයතනය තෝරාගෙන තිබූ ආකාරය පිළිබඳ විනිවිදභාවයක් නොතිබුණි. තවද එම ආයතනයේ සඳහන් ලිපිනයේ එවැනි ආයතනයක් නොමැති බව 2017 දෙසැම්බර් 12 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී අනාවරණය විය.<br><br>එසේම මෙම ආයතනයේ ලියාපදිංචිය සනාථ කිරීම සඳහා අදාල ලියාපදිංචි සහතිකයේ මුල් පිටපත ඉදිරිපත් කරන ලෙසට 2017 දෙසැම්බර් 26 දිනැති ඊටී/2/19/332/389 දරන ලිපිය මඟින් සහකාර අධ්‍යක්ෂ (නීති විමර්ශන) විසින් ඉල්ලා තිබුණද 2018 ජුනි 30 දක්වා එය ඉදිරිපත් කිරීමට අපොහොසත් වී තිබුණි. | මෙයට අදාළ සවිස්තරාත්මක වාර්තාව ඉදිරිපත් කර ඇත. |
| (ii) | මෙම වැඩසටහනට අදාල මුළු ආධාර මුදල වූ රු. 2,961,000 න් සියයට 68 ක් එනම් රු. 2,010,000 රාජ්‍ය නොවන සංවිධානයකට ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබූ අතර, මානව කුසලතා ඵලදායිතාකරණ පදනමෙහි ඉල්ලීමකින් තොරව හා තරුණ සංවිධාන සංවර්ධන අංශ සහකාර අධ්‍යක්ෂගේ 2017 ඔක්තෝබර් 17 දිනැති ඉල්ලීම මත වවුචර් අංක 744 යටතේ 2017 ඔක්තෝබර් 20 දිනැති අංක 155198 දරන චෙක්පත මගින් රු. 1,005,000 ක අත්තිකාරම් මුදලක් මානව කුසලතා ඵලදායිතාකරණ පදනම වෙත ගෙවා තිබුණි. තවද, මෙම ගෙවීමට අදාල චෙක්පත අදාල පෞද්ගලික ආයතනය වෙත භාරදී නොතිබුණු අතර තරුණ සංවිධාන අංශය වෙත භාරදී තිබුණි. එම අංශය විසින් අදාල පෞද්ගලික ආයතනයේ බැංකු ගිණුමට මෙම චෙක්පත තැන්පත් කරන ලද බව විගණනයට අනාවරණය විය. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 5.4.4 ට අනුව වැඩ හෝ භාණ්ඩ ප්‍රසම්පාදනය සඳහා පමණක් අත්තිකාරම් ගෙවිය හැකි වුවද වැඩ හෝ ප්‍රසම්පාදනයක් නොවන සේවා ප්‍රසම්පාදනයක් වන මෙම කටයුත්ත සඳහා අත්තිකාරම් ගෙවීමත්, එය සියයට 50 ක් වැනි ඉහළ ප්‍රතිශතයක් වීමත්, ඒ වෙනුවෙන් කිසිදු අත්තිකාරම් ඇප සුරක්ෂණයක් ලබා නොගැනීමත් මතභේදාත්මක වේ. | මෙම පුහුණු මොඩියුලය සැකසීම සඳහා ඉතිරිව තිබුනේ ඉතාම කෙටි කාලයකි. ඒ අනුව, මේ සඳහා විශේෂඥ පුහුණු උපදේශකයෙක් වෙන් කරවා ගැනීම, ඒ සඳහා තාක්ෂණික සහයෝගය ලබා ගැනීම, වැඩකරන අවධියේදී සටහන් තබා ගැනීම, පරිගණක ගත කිරීම, ඒ සඳහා අවශ්‍ය සම්පත් සපයා ගැනීම, ආදිය සපුරා ගත යුතුය. ඊට අමතරව වෙනත් මාර්ගෝපදේශයන් පරිශීලනය හා අවශ්‍යතාවයන් සපුරා ගැනීම යන කරුණු අනුව මෙය වැඩ ගණයටද අයිතිය. මෙම වැඩසටහනේ සමස්ත ක්‍රියාවලිය තුළදීම හවුල්කාර සංවිධානය ලෙස FSHS ආයතනය තාක්ෂණික හා මූල්‍යමය දායකත්වය ලබා දී තිබිණි. ඊට අමතරව ESCAP ආයතනය විසින් නම්කර තිබූ නිසාත් අංක තසං.සං./2-11/17/03 හා 2018.09.25 දිනැති සභා සංදේශය |

| | | |
|---|---|---|
| | | මඟින් අනුමැතිය ලබා දී තිබූ නිසාත් විශ්වාසය තහවුරු කර ඇති බැවින් මේ කාර්ය බාර දී ඇත.<br>එසේ වුවද මින් ඉදිරියට මෙවැනි කටයුතු ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත් හා ක්‍රමවේදය පිළිබඳව උපදෙස් ලබා දී ඇත. |
| (ඇ) | ජාතික තරුණ සේවා සභාවේ නිස්කෝ වීඩියෝ අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික වෘත්තීය සුදුසුකම් 5 වන මට්ටම (NVQ Level – 5) සහිත රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන පිළිබඳ ජාතික ඩිප්ලෝමාව සම්බන්ධයෙන් තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසම මගින් නිර්දේශ කර තිබූ විෂය නිර්දේශයට අනුව න්‍යායික නිබන්ධන, ප්‍රායෝගික අභ්‍යාස, නිර්මාණ, ස්වයං අධ්‍යයන වශයෙන් පැය 1500 ක පාඨමාලා කාලයක් ආවරණය කළ යුතු වුවද අනිවාර්ය න්‍යායික හා ප්‍රායෝගික දේශන සම්බන්ධයෙන් සිදු කරන ලද නියැදි පරීක්ෂාවේ විෂයයන් 10 කට අදාල දේශන පැය 69 ½ ක් ආවරණය කර නොතිබුණි.<br><br>තවද උක්ත පාඨමාලාවේ තොරතුරු තාක්ෂණික විෂයය හා සන්නිවේදන විෂය සම්බන්ධ උපදේශකවරයා විසින් මෙම පාඨමාලාව ජාතික වෘත්තීය සුදුසුකම් වලට අදාල වන පරිදි නිසි ප්‍රමිතියකින් යුතුව ක්‍රියාත්මක නොවන බව සහකාර අධ්‍යක්ෂ (නිස්කෝ විඩියෝ අංශය) ඇමතූ 2016 ඔක්තෝබර් 10 දිනැති ලිපියෙන් දන්වා තිබුණි. | 2016.03.31 දින 2016/2017 කණ්ඩායමේ පුහුණු කටයුතු ආරම්භ කල අතර, එම පාඨමාලා පවත්වා ගෙන යන අතර, NVQ Level – 5 මට්ටම ලබාගත හැකිවිය.<br>තොරතුරු තාක්ෂණ කළමණාකාරන හා සංනිවේදන විෂය ඉගැන්වූ උපදේශවරයා දැනුම්දීමකින් තොතරව පාඨමාලාවෙන් ඉවත්වීම හේතුවෙන් අවසන් නොවූ පාඨමාලාවේ ඉතිරි පැය ගණන භාහිර උපදේශකවරයෙකු ලෙස බඳවාගත් කැළණිය විශ්ව විද්‍යාලයේ පරිගණක අංශයේ සේවයේ නියුතු ගයාන් පිටිගල මහතාගේ සේවය ලබාගැනීමෙන් සම්පූර්ණ කරන ලදී. (මීට අදාළ ඉගෙනුම් සටහන් හා ජීවදත්ත තොරතුරු ඉදිරිපත් කර ඇත).<br><br>මීට අමතරව මෙම පාඨමාලාව හැදෑරූ සියළුම අභ්‍යාසලාභීන් සඳහා සම්පූර්ණ විෂය නිර්දේශයම නැවත ආවරණය වන පරිදි සම්මන්ත්‍රණයක් පවත්වන ලද අතර, අභ්‍යාසලාභීන් රැකියාගත පුහුණුවකට යොමුකර ඉන්පසු ලිඛිත පරික්ෂණ පවත්වා සියළු |

| | | |
|---|---|---|
| | | පිළිතුරු පත් පරීක්ෂාව සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිසම වෙත භාරදී ඇත. |
| (ඉ) | ජාතික තරුණ සේවා සභාවේ තරුණ මධ්‍යස්ථානය විසින් 2004 සිට පවත්වාගෙන යනු ලබන වර්ෂ 03 ක පූර්ණ කාලීන සංගීත ඩිප්ලෝමා පාඨමාලාවේ, 2016 මාර්තු මාසයේ ආරම්භ කරන ලද පාඨමාලාව පරීක්ෂා කිරීමේදී පාඨමාලාවට අදාල විෂයයන් හා ඊට අයත් ආවරණය කළ යුතු පැය ගණන් සඳහා, සහභාගීවන දේශකවරුන්ට තිබිය යුතු සුදුසුකම් හා සහභාගීවන දේශකවරුන්ගේ නම් ඇතුළත් මූලික සැලැස්මක් පාඨමාලාව සම්බන්ධයෙන් සකස් කර නොතිබුණු අතර, විෂය නිර්දේශයේ ඇතුළත් නොවූ විෂයයන් කාලසටහනට ඇතුළත් කර ප්‍රථම අධ්‍යයන වර්ෂයට අදාල පැය 989 න් 2016 නොවැම්බර් 11 දින දක්වා පැය 189 ක් ඒ සඳහා ගත කර තිබුණි. එසේම ඉංග්‍රීසි භාෂාව හා පරිගණක පුහුණුව සඳහා පැය 50 ක් බැගින් වෙන්කර තිබුණද එම විෂයයන් උගන්වා නොතිබුණි. | එහි සඳහන් පාඨමාලාවන්ට අදාළ විෂයයන් ඉගැන්වෙන ගුරුවරුන්ගේ ජීව දත්ත තොරතුරු ලබා ගෙන ඇති අතර ඒ අනුව ඔවුන් මූලික සුදුසුකම් සපුරා ඇති බව තහවුරු කර ගත හැකිය.<br><br>ජාතික වෘත්තීය නිපුණතා NVQ Level VI දක්වා පාඨමාලා ප්‍රතීතනය කිරීමේ කටයුතු මේ වන විට සකස් කොට ඇති අතර ඒ අනුව සහභාගික දේශකවරුන්ගේ නම් කාලසටහන් සඳහා ඇතුලත් කොට ඇත.<br><br>විෂය නිර්දේශයේ ඇතුලත් නොවූ විෂයක් ලෙස සංදර්ශන පුහුණුව අත්‍යාවශ්‍ය පුහුණුවක් ලෙස මෙම අංශය විසින් හඳුනා ගෙන ඇති අතර, පාඨමාලා ආරම්භක වකවානුවේ සිටම සංදර්ශන පුහුණුව අඛණ්ඩව සිදු කර ඇත. එසේ ප්‍රායෝගික සංදර්ශන පුහුණුව සිසුන්ට ලබාදීම තුල වැඩි වෘත්තීය වටිනාකමක් මෙන්ම ඔවුන්ගේ අනාගතය වෙනුවෙන් අත්‍යාවශ්‍ය සාධකයක් වන ප්‍රාසාංගික වේදිකා හුරුවක් ලැබෙනු ඇත.<br><br>සතියේ කාලසටහන් සඳහා ඉංග්‍රීසි භාෂා විෂය මේ වන විට ඇතුලත් කොට ඇති අතර ඉංග්‍රීසි භාෂා උපදේශකවරුන් හා විදේශීය ස්වෙච්ඡා කණ්ඩායම් යොදා ගනිමින් පාඨමාලාව ක්‍රියාත්මක කෙරේ. මේ සඳහා එක්සත් රාජධානියේ තරුණ ස්වෙච්ඡා සේවකයන්ගේ සහාය ලබා ගෙන ඇත. |
| (ඊ) | නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන මඟින් ශ්‍රම වෙළඳපොලට ගැළපෙන ගුණාත්මයෙන් යුත් පුහුණු වැඩසටහන් සඳහා ප්‍රවේශයන් වැඩිකිරීම මඟින් නිපුණත්වයෙන් වැඩ කළ හැකි ශ්‍රමිකයන් පුළුල් කිරීම අරමුණු කර තිබුණද ජාතික තරුණ සේවා සභාවේ පුහුණු මධ්‍යස්ථාන 48 ක ක්‍රියාත්මක පූර්ණ කාලීන පාඨමාලා සඳහා වූ ශිෂ්‍ය ලියාපදිංචිය 2016 වර්ෂයේදී 8,557 ක් | ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික අභ්‍යාසලාභීන් බඳවා ගැනීම තුලින් වෘත්තීය පුහුණු ඉලක්ක සපුරා ගැනීම සිදුකර ඇත. යම් වර්ෂයක අභ්‍යාසලාභී වර්ධක ප්‍රතිශතය තවත් වර්ෂයකට |

| | | |
|---|---|---|
| | එනම් ඉකුත් වර්ෂය සමග සැසඳීමේදී සියයට 14.66 ක වර්ධනයක්ද, 2017 වර්ෂයේදී 9,169 ක් එනම් සියයට 7.15 ක වර්ධනයක්ද නිරීක්ෂණය විය. ඒ අනුව, වාර්ෂික ශිෂ්‍ය ලියාපදිංචිය ඉහළ ගොස් තිබූ නමුත් 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේ බඳවාගැනීමේ වර්ධන වේගය සියයට 7.51 ක අඩුවීමක් නිරීක්ෂණය විය.<br>එමෙන්ම ලියාපදිංචි සිසුන්ගේ පාඨමාලා හැරයාමේ ප්‍රතිශතය 2014 – 2016 කාල පරිච්ඡේදය තුළ සියයට 20 ත් සියයට 21 ත් අතර පැවති අතර, 2017 වර්ෂයේදී එය සියයට 27.89 ක් දක්වා ඉහළ ගොස් තිබුණි. | සමානුපාතිකව වර්ධනය වීමක් අපේක්ෂා කල නොහැක. එවැනි වර්ධනයක් සිදුවීමට නම් නව පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කර නව පාඨමාලා ආරම්භ කිරීම වාර්ෂිකව සිදුකල යුතුව ඇත. වෘත්තීය පුහුණු කටයුතු වලදී තෘතියික හා වෘත්තීය අධ්‍යාපණ කොමිෂන් සභාව (TVEC) මෙන්ම ජාතික තරුණ සේවා සභාව අපේක්ෂා කරන්නේ තරුණ තරුණියන්ට ගුණාත්මක පුහුණුවක් ලබාදීමය.<br><br>ඒ අනුව ජාතිත වෘත්තීය සුදුසුකම (NVQ) සහිත පාඨමාලා බවට පත්කිරීමට ක්‍රියාත්මක වූ පාඨමාලා පරිවර්ථනය කිරීමේ දී බඳවා ගන්නා අභ්‍යාසලාභීන් ප්‍රමාණය එක් පාඨමාලාවකට 20 කට සීමා කර ඇත. පාඨමාලා වල ප්‍රමිතිය ගුණාත්මක කිරීමට යාමේ දී අභ්‍යාසලාභී ලියාපදිංචිය අනිවාර්යයෙන් අඩුවීමක් සිදුවේ.<br><br>අනෙකුත් වෘත්තීය පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කරන රාජ්‍ය ආයතන 2017 වරෂයේ සිට සියළු පුහුණු පාඨමාලා නොමිලයේ ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලද අතර ජාතික තරුණ සේවා සභාව වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය සම්බන්ධ නොවන බැවින් නොමිලයේ පාඨමාලා ක්‍රියාත්මක කිරීමට මහභාණ්ඩාගාරයේ ප්‍රතිපාදන ලබාදීම සිදුවී නොමැත. එසේ උවද සීමිත ප්‍රතිපාදන තුල ජාතික තරුණ සේවා සභාව මගින්ද තෝරාගත් කාර්මික හා තාක්ෂණික ක්ෂේත්‍ර පාඨමාලා 15 ක් නොමිලේ ක්‍රියාත්මක කිරීම ආරම්භ කරන ලදී.<br><br>ඉහත කරුණු සියල්ල සැලකීමෙදී වාර්ශිකව වෘත්තීය පුහුණුව ලබන තරුන තරුණියන්ගේ විචල්‍යයන් සිදුවීම නිසා අභ්‍යාසලාභීන් බඳවා ගැනීමේ වේගය අඩු වැඩි වීම |

| | | |
|---|---|---|
| | | සිදුවිය හැක. |
| 4.4 | අරමුදල් ඌන උපයෝජනය | |
| | විගණනයට ලැබුණු තොරතුරු අනුව 2015 වර්ෂයේදී Active Citizen Training Programme යටතේ එක්සත් ජාතීන්ගේ සංවිධානයෙන් ජාතික තරුණ සේවා සභාව වෙත රු. 2,215,328 ක් ලැබී තිබූ අතර, 2018 ජුනි 30 දින වන විටත් අදාල කාර්යය සඳහා එය උපයෝජනය කර නොතිබුණි. | 2015 වර්ෂයේ මුල් කාර්තුවේදී ජාතික තරුණ සේවා සභාවේ නව කළමනාකරණ ක්රියාවලිය ප්‍රතිව්‍යුහගත කරන අවස්ථාව වන විට Active Citizen Training Program පිළිබඳව ව්‍යාපෘති වාර්තාවක් හෝ අවබෝධතා ගිවිසුමක් ඉදිරිපත් නොවිණි.<br>එසේ වුවද මෙම වැඩසටහනේ මුදල් මේ වන තෙක් වියදම් කර නොමැති බැවින් 2018 වර්ෂය අවසන් වීමට පෙර වැඩසටහන අවසන් කිරීමට උපදෙස් ලබා දී ඇත |
| 4.5 | නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්<br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| (අ) | 2017 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ ගබඩාවේ තොග සමීක්ෂණ වාර්තා පිළිබඳව පරීක්ෂා කිරීමේදී අවශ්‍යතාවයට අනුව භාණ්ඩ මිලදී ගත යුතු වුවද වර්ෂ දෙකකට අධික කාලයක සිට ගබඩාව තුළ ගොඩගසා ඇති එකතුව රු. 501,600 ක් වූ කාණ්ඩ 09 කට අයත් ක්‍රීඩා උපකරණ ඒකක 426 ක් ද වර්ෂයකට අධික කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන ගොඩ ගසා ඇති එකතුව රු. 837,952 ක් වූ කාණ්ඩ 09 කට අයත් අනෙකුත් භාණ්ඩ ඒකක 2207 ක් ද නිරීක්ෂණය විය. | ජාතික තරුණ සේවා සභාව පවත්වන වාර්ෂික දිස්ත්‍රික් ක්‍රීඩා,ප්‍රාදේශීය ක්‍රීඩා තරග පැවැත්වීම සඳහා දිස්ත්‍රික් මණ්ඩල හා ප්‍රාදේශීය මණ්ඩල සතුව ක්‍රීඩා උපකරණ නොමැති බැවින් අවශ්‍ය අවස්ථාවලදී ප්‍රයෝජනයට ගැනීම සඳහා එක් වර්ගයකින් 04 බැගින්ද පාපන්දු හා වොලිබෝල් 08 බැගින්ද ක්‍රීඩා භාණ්ඩ ගබඩාව සතුව තබා ගැනීමට කටයුතු කර ඇත.<br>ඒ අනුව,<br>800g ජවලින් - 04 - 20,400.00<br>600g ජවලින් - 04 - 13,500.00<br>1Kg කවපෙති 04 - 8,400.00<br>2Kg කවපෙති - 04 - 9,400.00<br>7Kg යගුලිය - 04 - |

| | | |
|---|---|---|
| | | 9,800.00<br>පාපන්දු - 08 - 14,000.00<br>වොලිබෝල් - 09 - 20,250.00<br>මුළු වටිනාකම (රු) 95,750.00<br><br>ක්‍රීඩා සංවර්ධන අංශයට වොලිබෝල් 08 ක්ද , සංස්කෘතික අංශයට වොලිබෝල් 13 ක්ද නිකුත් කර ඇත.<br>කාණ්ඩ 09 කට අයත් රු.837,952.00 ක් වූ අනෙකුත් භාණ්ඩ ඒකක 2207<br><br>2018.08.10 වන විට ගබඩාවේ පවතින භාණ්ඩ ලේඛණය පහත දක්වමි.<br><br>ස්කිනි - 426<br>ඔෆිෂියල් ටී-ෂර්ට්- 202<br>යෞවන ක්‍රීඩා කැප්- 180<br><br>ජාතික තරුණ සේවා සභාවේ විවිධ වැඩසටහන් සඳහා නැවත නැවත පාවිච්චි කිරීම පිණිස පහත සඳහන් භාණ්ඩ ගබඩා කර ඇත.<br><br>40A මේන් ස්විච්- 48 - 152,640.00<br>වාර්නිෂ් ලී - 29 - 64,090.00<br>ස්ටොප් වොච් - 07 - 55,650.00<br><br>මෙයින් ස්ටොප් වොච් ගබඩාවේ තබා තිබුණද ක්‍රීඩා සංවර්ධන අංශය වෙත නිකුත් කර ඇත. |
| (ආ) | (ආ) නාගරික සංවර්ධන අධිකාරිය සමග 2003 ජුනි 23 දින ඇතිකරගත් ගිවිසුම අනුව රු. 2,960,000 ක් ගෙවා ඊට අමතරව වාර්ෂික බිම් බදු මුදල් ලෙස රු. 1000 බැගින් ගෙවීමේ කොන්දේසි මත තරුණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා බදු පදනමින් ලබාගෙන තිබූ බේරුවල ප්‍රදේශයේ අක්කර 01 ක් වූ ඉඩම 2018 මාර්තු 15 දින තෙක් කිසිඳු ඉදිකිරීමක් නොකර නිෂ්කාර්යව පැවතුනි. | බේරුවල තරුණ මධ්‍යස්ථානය ඉදිකිරීමට අදාළ ඉඩම් සැලැස්ම නාගරික සංවර්ධන අනුමැතියට සහකාර අධ්‍යක්ෂ (කළුතර) විසින් භාරදී ඇති අතර, අදාළ ව්‍යාපෘති වාර්තා අනුව ගොඩනැගිලි සැලසුම් හා ටෙන්ඩර් ලේඛන සකස් කර |

| | | |
|---|---|---|
| | | ඇත. මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීමට අදාළව ඉල්ලීම් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය 2018 වර්ෂයේ මේ වන තෙක් ලබාදී නොමැත.<br><br>එසේ හෙයින් මෙම ව්‍යාපෘතියේ මිළ ගණන් කැඳවීම තාවකාලිකව නවතා ඇත. මේ වසරේ ඉදිකිරීමට යෝජිත වූ අදියරේ මුදල් පමණක් හෝ ලබාදෙන ලෙස ගරු ලේකම් තුමා වෙතින් ඉල්ලීම් කරන ලදී.<br><br>ගරු ලේකම්තුමා විසින් මෙම ව්‍යාපෘතියට මුදල් ලබාදෙන ලෙස ඉල්ලමින් භාණ්ඩාගාරයේ ලේකම්<br><br>වෙත ඉල්ලීම කර ඇත. එසේම 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට මෙම ව්‍යාපෘතිය ඇතුලත් කර ප්‍රතිපාදන ඉල්ලීම් කර ඇත. |
| (ඇ) | (ඇ) වර්ෂ තුනක් ඇතුළත වර්ග අඩි 3000 කින් සමන්විත ගොඩනැගිල්ලක් ඉදිකර ජාතික තරුණ සේවා සභාව විසින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම අරමුණු කර 1996 ඔක්තෝබර් මස 09 වන දින තෑගි ඔප්පුවක් මගින් පුද්ගලික පාර්ශවයක් විසින් සියනෑ කෝරලයේ අධිකාරී පත්තුවේ ගෝනහේන ප්‍රදේශයේ පිහිටි පර්චස් 20 ක ඉඩම සභාවට පවරා දී තිබූ අතර, 2017 දෙසැම්බර් 31 දින වන විටත් එම ස්ථානයේ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. ඒ අනුව වසර 21 ක් තිස්සේ මෙම ඉඩම නිෂ්ක්‍රීය වත්කමක් ලෙස පවතින බව නිරීක්ෂණය විය. | සූරියආරච්චි පදනම විසින් සියනෑ කෝරලයේ අධිකාරී පත්තුවේ ගෝනහේන ප්‍රදේශයේ පිහිටි පර්චස් 20 ක ඉඩම සභාවට තෑගි ඔප්පු අංක 56 මගින් ලබාදී ඇත. මෙම ඉඩම සම්බන්ධයෙන් ඇතිවූ නෛතික ක්‍රියාමාර්ගයක් නිසා 2006.06.26 දින සිට ගම්පහ දිසා අධිකරණයේ මෙසේ නෛතික ක්‍රියාමාර්ගය විභාගයට ගැනුන අතර, මෙම ඉඩම නඩු කටයත්තෙන් ඉවත් කර ඇති බැවින් ඉදිරි සංවර්ධන කටයුතු සඳහා නෛතික බාධාවක් නොමැති බව නීතිපති දෙපාර්තමේන්තුවේ අංක සීඒ/53-8/01/එන්වයිඑස්සී/අයිආර්ඒ හා 2016.02.05 දිනැති ලිපියෙන් දැනුම්දී ඇත.<br>ඒ අනුව මෙම ඉඩමෙහි පුහුණු මධ්‍යස්ථායක් ඉදිකිරීම සඳහා ඇති හැකියාව විමසා බලා ඉදිරි කටයුතු කිරීමට අපේක්ෂිතය. |

<table>
<tr><td></td><td colspan="3"></td><td></td></tr>
<tr><td>4.6</td><td colspan="3">හඳුනා ගන්නා ලද පාඩු</td><td></td></tr>
<tr><td></td><td colspan="3">2017 වර්ෂයේ පැවැත්වුණු යොවුන්පුර වැඩසටහන වෙනුවෙන් වීඩියෝ වෝල් කුලියට ලබාගැනීම සඳහා වූ පුවත්පත් දැන්වීමට අනුව වීඩියෝ වෝල් 06 ක් දින 05 ක් වෙනුවෙන් මිල ගණන් කැඳවා තිබුණද, විඩියෝ වෝල් 05 ක් දින 04 ක් සඳහා භාවිතා කර තිබුණි. ඒ අනුව, ගෙවීම් කිරීමේදී සත්‍ය වශයෙන් භාවිතා කළ දින ගණන සලකා බැලීමකින් තොරව ගෙවීම් කිරීම හේතුවෙන් රු. 670,834 ක් වැඩියෙන් ගෙවා තිබුණි.</td><td>අංක 272 දරන වවුචර්පතින් රු.670,834.00 ක මුදල අඩු කර 2018.06.06 වන දින චෙක්පත නිකුත් කර ඇත.</td></tr>
<tr><td>4.7</td><td colspan="3">වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සභාවේ සම්පත්<br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.</td><td></td></tr>
<tr><td>(අ)</td><td colspan="3">ආයතනය සතු පිරිවැය රු. 24,100,000 ක් වූ වාහන 03 ක් රේඛීය අමාත්‍යාංශ පරිහරණය සඳහා ලබා දී තිබුණු අතර, ඉන් වාහන 02 ක් 2012 වර්ෂයේ සිට ද, එක් වාහනයක් 2013 වර්ෂයේ සිට ද අමාත්‍යාංශය විසින් පාවිච්චි කරනු ලබයි. එම වාහනවල රක්ෂණ වාරික ලෙස 2017 වර්ෂය තුළ එකතුව රු. 131,154 ක් සභාව විසින් ගෙවා තිබුණි.</td><td>ජාතික තරුණ සේවා සභාව සතු සියළුම වාහන තනි කාණ්ඩයක් ලෙස සමූහ වාහන රක්ෂණ ක්‍රමය යටතේ රක්ෂණය කර ඇත. ඒ අනුව ඉහත වාහන වල අයිතියද ජාතික තරුණ සේවා සභාව සතු වන බැවින් ඉහත රක්ෂණ ක්‍රමය යටතේ මුදල් අමාත්‍යාංශ මුදල් චකලේඛ 4/2015 හි උපදෙස් පරිදි ජාතික රක්ෂණ භාර අරමුදලේ රක්ෂණය කර ඇත.</td></tr>
<tr><td>(ආ)</td><td colspan="3">ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ නිලධාරීන් 03 දෙනෙකු හා සහකාර තරුණ සේවා නිලධාරියකු 2017 වර්ෂය තුළ ජාතික තරුණ සේවා සභාවට සම්බන්ධ නොවූ බාහිර ආයතන 03 ක රාජකාරි කටයුතු සඳහා සේවයේ නියුක්ත කර තිබුණි. විස්තර පහත දැක්වේ.</td><td></td></tr>
<tr><td></td><td>ජාතික තරුණ සේවා සභාවේ දැරූ තනතුර</td><td>අනුයුක්ත කර ඇති ආයතනය</td><td>අනුයුක්ත කළ දිනය</td><td></td></tr>
<tr><td></td><td>නියෝජ්‍ය අධ්‍යක්ෂ</td><td>ජනාධිපති කාර්යාලය</td><td>2017.02.03</td><td>ජනාධිපති කාර්යාලයෙන් ඉල්ලා ඇති පරිදි ජාතික තරුණ සේවා සභාවෙන් වැටුප් ගෙවයි.</td></tr>
<tr><td></td><td>ලේකම්</td><td>වැවිලි කර්මාන්ත</td><td>2017.</td><td>එම අමාත්‍යාංශයෙන් ප්‍රතිපූර්ණය</td></tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| | | අමාත්‍යාංශය | 06.13 | කිරීමේ පදනම මත වැටුප් ගෙවයි. |
| | සහකාර අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමූපාකාර සමිතිය | 2017. 05.23 | ජාතික තරුණ සේවා සභාවේ සේවකයින්ට ණය දීම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට ශ්‍රී ලංකා තරුණ සේවා සමුපකාර සමිතියට අනුයුක්ත කර ඇති නිසා තරුණ සේවා සභාවෙන් වැටුප් ගෙවයි |
| | සහකාර තරුණ සේවා නිලධාරී | ජනාධිපති කාර්යාලය | 2017. 07.04 | ජනාධිපති කාර්යාලයෙන් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත වැටුප් ගෙවයි. |
| 4.8 | සභාව විසින් බාහිර ආයතනවල සම්පත් පරිහරණය කිරීම. | | | |
| | සභාව විසින් බාහිර ආයතන සතු වාහන 13 ක් වසර 03 කට අධික කාලයක සිට විධිමත් පවරා ගැනීමකින් තොරව පරිහරණය කරමින් පැවතුණි. | | | |
| | | වාහන අංකය | බාහිර ආයතනයේ නම | |
| | 01 | KJ – 7551 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | KJ-7551 2015 වර්ෂයේදී අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ ඉල්ලීම පරිදි අග්‍රාමාත්‍ය කාර්යාල මගින් ජාතික තරුණ සේවා සභාව වෙත ලබාදී ඇත. වාහනයේ අයිතිය ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය සතුය. අග්‍රාමාත්‍ය ලේකම් තුමාගේ උපදෙස් පරිදි වාහනය පවරාගැනීමට අදාල ලිපි ලේඛන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය වෙත 2015.02.23 දිනැති ලිපියෙන් භාරදී ඇත. නමුත් මේ දක්වා එම පැවරීමට අදාලව එම අමාත්‍යාංශය මගින් කටයුතු කර නැත. |

| | | | | |
|---|---|---|---|---|
| | 02 | KC – 6600 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | KC-6600 යෞවන කටයුතු හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි ෆර්ජෝ වර්ගයේ මෙම කාර් රථය එම අමාත්‍යාංශය වෙතින් සාමාන්‍යාධිකාරී සීමාසහිත ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමය වෙත ලබා දී ඇති අතර, 2012 වර්ෂයේ දී සමුපකාර සමිති සංගමය මඟින් තරුණ සේවා සභාව වෙත ලබා ගෙන ඇත. 2015 වර්ෂය තෙක් ධාවනය කරන ලද මෙම කාර් රථය දැනට ධාවනය නොකරන බැවින්, ලේකම් ව්‍යපෘති කළමනාකරණ තරුණ කටයුතු හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය වෙත නැවත භාර ගන්නා ලෙස දන්වා යවා ඇත.<br><br>PG කාණ්ඩය යටතේ ලබාදුන් කැබ් රථ 10 යි අයිතිය ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට නොවන බව දන්වන අතර, ලේකම් තරුණ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය නමින් ලියාපදිංචිකර ලංකා බැංකුවෙන් වසර 05 ක කල්බදු ක්‍රමය යටතේ 2015 වර්ෂයේ මිලදීගෙන සභාව වෙත ලබාදී ඇත. කල්බදු කාලසීමාව අවසන්වනතුරු මෙම වාහනවල පරම අයිතිය ලංකා බැංකුව සතුවන අතර, කල්බදු කාලසිමාව අවසන්වන තුරු කිසිදු පැවරීමක් කළ නොහැක. |
| | 03 | PG – 5074 | | |
| | 04 | PG – 5078 | | |
| | 05 | PG – 4910 | | |
| | 06 | PG – 4897 | | |
| | 07 | PG – 4895 | | |
| | 08 | PG – 4912 | | |
| | 09 | PG – 4907 | | |
| | 10 | PG – 4908 | | |
| | 11 | PG – 5067 | | |
| | 12 | PG – 4899 | | |
| | 13 | 50 – 4585 | සැළසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය | 50 – 4585 මොණරාගල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යපෘතිය යටතේ ජාතික තරුණ සේවා සභාවේ මොණරාගල දිස්ත්‍රික් කාර්යාලයට ලබාදී ඇති මුත් වාහනයේ නිත්‍යානුකූල අයිතිය ලේකම් සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය සතුය. 2016 වර්ෂයේදී එම ව්‍යපෘතිය මගින් ලබාදුන් වාහනවල අයිතිය පවරාගන්නා |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | ලෙස ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ජාතික තරුණ සේවා සභාව වෙත දන්වා ඇති අතර, ඒ අනුව පැවරීමට අදාල ලිපි ලේඛන සම්පූර්ණකර එම ආයතනය වෙත යොමුකොට ඇත. නමුත් මෙම පැවරීම නිසි ලෙස සිදුවී නොමැත. නැවත වරක් 2013 වර්ෂයේදී පැවරීමට අදාල ලිපි ලේඛන සම්පූර්ණකර අධ්‍යක්ෂ සැලසුම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මොණරාගලවෙත යොමුකොට ඇත. නමුත් 2015 වර්ෂය වන තුරු මෙම කාර්යය ඉටු නොවූ අතර, මේ පිළිබඳව දිගින් දිගටම විමසීම් කිරීමේදී අධ්‍යක්ෂ දිස්ත්‍රික් ලේකම් (ක්‍රමසම්පාදන) 2015 වර්ෂයේදී පැවරීමට අදාල ලිපි ලේඛන සකස් කර ඔවුන් වෙත යොමුකරන ලෙස අප වෙත දන්වන ලදි.<br><br>ඒ අනුව නැවතත් අදාල ලිපි ලේඛන සකස්කර යොමු කලමුත් මේවන තුරු අයිතිය පවරාදීමක් සිදුකර නැත.<br><br>කැබ් රථය දැනට සපුගස්කන්ද පුහුණු මධ්‍යස්ථානයේ ගාල්කර ඇති අතර, දෝෂයන් හේතුවෙන් එන්ජිම ගිනිගැනීම නිසා එන්ජිම අලුත්වැඩියා කිරීමට ඇත. බොඩියද දිරාපත් වීම ආරම්භ වී ඇත. |
| 4.9 | කාර්ය මණ්ඩල පරිපාලනය<br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | | | |
| | විස්තරය | අනුමත කාර්ය මණ්ඩලය | තත්‍ය කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව | |
| | ඉහළ කළමනාකරණ මට්ටම (HM) | 05 | 04 | 01 | |
| | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම (MM) | 63 | 59 | 04 | |
| | මධ්‍යම මට්ටමේ කළමනාකරණ තනතුරු | 106 | 61 | 45 | |
| | අනෙකුත් | 1257 | 1121 | 136 | |
| | එකතුව | 1431 | 1245 | 186 | |

සටහන : - ඉහත තත්‍ය සේවක සංඛ්‍යාව තුළ දරන්නාට පෞද්ගලික වන සේ සහ පසුව අහෝසි වීමට යටත්ව අනුමත කරන ලද සේවකයින් 388 ඇතුළත් කර නොමැත.

| | | |
|---|---|---|
| (ආ) | ජාතික තරුණ සේවා සභාවේ ඉහළ කළමනාකරණ මට්ටමේ තනතුරු 03 ක් සඳහා නිලධාරීන් තිදෙනෙකු මාස 18 සිට වර්ෂ 03 ක කාලපරිච්ඡේදයක සිට ද්විතීයන පදනමින් අනුයුක්ත කර තිබූ අතර ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 04 ක් සඳහා නිලධාරීන් 10 දෙනෙකු වැඩබැලීම සඳහා පත්කර තිබුණි. එසේම, නිලධාරීන් 57 දෙනෙකු රාජකාරි ආවරණය කිරීම සඳහා ද නිලධාරීන් 23 දෙනෙකු රාජකාරි ඉටුකිරීම සඳහා ද පත්කර තිබුණි. මාස 09 සිට වර්ෂ 11 ක කාලපරිච්ඡේදයක සිට රාජකාරි ඉටුකිරීම සිදුකරන නිලධාරීන් සිටින බව තවදුරටත් නිරීක්ෂණය විය. | (ආ). කළමනාකාර (MM 1-1) සේවා ගණයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, සහකාර අධ්‍යක්ෂ, නිකේතනාධිපති, අභ්‍යන්තර විගණක, ඉංජිනේරු (සිවිල්) වශයෙන් තනතුරු වර්ග නාම 05 ක් අනුමත වී ඇති අතර, ඉන් නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරේ පැවති පුරප්පාඩු සඳහා පමණක් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් ලද ලිඛිත අනුමැතිය මත වැඩබලන පත්වීම් ලබා දී ඇත.වෙනත් කිසිදු තනතුරක් සඳහා වැඩබලන පත්වීම් ලබා දී නොමැත.<br><br>මෙම නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර ජාතික තරුණ සේවා සභාවට අනුමත බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පරිපාටිය අනුව කළමනාකාර (MM 1-1) සේවා ගණයේ I වන ශ්‍රේණියට අයත් තනතුරක් වන බැවින් ද, දැනට සහකාර අධ්‍යක්ෂ තනතුර දරණ නිළධාරීන් අතර I වන ශ්‍රේණියට අයත් නිළධාරීන් නොමැති බැවින් ද, මෙම තනතුර සඳහා භාහිර බඳවාගැනීම් සිදුකල නොහැකි බැවින් ද, තව දුරටත් මෙම තනතුරේ වැඩබැලීමේ පත්වීම් ක්‍රියාත්මක කිරීමට සිදු වී ඇත.<br><br>ජාතික තරුණ සේවා සභාවේ 2012.11.22 දිනට අනුමත බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පරිපාටිය අනුව සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා ඉල්ලුම් කිරීමට කණිෂ්ඨ කළමනාකරණ (JM 1-1) සේවා ගණයේ I වන ශ්‍රේණියේ තනතුරක වසර 05ක සේවා කාලයක් සලකා බැලූ අතර, එකී බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පරිපාටියේ කණිෂ්ඨ කළමනාකරණ (JM 1-1) සේවා ගණයට අනුමත කර ඇති තනතුරු වල නිළධාරීන් රාජකාරී නොකල අතර, එම තනතුරු වලට පැවරෙන කාර්යයන් , රාජකාරී ඉටුකල නිළධාරීන් MA – 4 වැටුප් කේතයේ පෞද්ගලිකව තබා තිබූ තනතුරු වල රාජකාරී කරන ලදී.තවද මෙම තනතුරු වල නිළධාරීන්ට 2012.11.22 දිනට අනුමත බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පරිපාටිය තුල උසස්වීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවූ බැවින් පැවති බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පරිපාටිය 2016.11.01 දින සිට සංශෝධනය කර ගන්නා ලදී.<br>ඒ අනුව කණිෂ්ඨ කළමනාකරණ (JM 1-1) සේවා ගණයේ තනතුරු කිහිපයක පැවති පුරප්පාඩු සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වා 2016.11.01 දින සිට පත්වීම් ලබා දී ඇති නමුත් අනුමත නව බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පරිපාටියේ කළමනාකාර (MM 1-1) සේවා ගණයේ සහකාර අධ්‍යක්ෂ තනතුරට අයඳුම් කිරීම සඳහා අවශ්‍ය කණිෂ්ඨ කළමනාකරණ (JM 1-1) සේවා ගණයේ වසර 05 ක පළපුරුද්ද මෙම නිළධාරීන් සපුරා නොතිබීම හේතුවෙන් පුරප්පාඩුව පැවති සහකාර අධ්‍යක්ෂ තනතුරු 23ක් සඳහා රාජකාරී ඉටුකිරීම් පත්වීම් 2017.02.14 දින සිට ලබා දී ඇත.<br>ඒ අනුව සහකාර අධ්‍යක්ෂ තනතුරේ රාජකාරී ඉටුකිරීම් ලබා දී ඇති නිළධාරීන් වර්ෂ 01 මාස 05 ක කාලය පමණක් මෙම තනතුරු වල රාජකාරී ඉටුකරයි. |

| | | |
|---|---|---|
| (ඈ) | 2016 නොවැම්බර් 08 දිනට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත තනතුරු සංඛ්‍යාවට අතිරේකව නියෝජ්‍ය අධ්‍යක්ෂක තනතුරු 15 ක්ද සහකාර අධ්‍යක්ෂක තනතුරු 12 ක්ද මධ්‍ය මට්ටමේ නිලධාරීන් 04 දෙනෙකුද වැඩබැලීමේ හා රාජකාරි ආවරණය කිරීමේ පදනමින් අනුයුක්ත කර තිබුණි.<br><br>මේ සම්බන්ධව කළමනාකරණ සේවා අධ්‍යක්ෂතුමාගේ අංක DMS/1671- V – II හා 2016 නොවැම්බර් 08 දිනැති ලිපිය මගින් කුමන හෝ තනතුරක් සඳහා වැඩබැලීම, රාජකාරි ආවරණය හෝ ස්ථිරව පත්කළ හැක්කේ අනුමත තනතුරු සංඛ්‍යාව තුළ පමණක් බවත් මෙම තත්ත්වය නිවැරදි කළ යුතු බවත් දන්වා තිබූ අතර, 2017 දෙසැම්බර් 31 දින දක්වා නිවැරදි කිරීම සිදුකර නොතිබුණි. | රාජකාරී ආවරණය සඳහා නිළධාරීන් මෙම ආයතනයේ රාජකාරී අවශ්‍යතාවය මත සේවය ලබා ගැනීම සඳහා පමණක් පත්කර ඇති අතර, ඒ වෙනුවෙන් ඔවුන්ට වැටුප් හෝ දීමනා ලබා දීමක් සිදු නොකරයි. ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂිකව සංවිධානය වන විවිධ ජාතික වැඩසටහන් වලදී ඉහළ කාර්ය සාධනයක් ලබා ගැනීම සඳහා පමණක් රාජකාරී ආවරණ පත්වීම් ලබා දී ඇත. |
| (ඇ) | සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනමින් නිලධාරියකු පත්කර තිබූ අතර, 2018 පෙබරවාරි මාසයේදී එම තනතුර පුරප්පාඩු වී තිබුණි. එසේ වුවද 2018 ජුනි 30 දක්වා එම තනතුරට ස්ථිර පදනමින් බඳවාගෙන නොතිබුණි. තවද 2016 නොවැම්බර් 08 දිනට අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණන නිලධාරීන් දෙදෙනෙකු දක්වා අඩුකර තිබුණි. | ජාතික තරුණ සේවා සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර සඳහා 2017.05.18 දින පුවත්පත් දැන්වීමක් මගින් අයදුම්පත් කැඳවා 2017.08.14 දින සම්මුඛ පරීක්ෂණ පවත්වන ලද අතර, එහිදී සුදුසු නිළධාරියෙකු පත්කර ගත නොහැකි වූ හෙයින් නැවත 2018.01.28 දින ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් අයදුම්පත් කැඳවා 2018.03.10 දින සම්මුඛ පරීක්ෂණයක් පවත්වන ලද අතර, එකී සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වූ අය අතුරින් බඳවාගැනීමේ සුදුසුකම් සපුරා ඇති නමුත්, කළමනාකාර මට්ටමේ වසර 15ක සුදුසුකම සපුරා නොතිබීම හේතුවෙන් එකී සේවා කාලය සම්බන්ධයෙන් යම් සහනයක් ලබා දෙන ලෙස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කර ඇති බැවින්, අදාළ අනුමැතිය ලද පසු කඩිනමින් මෙම පුරප්පාඩුව සම්පූර්ණ කිරීමට නියමිතය.තවද, අභ්‍යන්තර විගණන නිළධාරීන් සංඛ්‍යාව 02 ක් දක්වා අඩුකර ඇත්තේ 2016.11.08 දිනැතිව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් එවා ඇති අනුමත කාර්ය මණ්ඩල ලිපියෙන් නොව කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/E3/36/4/224/1-1 හා 2011.05.19 දිනැතිව යොමු කර ඇති "කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30හි විධිවිධාන අනුව කාර්ය මණ්ඩලය අනුමත කිරීම" යන ලිපිය මගින් වන අතර, මේ සම්බන්ධයෙන් දිගින් දිගටම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට කරුණු ඉදිරිපත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස විගණන නිළධාරී තනතුරු සංඛ්‍යාව 10 ක් දක්වා වැඩිකර ගැනීමට අනුමැතිය ලැබී ඇත. |
| (ඉ) | අනුමත කාර්ය මණ්ඩලය තුළ ඇතුළත් නොවූ මාධ්‍ය උපදේශක නමැති | |

| | | |
|---|---|---|
| | තනතුරෙහි රාජකාරි ඉටු කිරීමේ පදනමින් මසකට රු. 40,000 ක දීමනාවක් හා රාජකාරි කටයුතු සඳහා ඉන්ධන සමග වාහනයක්ද සමග මාධ්‍ය උපදේශකවරයකු 2015 අප්‍රේල් 30 දින සිට පත්කර තිබූ අතර, 2017 දෙසැම්බර් 31 දින වන විට මාසික දීමනාව වශයෙන් එකතුව රු. 1,281,333 ක් ගෙවා තිබුණි. | |
| (ඊ) | ජාතික තරුණ සේවා සභාවේ කාර්මික හා වෘත්තීය පුහුණු අංශයේ අනුමත කාර්ය මණ්ඩලය 176 ක් වූ අතර, අධ්‍යක්ෂ (පුහුණු) හා නියෝජ්‍ය අධ්‍යක්ෂ (කාර්මික හා වෘත්තීය පුහුණු) යන තනතුරුද ඇතුළත්ව 2018 මාර්තු 31 දිනට පුරප්පාඩු 61 ක් පැවති අතර, ඉන් පුරප්පාඩු 59 ක් අධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් බව නිරීක්ෂණය විය. | අධ්‍යක්ෂ පුහුණු තනතුර සඳහා මෙම ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂවරයෙකු රාජකාරී ආවරණය කිරීම සඳහා සහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය මත 2016.05.16 දින සිට පත්කර ඇති අතර, නියෝජ්‍ය අධ්‍යක්ෂ (කාර්මික හා වෘත්තීය පුහුණු) තනතුර සඳහා වැඩබැලීමට නිළධාරියෙකු පත්කර ඇත.අධ්‍යයන කාර්ය මණ්ඩලයට අයත් වෘත්තීය පුහුණු උපදේශක තනතුර සඳහා මෙන්ම පුරප්පාඩු සියළු තනතුරු සඳහා බඳවා ගැනීමේ අනුමැතිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් මේ වන විට ලිඛිතව ලබාගෙන ඇති නමුත්, වෘත්තීය පුහුණු උපදේශක (කොන්ත්‍රාත්) තනතුර සඳහා බඳවා ගැනීමේදී ඒ සඳහා වන වෘත්තීය ක්ෂේත්‍රයන්, බඳවා ගැනීමේ සුදුසුකම් හා සේවා ව්‍යවස්ථාව සඳහා වෙනම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත යුතු බැවින් ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමේ ලිපිය තරුණ කටයුතු, ව්‍යෘපෘති කළමනාකරණ හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් මගින් කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය සඳහා 2018.08.14 දිනැතිව ලිපි යොමු කර ඇත.<br><br>මෙම නිළධාරී මහතා අනවසරයෙන් සහකාර අධ්‍යක්ෂ නිළමුද්‍රාව තබා ව්‍යාජ අත්සනක් යොදා රජයේ බැංකුවකින් රු.50000/-මුදලක් ලබාගෙන ඇති අතර ඒ පිළිබඳ විනය ක්‍රියාමාර්ගයක් නොගෙන ධූරය හැරයාමේ ලිපිය නිකුත් කිරීම සම්බන්ධව අදාළ විෂය ලිපිකරුට ආයතන සංග්‍රහය 11 වන කොටසෙහි 1 වන පරිශිෂ්ඨයේ සඳහන් නොසැලකිල්ල යන්නට අදාළ දඩුවම් නියම කිරීමට නියෝග ලබා දී ඇත. ඒ අනුව කටයුතු කරමින් පවතී. |
| (උ) | ජාතික තරුණ සේවා සභාවේ සහකාර තරුණ සේවා නිලධාරියකු ලෙස සේවය කළ නිලධාරියකුගේ අසතුටුදායක රාජකාරි තත්ත්වය සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 7 වන වගන්තිය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට වගකිව යුතු නිලධාරීන් විසින් කටයුතු කර නොතිබුණු අතර, එම නිලධාරියා විසින් සේවයේ යෙදී සිටි කාලය තුළ සහකාර අධ්‍යක්ෂවරයකුගේ නිලමුද්‍රාව අනවසරයෙන් තබා ව්‍යාජ අත්සනක් සහිතව රජයේ බැංකුවකින් රු. 50,000 ක ණය මුදලක් ලබාගැනීම සම්බන්ධයෙන් ආයතන | මෙම නිළධාරී මහතා අනවසරයෙන් සහකාර අධ්‍යක්ෂ නිළමුද්‍රාව තබා ව්‍යාජ අත්සනක් යොදා රජයේ බැංකුවකින් රු.50000/-මුදලක් ලබාගෙන ඇති අතර ඒ පිළිබඳ විනය ක්‍රියාමාර්ගයක් නොගෙන ධූරය හැරයාමේ ලිපිය නිකුත් කිරීම සම්බන්ධව අදාළ විෂය ලිපිකරුට ආයතන සංග්‍රහය 11 වන කොටසෙහි 1 වන පරිශිෂ්ඨයේ සඳහන් නොසැලකිල්ල යන්නට අදාළ දඩුවම් නියම කිරීමට නියෝග ලබා දී ඇත.ඒ අනුව කටයුතු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| | සංග්‍රහයේ II කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 29,31 වගන්ති ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | | |
| 4.10 | වාහන උපයෝජනය<br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | | |
| (අ) | 2018 මාර්තු 19 දිනැති අංක CGO/ASM/policy/cir/01 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව අපහරණය කළ යුතු වාහන සම්බන්ධයෙන් 2015 ජූලි 10 දිනැති අංක 2015/02 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ උපදෙස් අනුගමනය කරමින් 2018 ජූනි 30 දිනට පෙර අපහරණය කොට 2018 ජූලි 30 දින හෝ ඊට පෙර කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට දැන්විය යුතු වුවද 2017 දෙසැම්බර් 31 දින වන විට අපහරණය කළ යුතු තත්ත්වයේ පැවති වාහන 07 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි. විස්තර පහත දැක්වේ. | | |
| | වාහන අංකය අංකය | විස්තරය | |
| | 207 – 4654 | බජාජ් ත්‍රීරෝද රථ | 207 – 4654 බජාජ් ත්‍රී රෝද රථය චැසි අංකය සහිත ස්ථානය සම්පූර්ණයෙන් දිරා ගොස් ඇති බැවින්, වාහනයේ අනන්‍යතාවය තහවුරු කර ගත නොහැකි බැවින් ඉදිරි ක්‍රියා මාර්ග ගත නොහැකි බව් මෝටර් රථ පරීක්ෂක විසින් ප්‍රකාශ කරන ලදි. |
| | 50 – 6575 | ටොයෝටා හයිඑස් | 50 – 6575 ටොයෝටා හයිඑස් වෑන් රථය වාහනයේ ලියාපදිංචි සහතිකය සහ වාහනයේ චැසි අංකය පරස්පරතාවක් තිබූ බැවින්, නැවත වාහනය මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර සංශෝධිත ලියාපදිංචි සහතිකයක් ලබා ගන්නා ලෙස මෝටර් රථ පරීක්ෂක විසින් ප්‍රකාශ කරන ලදි. ඒ අනුව අදාල රාජකාරි කටයුතු ඉටු කර නව ලියාපදිංචි සහතිකයක් ලබා දෙන ලෙස 2018.04.26 වනදින මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් වෙත දන්වා යවා ඇත. ලියාපදිංචි කිරීමේ සහතික ලැබෙන තුරු අපහරණය හෝ ගර්හිත කිරීම් කල නොහැක. |
| | 53 – 5863 | ඉසුසු ඩබල් කැබ් | 53 – 5863 ඉසුසු කැබ් රථය වාහනයේ චැසිය දිරා ගොස් පාස්සා නැවත සකස් කර ඇති බැවින්, ලියාපදිංචි සහතිකය සහිතව වෙන්දේසි කිරීමට අවසර ලබා දිය |

| | | | |
|---|---|---|---|
| | | | නොහැකි බැව් මෝටර් රථ පරීක්ෂක විසින් ප්‍රකාශ කරනු ලැබූ අතර, වැසි අංකය කපා ලියාපදිංචිය අහෝසි කිරීමෙන් පසුව අබලි ද්‍රව්‍ය ලෙස වෙන්දේසි කිරීමට හෝ පුහුණු කටයුතු සඳහා ලබා දිය හැක. |
| | 29 – 6264 | ටාටා බස් | 29 ශ්‍රී 6264 ටාටා බස් රථය , 41 ශ්‍රී 3420 ටාටා ලොරි රථය, 27 ශ්‍රී 5984 ටාටා ලොරි රථය, 27 ශ්‍රී 5985 ටාටා ලොරි රථය යන අබලි තත්වයේ වාහන වෙන්දේසි කිරීම සඳහා සභා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය 2015.11.28 වන දින ලබා ගන්නා ලද අතර, 2015.03.18 වන දින තක්සේරු කිරීම් මණ්ඩලය මඟින් වාහන පරීක්ෂා කරන ලදි. මෙම වාහන ලියාපදිංචි සහතික සහිතව වෙන්දේසි කිරීමට අවසර ලබා දිය නොහැකි බව මොටර් රථ පරීක්ෂක විසින් ප්‍රකාශ කරන ලදි. ඒ අනුව ලියාපදිංචිය අහෝසි කොට අබලි ද්‍රව්‍ය ලෙස වෙන්දේසි කිරීමට හෝ පුහුණු කටයුතු සඳහා ලබා දිමට නියමිතය. 2018.08.04 වන දින මෝටර් රථ පරීක්ෂක විසින් වැසි අංක කපා ලියාපදිංචිය අහෝසි කිරීමට කටයුතු කරන ලදි. |
| | 41 – 3420 | ටාටා ලොරි | |
| | 27 – 5984 | ටාටා ලොරි | |
| | 27 – 5985 | ටාටා ලොරි | |
| (ආ) | 2017 දෙසැම්බර් 31 දින වන විට සභාව සතු / භාවිතා කරන වාහන 05 ක් වර්ෂ ගණනාවක් තිස්සේ අළුත්වැඩියා තත්ත්වයේ පැවති අතර, අදාල අළුත්වැඩියා කටයුතු කිරීමෙන් තොරව සභාවේ විවෘත භූමියේ ගාල්කර පැවතුණි. විස්තර පහත දැක්වේ. | | |

| | වාහන අංකය | විස්තරය | ධාවනයෙන් ඉවත් කළ දිනය | වෙනත් කරුණු | |
|---|---|---|---|---|---|
| | 50 – 4585 | කැබ් රථය | 2011.10.27 | නොරාඩ් ආයතනයෙන් ලැබී ඇති අතර, අයිතිය සභාව සතුව නොමැත. | 50 – 4585 මොණරාගල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ජාතික තරුණ සේවා සභාවේ මොණරාගල දිස්ත්‍රික් කාර්යාලයට ලබාදී ඇති මුත් වාහනයේ නිත්‍යානුකූල අයිතිය ලේකම් සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය සතුය. 2016 වර්ෂයේදී එම ව්‍යාපෘතිය මගින් ලබාදුන් වාහනවල අයිතිය පවරාගන්නා ලෙස ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් ජාතික තරුණ සේවා සභාව වෙත දන්වා ඇති අතර, ඒ අනුව පැවරීමට අදාල ලිපි ලේඛන සම්පූර්ණකර එම ආයතනය වෙත යොමුකොට ඇත.<br><br>නමුත් මෙම පැවරීම නිසි ලෙස සිදුවී නොමැත. නැවත වරක් 2013 වර්ෂයේදී පැවරීමට අදාල ලිපි ලේඛන සම්පූර්ණකර අධ්‍යක්ෂ සැලසුම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මොණරාගලවෙත යොමුකොට ඇත.<br><br>නමුත් 2015 වර්ෂය වන තුරු මෙම කාර්යය ඉටු නොවූ අතර, මේ පිළිබඳව දිගින් දිගටම විමසීම් කිරීමේදී අධ්‍යක්ෂ දිස්ත්‍රික් ලේකම් (ක්‍රමසම්පාදන) 2015 වර්ෂයේදී පැවරීමට අදාල |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | ලිපි ලේඛන සකස් කර ඔවුන් වෙත යොමුකරන ලෙස අප වෙත දන්වන ලදි. ඒ අනුව නැවතත් අදාල ලිපි ලේඛන සකස්කර යොමු කලමුත් මේවන තුරු අයිතිය පවරාදීමක් සිදුකර නැත.<br><br>කැබ් රථය දැනට සපුගස්කන්ද පුහුණු මධ්‍යස්ථානයේ ගාල්කර ඇති අතර, දෝෂයන් හේතුවෙන් එන්ජිම ගිනිගැනීම නිසා එන්ජිම අලුත්වැඩියා කිරීමට ඇත. බොඩියද දිරාපත් වීම ආරම්භ වී ඇත. |
| | 52 – 0274 | කැබ් රථය | 2017.04.06 | - | 52 - 0274 , 52 - 0751 2017 වර්ෂයේ මෙහෙයුම් කල්බදු ක්‍රමය යටතේ නව කැබ් රථ ලබා ගැනීමෙන් පසු ධාවනයට එක් කර නොමැති අතර, ලියාපදිංචි කාණ්ඩය අනුව වර්ග කල විට මේ වන විට ඇති පැරණිම වාහන වේ. වාහන වෙන්දේසි කිරීම සම්බන්ධයෙන් ඉදිරියේ දි පත් කරනු ලබන සමීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට නියමිතය. |
| | 52 – 0751 | කැබ් රථය | 2017.07.03 | - | |
| | 56 – 7968 | කැබ් රථය | 2015.08.31 | - | 56 - 7968 දඹුල්ල පුහුණු මධ්‍යස්ථානයට අනුයුක්ත කර ඇති අතර ඉන්ජෙක්ටර් පොම්පය හා ඉන්ජෙක්ටර් නොසල් දෝෂ සහිත වූ බැවින් ප්‍රධාන කාර්යාලය වෙත රැගෙන විත් මේ වන විට අලුත්වැඩියා කර ඇත. එම කොටස් නැවත වාහනයට සවි කර ධාවනයට එක් කිරීමට නියමිතය. |
| | 62 – 2258 | බස් රථය | 2016.01.05 | - | 62 - 2258 ඒෂියා කොම්බි බස් රථය කොරියාවේ නිෂ්පාදිත මෙම බස් රථය සපුගස්කන්ද කොරියන් පුහුණු මධ්‍යස්ථානයට පරිත්‍යාගයක් ලෙස ලද බස් රථයකි. 2014 දක්වා අඛණ්ඩව ධාවනය කර ඇති අතර ගියර් පෙට්ටිය නැවත අලුත්වැඩියා කල නොහැකි ලෙස කැඩී ඇත. දේශීය ඒජන්තවරයෙක් නොමැති බැවින් අමතර කොටස් ලබා ගැනීමේ හැකියාවක් නොමැත. බාහිර වෙළෙඳ පොළෙන් මිළ ගණන් කැඳවීම සිදු කල නමුත් අමතර කොටස් ලබා ගැනීමට නොහැකි වී ඇත.<br>බස් රථය ධාවන තත්වයට ගැනීමට වෙනත් වර්ගයක එන්ජිමක් සහ ගියර් පෙට්ටියක් සවි කර ප්‍රතිස්ථාපනය කළ යුතුය. වැය වන වියදම පිළිබඳව තක්සේරු කර කළමණාකාරීත්වයේ අනුමැතිය ලබා ගත යුතුව ඇත. |
| 5. | තිරසාර සංවර්ධනය | | | | |
| 5.1 | තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම | මේ වන විට අදාළ දැනුවත් කිරීම් කර ඇති අතර, 2018.06.04 වන දින රාජ්‍ය ආයතන විසින් තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා සූදානම්වීම පිළිබඳ ප්‍රශ්ණාවලිය සම්පූර්ණ කර යවා ඇත. | | | |
| 6. | ගිණුම් කටයුතුභාවය හා යහපාලනය | | | | |
| 6.1 | ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය | | | | |
| 6.1.1 | ප්‍රසම්පාදනයන්<br>පහත සඳහන් නිරීක්ෂණයන් කරනු | | | | |

| | | |
|---|---|---|
| | ලැබේ. | |
| (අ) | ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය තීන්ත ආලේප කිරීම. | |
| (i) | උක්ත කර්මාන්තය සඳහා වෙළඳපොල මිල සැදහුම් ක්‍රමය අනුගමනය කළ බව දක්වා තිබුණද මිල ගණන් කැඳවීමේදී ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවීම හෝ වෙනත් පිළිගත හැකි ක්‍රමවේදයක් හෝ අනුගමනය කර නොතිබුණු අතර, කොන්ත්‍රාත්කරු තෝරාගැනීම විනිවිදභාවයකින් යුතුව සිදුකර තිබූ බව තහවුරු කර ගත නොහැකි විය. | ජාතික තරුණ සේවා සභාවේ දිවයින පුරා පිහිටි සියළු පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල, පුහුණු මධ්‍යස්ථාන සහ ගොවිපල මධ්‍යස්ථාන සිදු කල යුතු අළුත්වැඩියා කටයුතු සඳහා අදාල ප්‍රාදේශීය කාර්යාලයේ කාර්මික නිළධාරි මගින් ඇස්තමේන්තු සකසා ප්‍රාදේශීය ඉංජිනේරුගේ, ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශ සහ පළාත් අධ්‍යක්ෂ (ජාතික තරුණ සේවා සභාව) ගේ නිර්දේශ සහිතව නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉදි / නඩ) ජාතික තරුණ සේවා සභාව වෙත යොමුකරන ලෙස ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ (සංවර්ධන) විසින් සියළු පළාත් අධ්‍යක්ෂක වරුන් වෙත 2016.12.20 දින ලිඛිතව දන්වා ඇත. |
| (ii) | ප්‍රමාණ පත්‍රයේ A – 1 සිට A – 3 දක්වා වූ අයිතම යටතේ වර්ග අඩි 3,000 ක තීන්ත ඉවත් කර ඉරිතැලීම් හා කඩතොළු ස්ථාන පොටි කර කපා තීන්ත ආලේප කළ යුතුව තිබුණත් එසේ තීන්ත ඉවත් කිරීමෙන් තොරව පිලර් ආලේප කර තිබූ බව 2017 ඔක්තෝබර් 20 දින සිදු කරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය විය. | විගණන දිනයෙන් පසුව මේ සම්බන්ධයෙන් සොයා බලා දිස්ත්‍රික් ලේකම්තුමා මගින් සිදු කරන ලද ඉල්ලීම පරිදි, මුලින් අධීක්ෂණ කටයුතු සිදු කල තාක්ෂනික නිලධාරී වෙනුවට ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරු ආර්.එම්.ජේ.එස්.සකුන්තලා මහත්මියගේ මග පෙන්වීම යටතේ තාක්ෂණික සහායක ඩබ්.පී.කේ.එන්.හේමචන්ද්‍ර මහතාගේ පූර්ණ අධික්ෂණය යටතේ එම කාර්යයන් ඇස්තමේන්තුවට අනුව නිසි පරිදි ඉටු කරන ලද අතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරු විසින් සහතික කර අවසන් වාර්තාව මේ වන විට ඉදිරිපත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි. |
| | | |
| (iii) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 දරන මාර්ගෝපදේශයට පටහැනි ලෙස පිළිගත හැකි අත්තිකාරම් ගෙවීමේ සුරක්ෂණයක් ලබාගැනීමකින් තොරව රු. 191,369 ක් අත්තිකාරම් මුදල් ගෙවා තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 5.3.11 ප්‍රකාරව වෙළඳපොළ මිළ සැදැහුම් ක්‍රමය යටතේ මෙම මිළ ගණන් කැඳවිම සිදු කර ඇති බැවින්, ලංසු සුරක්ෂණයක් අවශ්‍ය නොවන බැවින් ලංසු සුරක්ෂණයක් ලබා නොගත් බව දන්වනු කැමැත්තෙමි. |
| (iv) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (අ) මාර්ගෝපදේශයට පටහැනිව මෙම කොන්ත්‍රාත්තුව සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරු විසින් වැඩ ආරම්භ කර ඊට අදාළව ඉටු කරන ලද කාර්යයන් සම්බන්ධයෙන් හා කොන්ත්‍රාතුවේ පරිදි අවශ්‍ය වෝල් ප්‍රයිමර් ,තීන්ත වර්ග , පොටි, වැනි අමුද්‍රව්‍යයන් සපයා ගැනීම කර ඇති බවට හා සම්පූර්ණ වැඩවලින් කොටසක් වැඩ නිම වීමක් වෙනුවෙන් ගෙවීම් කිරීම නිර්දේශ කර තාක්ෂණික නිලධාරී විසින් ඉදිරිපත් කරන ලද වැඩ වාර්තාවට යටත්ව එම ලිපිය අනුව මුළු කොන්ත්‍රාත් මුදලින් මූලික ගෙවීමක් කරන ලද බවත්, අත්තිකාරම් වශයෙන් ගෙවීම් සිදු නොකල බවත් කාරුණිකව දන්වනු කැමැත්තෙමි. |
| (ආ) | ප්‍රධාන කාර්යාලයේ තීන්ත ආලේප කිරීම II අදියර - ගිවිසුම්ගත වටිනාකම | |

| | | |
|---|---|---|
| | - රු. 8,692,720 | |
| | ප්‍රධාන කාර්යාලයේ තීන්ත ආලේප කිරීම (II අදියර) සඳහා කොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.1 ඡේදයට පටහැනි ලෙස ජාතික තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රමවේදය අනුගමනය නොකර වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කල බව දක්වමින් ව්‍යාජ ලේඛන හා වැරදි ක්‍රමවේදයන් උපයෝගී කරගෙන කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන තිබුණි. එසේම මෙම කොන්ත්‍රාත්තුව වෙනුවෙන් සකස් කරන ලද ඉංජිනේරු ඇස්තමේන්තුවේ සඳහන් අයිතම 08 ක රේටයන් හා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ රේටයන් අතර සියයට 20 සිට සියයට 167 දක්වා පරාසයක විචලනයන් පැතින අතර, ඒ සම්බන්ධයෙන් තාක්ෂණික ඇගයීම් කමිටුවේ සහ ටෙන්ඩර් මණ්ඩලයේ අවධානය යොමුවී නොතිබුණි.<br><br>තවද, විගණනය විසින් මේ සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු සිදු කරන අතරතුර කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු අතරමග නතර කර තිබූ අතර, සභාව විසින් මෙම කොන්ත්‍රාත්කරුගෙන් කාර්ය සාධන ඇපකරයක්ද ලබාගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් කොන්ත්‍රාත් ආයතනය විසින් අදාල බිල්පත ඉදිරිපත් කර ඇති අතර ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ විගණන හා කළමණාකරන කමිටුව විසින් බාහිර පාර්ශවයකගේ නිර්දේශ මත ගෙවීම් සිදුකරන ලෙසට උපදෙස් ලබා දී ඇත.<br>ඒ අනුව මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්මික නිළධාරිවරයකුගේ සේවය ලබා දෙන මෙන් ඉල්ලීම් කර ඇත.<br>එහෙත් මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්මික නිළධාරිනිය විසින් වෙනත් ආයතන වල ඉදිකිරීම් සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමට නොහැකි බව ප්‍රකාශ කරන ලදි.<br>මේ සම්බන්ධව පැහැදිලි තීරණයක් ලැබෙන තෙක් කොන්ත්‍රාත් ආයතනයේ බිල්පත ගෙවීම තාවකාලිකව නවතා ඇත. |
| 6.1.2 | කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. | |
| (අ) | 2013 මැයි 21 දිනැති අංක 13/0502/639/014 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ඉදිකිරීමට තීරණය කර තිබූ මාතර නිල්වලා යොවුන් උද්‍යානය ඉදිකිරීම වෙනුවෙන් යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය විසින් අදාල ඉඩම් හිමිකරුවන්ට වන්දි හා පොලිය වශයෙන් | ජාතික තරුණ සේවා සභාවට මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන වෙන්වී නොමැති බැවින් මෙහි ඉදිරි ඉදිකිරීම් කටයුතු දක්ෂිණ සංවර්ධන අධිකාරිය වෙත පැවරීම සුදුසු බව යෝජනා කර ඇත. |

| | | |
|---|---|---|
| | එකතුව රු. 142,810,543 ක් ගෙවා තිබූ අතර, 2015 දෙසැම්බර් 31 දින වන විට ජාතික තරුණ සේවා සභාව විසින් ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් උපදේශක ගාස්තු ද ඇතුළුව රු. 7,657,349 ක් වැය කර තිබුණි. එසේ වුවද, 2014 දෙසැම්බර් 31 න් පසු ප්‍රතිපාදන නොලැබීම මත ව්‍යාපෘතිය ඉදිකිරීමේ කටයුතු අතරමග නතර කර තිබුණි. තවද, අදාල ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර තිබූ බවට සාක්ෂි ඉදිරිපත් නොවූ අතර 2017 ඔක්තෝබර් 16 දින සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී එම භූමිය වල් බිහිවී පැවති බව නිරීක්ෂණය විය. ඒ අනුව, රේඛීය අමාත්‍යාංශය සහ ජාතික තරුණ සේවා සභාව විසින් මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද එකතුව රු. 150,467,892 ක් වූ ගෙවීම් නිෂ්කාර්යය වියදමක් බවට පත්වී තිබුණි. | |
| (ආ) | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2017 මාර්තු 28 දිනැති MNPEA/YAD/03/01 දරන ලිපියට අනුව ජාතික තරුණ සේවා සභාව සතු හැඩිගම මාදන්ගහවත්ත නමැති ඉඩමේ විවිධ අවශ්‍යතා සඳහා අගනුවරට පිවිසෙන තරුණ තරුණියන්ගේ කෙටිකාලීන නවාතැන් පහසුකම් සලසා දීම පිණිස ක්‍රීඩා පිටියක් හා නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා ජාතික තරුණ සේවා සභාවේ 2018 අයවැය ඇස්තමේන්තු යෝජනා යටතේ දැක්වීමට උපදෙස් ලබා දී තිබුණු අතර, එම ඉදිකිරීම්වලට අදාල උපදේශක සේවා ලබා ගැනීම, මැනුම් කටයුතු සහ පස් පරීක්ෂා කිරීම වැනි මූලික කටයුතු වෙනුවෙන් තරුණ සේවා සභාව විසින් 2017 සැප්තැම්බර් 18 දින වන විට රු. 2,400,601 ක් ගෙවා තිබුණද 2018 ජුනි 30 දින දක්වා ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණි. තවද, එම උපදේශක ආයතනය සමග ඇතිවී තිබූ නෛතික ගැටළු හේතුවෙන් ඇතිකරගෙන තිබූ ගිවිසුම් අවසන් කර ඉදිරි කටයුතු සඳහා වෙනත් උපදේශන ආයතනයක් තෝරා ගැනීමට කටයුතු කර ඇති බව විගණනයට දැනුම් දී ඇත. | මෙම ව්‍යාපෘතියට අදාලව උපදේශක ආයතනයක් තෝරා ගෙන ඉංජිනේරු ඇස්තමේන්තු හා ගොඩනැගිලි සැලසුම් සකසා අවසන් වී ඇත.<br><br>යෝජිත ඉඩම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතියද ලබාගෙන ඇත.<br>තවද ගොඩනැගිලි අයදුම්පත් අනුමැතිය සඳහා ඉල්ලීම් කර ඇත.<br><br>මෙම ව්‍යාපෘතිය ඉදිකිරීමට අදාල ප්‍රතිපාදන අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත.<br>ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට අවශ්‍ය මුළු ප්‍රතිපාදන ප්‍රමාණය ලැබීමෙන් අනතුරුව ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම් මගින් සුදුසු කොන්ත්‍රාත් ආයතනයක් තෝරා පත්කර ගැනීමට අපේක්ෂිතය. |

| | | |
|---|---|---|
| 6.1.3 | ප්‍රමාද වූ ව්‍යාපෘති | |
| | ජාතික තරුණ සේවා සභාව මගින් 2016 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කර 2017 වර්ෂයේදී නිම කිරීමට නියමිතව තිබූ ගිවිසුම්ගත වටිනාකම රු. 141,910,758 ක් වූ ව්‍යාපෘති 02 ක් සඳහා අවස්ථා දෙකකදී දින දීර්ඝ කිරීම් ලබාදී තිබුණද, 2018 ජූනි 30 දින වන විටද ඉදිකිරීම් නිම කර නොතිබුණු අතර, එදිනට එකතුව රු. 87,153,099 ක් වැය කර තිබුණි. | |
| | දඹුල්ල ස්විස් පුහුණු මධ්‍යස්ථානය නවීකරණය හා වැඩිදියුණු කිරීම. | අභිබූ හා ස්වභාවික හේතූන් නිසා කොන්ත්‍රාත් කාලය (කාල දිගුවක් පමණක් සලකා - Time Only) දීර්ඝ කිරීම සිදුකර ඇත.<br>දිගින් දිගටම කොන්ත්‍රාත්තුව ප්‍රමාද වන බව DEVECO Architects උපදේශක ආයතනය විසින් වැඩබිම් සාකච්ඡාවන්හීදී පෙන්වා දී ඇත.<br>තවද වැඩබිමේදී ජාතික තරුණ සේවා සභාවේ උසස් නිළධාරීන්ගෙන් යුත් විශේෂ කමිටු සාකච්ඡාවන්හීදී කොන්ත්‍රාත්තුව කඩිනමින් අවසන් කර බාර දෙන ලෙස උපදෙස් දී ඇත.<br>සෑම අවස්ථාවකදීම කොන්ත්‍රාත්තුව කඩිනමින් බාර දෙන බවට කොන්ත්‍රාත්කරු එකග වී ඇත.<br><br>එහෙත් මේ වනතෙක් කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතිය මන්දගාමීව සිදුවන බැවින් ඉඩදිය නොහැකි ලෙස කාලයද වැය වන බැවින් උපදේශක ආයතනය විසින් කොන්ත්‍රාත්තුව තහනම් කිරීමට අදාල නෛතික ප්‍රතිපාදන ජාතික තරුණ සේවා සභාවට පෙන්වා දී ඇත.<br>ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව ඇත. |
| | ත්‍රිකුණාමලය ලව්ලේන් පුහුණු මධ්‍යස්ථානය නවීකරණය හා වැඩිදියුණු කිරීම. (II අදියර) | අභිබූ හා ස්වභාවික හේතූන් නිසා කොන්ත්‍රාත් කාලය (කාල දිගුවක් පමණක් සලකා - Time Only) දීර්ඝ කිරීම සිදුකර ඇත.<br>දිගින් දිගටම කොන්ත්‍රාත්තුව ප්‍රමාද වන බව MDL Associates උපදේශක ආයතනය විසින් වැඩබිම් සාකච්ඡාවන්හීදී පෙන්වා දී ඇත.<br>තවද වැඩබිමේදී ජාතික තරුණ සේවා සභාවේ උසස් නිළධාරීන්ගෙන් යුත් විශේෂ කමිටු සාකච්ඡාවන්හීදී කොන්ත්‍රාත්තුව කඩිනමින් අවසන් කර බාර දෙන ලෙස උපදෙස් දී ඇත.<br>සෑම අවස්ථාවකදීම කොන්ත්‍රාත්තුව කඩිනමින් බාර දෙන බවට කොන්ත්‍රාත්කරු එකග වී ඇත.<br>එහෙත් මේ වනතෙක් කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතිය මන්දගාමීව සිදුවන බැවින් ඉඩදිය නොහැකි ලෙස කාලයද වැය වන බැවින් උපදේශක ආයතනය විසින් කොන්ත්‍රාත්තුව තහනම් කිරීමට අදාල නෛතික ප්‍රතිපාදන ජාතික තරුණ සේවා සභාවට පෙන්වා දී ඇත.<br><br>ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතව ඇත. |
| 6.2 | අයවැය පාලනය | |
| (අ) | ජාතික තරුණ සේවා සභාවේ අරමුණු කෙරෙහි ඍජුවම බලපෑම් කරන තරුණ සංවර්ධන වියදම් සඳහා සහ සාමාන්‍ය | මූල්‍ය ප්‍රකාශණයේ 129 වන පිටුවේ විචල්‍යතාවයට හේතු අංක 1 අනුව ආයතන අංශයේ ප්‍රතිපාදන ඉක්මවීම් මිලියන 17 කි. ඒ අනුව ප්‍රතිශතය 1% ක් වේ. මෙයද ඉක්මවීමට හේතුවී ඇත්තේ නව බඳවා |

| | | |
|---|---|---|
| | පරිපාලන වියදම් සඳහා වූ වාර්ෂික ප්‍රතිපාදනවල ඌන උපයෝජනයන් නිරීක්ෂණය වූ අතර, ආයතන අංශයේ, ඉදිකිරීම් අංශයේ හා කාර්මික හා වෘත්තීය පුහුණු අංශයේ ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබුණි. ඒ අනුව වාර්ෂික අයවැය ලේඛනය, මූල්‍ය පාලනයේ උපක්‍රමයක් ලෙස ප්‍රමාණවත් පරිදි යොදාගෙන නොතිබූ බව නිරීක්ෂණය විය. විස්තර ඇමුණුම 01 හි දැක්වේ. | ගැනීම් හා ඊට අදාළ දීමනා ගෙවීම් කර ඇති බැවිනි.<br>ඉදිකිරීම් අංශයේ ප්‍රතිපාදන ඉක්මවූ ප්‍රතිශතය 26 % ක් බව විගණනය මගින් පෙන්වා දී ඇත. මෙම වියදම් එම වර්ෂයේ ආයතනික අවශ්‍යතාවය අනුව වැයදැරීම් සිදුකර ඇත.<br>කාර්මික හා වෘත්තීය පුහුණු අංශයේ ප්‍රතිපාදන ඉක්මවීම 109% ක් ලෙස විගණනයේදී පෙන්වාදී ඇතත්, එම අංශයේ ප්‍රතිපාදන 15% ක ඉතිරියක් ලෙස මූල්‍ය ප්‍රකාශණයේ 128 වන පිටුවේ හෙළිදරව් කර ඇත. එහි අදාළ ප්‍රතිපාදනය වන්නේ රු.26,932,845 ක් වන අතර, එම වාර්තා පිළියෙල කිරීමට අදාළ කර ඇත්තේ භාන්ඩාගාර/අභ්‍යන්තර ඉපයීම්/අමාත්‍යාංශ ප්‍රතිපාදන පමණි. ඒ අනුව එම ප්‍රතිපාදන වලින් වියදම රු.22,964,617 ක් වන අතර ඊට අමතරව වෙනත් බාහිර ආයතන වල වියදම් ඇතුලත්ව මුළු වැයදැරීම් රු.56,289,190 ක් වේ. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ අයවැය විචලතා සහ වියදම් සාරාංශ උපලේඛන පරීක්ෂාවේදී වැය විෂයන් 2 ක වියදම එකතුව රු. 4,642,281 කින් වැඩියෙන්ද වැය විෂයන් 4 ක වියදම එකතුව රු. 37,010,655 කින් අඩුවෙන්ද අයවැය විචලතාවය යටතේ දක්වා තිබුණි. | අය වැය විචල්‍යතාවය නිවැරදිව සකස් කර ඇත. අතපසුවීමකින් මූල්‍ය ප්‍රකාශනයේ වියදම් වාර්තාවේ පුහුණු මධ්‍යස්ථාන වියදම් සඳහා ඇතුලත් විය යුතු රු.4,327,225/89 ක මුදලක් කාර්මික හා වෘත්තීය පුහුණු අංශයේ වියදම් තුළ ඇතුලත් වී ඇත. |
| 6.3 | වාර්ෂික වාර්තා සභාගත කිරීම | |
| | 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය ප්‍රකාරව අදාල මුදල් වර්ෂය අවසන් වී මාස 10 ක් ගතවීමට පෙර වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට සැලැස්විය යුතු වුවද 2016 වර්ෂය වෙනුවෙන් වූ වාර්ෂික වාර්තාව 2018 ජූලි 31 දින වන විටද පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | 2016 වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට සභාගත කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම පිණිස තරුණ කටයුතු, ව්‍යාපෘති කළමණාකරන සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය වෙත යැවීමට සූදානම් කර ඇත. |
| 6.4 | නොවිසඳී ඇති විගණන ඡේද | |
| | 2015 වර්ෂයේ විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී ඇති ආයතනයේ මූල්‍ය හා පරිපාලන කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් බලපෑමක් සිදුවී ඇති විගණන සොයාගැනීම් 02 ක් සම්බන්ධයෙන් හා ඉකුත් වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දුන් ප්‍රමාණවත් විගණන සොයාගැනීම් 05 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය නිමවන විටත් අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද විගණන සොයාගැනීම් 04 ක් සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව විගණනයට පැහැදිලි පිළිතුරක් ලබාදීමට අපොහොසත් වුණි. | මෙයට අදාළ පිළිතුරු මෙම වාර්තාවේ අවසන් පිළිතුරට පසුව සිට ඉදිරිපත් කර ඇති බව කාරුණිකව සලකන්න. |
| | පද්ධති හා පාලනයන් | |

| 7. | | |
|---|---|---|
| | විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලනයන් අඩුපාඩු වරින් වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ. | |
| (අ) | ප්‍රසම්පාදනය<br><br>රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූල වන පරිදි විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාවලියක් ස්ථාපිත කිරීම හා ඒ තුළින් රජයේ මුදල් කාර්යක්ෂමව ඵලදායීව හා ආර්ථිකව උපයෝජනය කිරීම. | පෙන්වාදී ඇති පරිදි ඉදිරි කටයුතු සිදුකිරීමට පියවර ගන්නා බව කාරුණිකව දන්වමි. |
| (ආ) | අයවැය පාලනය<br><br>රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ උපදෙස් පරිදි ක්‍රියාකාරී සැලැස්මට අනුකූල වන පරිදි අය වැය ගත මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කළ යුතු බව හා කාලීන පදනමක් මත කාර්ය සාධනය ඇගයීමට ලක්කර අවශ්‍ය සංශෝධන කළ යුතු වීම. | 2018 වර්ෂයේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඇ) | ගිණුම්කරණය<br><br>ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කරමින් මූල්‍ය තොරතුරු නිවැරදිව වාර්තා වන පරිදි විධිමත් ගිණුම්කරණ පද්ධතියක් පවත්වා ගැනීම. | දැනටමත් මේ අනුව කටයුතු කරමින් පවතී. |
| (ඈ) | කාර්ය මණ්ඩල පරිපාලනය<br><br>අනුමත කාර්යය මණ්ඩලයට සහ බඳවා ගැනීමේ පරිපාටියට අනුකූලව බඳවාගැනීම්, උසස් කිරීම්, පුහුණුව හා සංවර්ධනය කිරීම හා ආයතනයේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමට හැකිවන පරිදි මානව සම්පත් සැලැස්මක් සකස් කර සමාලෝචනය කර යාවත්කාලීන කිරීම. | පෙන්වාදී ඇති පරිදි ඉදිරි කටයුතු සිදුකිරීමට පියවර ගන්නා බව කාරුණිකව දන්වමි. |
| (ඉ) | පුහුණු පාඨමාලා පැවැත්වීම | |

| | | |
|---|---|---|
| | ආයතන විසින් ක්‍රියාත්මක කරන පුහුණු වැඩසටහන් සඳහා උපදේශකවරුන් බඳවාගැනීම හා ගෙවීම් කිරීම මෙන්ම වර්තමාන තරුණ අවශ්‍යතා සපුරාගත හැකි පරිදි පුහුණු වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කිරීම. | පෙන්වාදී ඇති පරිදි ඉදිරි කටයුතු සිදුකිරීමට පියවර ගන්නා බව කාරුණිකව දන්වමි. |
| (ඊ) | වත්කම් පාලනය<br><br>සභාව සතු වත්කම්වල ආරක්ෂාව හා පැවැත්ම තහවුරු වන පරිදි විධිමත් ලේඛන පවත්වා ගැනීම හා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මඟින් හෙළිදරව් වන කරුණු පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. | සභාව සතු වත්කම් වල ලේඛන පිළියෙළ කර ගෙන යාම සහ භාණ්ඩ සමීක්ෂණ මගින් හෙළිදරව් වන අඩුපාඩු ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. |

නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු විගණන නිරීක්ෂණ.

2016 විගණකාධිපති නිරීක්ෂණය

වාර්තාවේ ඡේදයට

යොමුව

2.4 2015 වර්ෂයට අදාලව සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණයේදී සමීක්ෂණ මණ්ඩල නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757(2) පරිදි කටයුතු කර නොතිබුණි.

පිළිතුර:-

2015 වර්ෂයේ හා ඊට පෙර වර්ෂ වලට අදාළව ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන ගබඩාවෙන් නිකුත් කර තිබූ 2015.12.31 දිනට අදාළ භාණ්ඩ ඌණතා වාර්තාව අනුව නිවැරදිව නම, තනතුර සඳහන් ජාතික තරුණ සේවා සභාවේ දැනට සේවය කරන සියළු නිලධාරින්ට භාණ්ඩ ඌණතා නිරවුල් කරන ලෙසට ලිපි යොමු කර ඇත. එම ලිපි අනුව නිරවුල් කල අයගේ ලේඛණයක් සකස් කර ඇත. විවිධ හේතූන් මත යම් යම් සහන ඉල්ලා ලිපි යොමු කර ඇති අයවළුන් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමටත්, නිරවුල් කිරීම් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් නොගත් නිලධාරින් සම්බන්ධයෙන් මේ වන විට වැටුපෙන් අයකිරීම් කෙරෙමින් පවතී.

4.4 1999 ඔක්තෝබර් 11 දිනැති අංක 1101/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් කෘෂිකාර්මික හා සත්ත්ව පාලන කටයුතු සඳහා භාවිතා කිරීමේ කොන්දේසි මත රු. 3,750,000 ක වටිනාකමකට 1999 සැප්තැම්බර් 14 දින සභාවට පවරා දී තිබුණු අක්කර 26 යි රූඩ් 01 යි පර්. 15.5 ක ඉඩමෙන් අක්කර 11 ක් පමණ කොටස නීත්‍යානුකූල පැවරීමකින් තොරව භාණ්ඩාගාර අනුමැතිය සහ විෂය භාර අමාත්‍යතුමියගේ එකඟතාවය මත 2007 වර්ෂයේ සිට ආරක්ෂක අමාත්‍යාංශයේ පුහුණු මධ්‍යස්ථානයක් වෙනුවෙන් ලබාදී තිබුණි.

පිළිතුර:-

4.5 ප්‍රධාන කාර්යාලයේ ගබඩාව තුළ වසරකට අධික කාලයක සිට රු. 1,784,200 ක් වටිනා කාණ්ඩ 05 කට අයත් ක්‍රීඩා භාණ්ඩ 1,972 ක් ද, 2016 යෞවන ක්‍රීඩා උළෙල වෙනුවෙන් 2016 සැප්තැම්බර් මාසයේදී මිලදීගෙන ගබඩාවට භාර දී තිබූ වටිනාකම රු. 416,058 ක් වූ හිස් වැසුම් (කැප්) 2,550 ක් ද විගණන දිනය වූ 2017 අප්‍රේල් 27 වන විටත් නිෂ්කාර්යයව තිබුණි.

4.7 (අ) සභාවට අයත් පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාල හා පුහුණු මධ්‍යස්ථානවල නිලධාරීන්ගේ පැමිණීම හා පිටවීම සටහන් තැබීම වෙනුවෙන්, ඇඟිලි සලකුණු යන්ත්‍ර 60 ක් මිලයට ගැනීම සඳහා අවස්ථා දෙකක දී සභාව විසින් කාර්යසාධන ඇපකරයක් ලබාගැනීමකින් තොරව සහ යන්ත්‍ර නියමිත ප්‍රමාණයෙන් හා අපේක්ෂිත ගුණත්වයෙන් සපයා ඇති බවට තහවුරුවකින් තොරව එකතුව රු. 2,793,167 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. ඉන් යන්ත්‍ර 09 ක් විගණන දිනය වූ 2017 මැයි 31 දින වන විටත් සපයා නොතිබුණි. සපයන ලද යන්ත්‍ර 51 න් අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගැනීමට හැකි වී තිබුණේ යන්ත්‍ර 3 ක් පමණි. සවිකරන ලද යන්ත්‍ර 29 කට මෘදුකාංග ඇතුළත් කර නොතිබුණු අතර මෘදුකාංග ඇතුළත් කර ඇතත් පැමිණීමේ වාර්තා ලබාගැනීමට නොහැකිවූ යන්ත්‍ර 16 ක් පැවතුණි.

4.8 (අ) (I) දිස්ත්‍රික්ක 12 කින් ලැබුණු තොරතුරු අනුව, 2016 නොවැම්බර් 12 දින වන විට නිම කළ යුතුව තිබූ ව්‍යාපෘති 493 කින් සභාව විසින් රු. 12,150,000 ක් නිදහස් කරන ලද ඇස්තමේන්තු පිරිවැය රු. 75,841,473ක් වූ ව්‍යාපෘති 162 ක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් නිම කර නොතිබුණි.

(II) 2017 පෙබරවාරි 14 සිට 17 දින දක්වා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සිදුකල භෞතික විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති 26 ක් අතරින් ව්‍යාපෘති 6 කට අදාලව තාක්ෂණික නිලධාරී විසින් සහතික කළ වැඩවල වටිනාකම රු. 1,288,196 ක් වුවද සත්‍ය වශයෙන් නිමකර තිබූ වැඩවල වටිනාකම රු. 678,366 ක් පමණ විය.

අරමුදල් නොමැති වීම මත ඇස්තමේන්තු ගත පිරිවැය රු. 814,252 ක් වූ ව්‍යාපෘති 05 ක් අත්හැර තිබුණු අතර ඇස්තමේන්තුගත පිරිවැය රු. 5,369,000 ක් වූ වෙනත් ව්‍යාපෘති 17 ක ඉදිකිරීම් කටයුතු 2017 පෙබරවාරි අවසන් වන විටත් නිම කර නොතිබුණි.

එමෙන්ම අපේක්ෂිත ප්‍රමිතියට අනුව සිදු නොකළ වැඩවල පිරිවැය රු. 831,234 ක් වූ ව්‍යාපෘති 04 ක් පැවති අතර වැඩ නිමකර ඇතත් ප්‍රයෝජනයට නොගෙන තිබුණු රු. 814,120 ක පිරිවැය වූ ව්‍යාපෘති 03 ක් වෙනුවෙන් සභාව රු. 225,000 ක් වැයකර තිබුණි.

5.2 ඡේදයෙහි සඳහන් පහත ඡේදයන්

2015 – 4.4 (අ) නීති විද්‍යාලයේ ශිෂ්‍ය සංගමය නියෝජනය කළ සිසුන් වෙනුවෙන් බටංගල පුහුණු මධ්‍යස්ථානයේ 2014වර්ෂයේ අගෝස්තු මාසයේදී පැවැත්වූ පුහුණු වැඩසටහන වෙනුවෙන් 2015 වර්ෂයේදී ගෙවා තිබුණු රු. 818,000 ක මුදල සඳහා ව්‍යාජ ලේඛන ඉදිරිපත් කර තිබීම.

2015 – 5.4 (ඇ)සීමාසහිත නැටුම් හා සංගීත සමාගමෙහි ආයෝජන විධිමත් අනුමැතියකින් තොරව පොත්පත්වලින් ඉවත් කිරීම.

පිළිතුර:- මීට අදාලව අවස්ථා කිහිපයකදීම අමාත්‍යාංශ ලේකම් මගින් අධ්‍යක්ෂ ජෙනරාල් , රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය වෙත ලිපි ඉදිරිපත් කර ආයෝජන අගය කපා හැරීම සම්බන්ධයෙන් භාණ්ඩාගාර අනුමැතිය ඉල්ලා ඇත. තවද ඊට අදාලව කැබිනට් පත්‍රිකාද යොමු කර ඇති අතර, ඊට පසුව අමාත්‍යාංශය සමග සාකච්ඡා කර නැවත භාණ්ඩාගාරය වෙත අනුමැතින් සඳහා ලිපි ඉදිරිපත් කර ඇත. මෙතෙක් අනුමැතිය ලැබී නොමැත.

ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවූ නිරීක්ෂණ

2016 විගණකාධිපති වාර්තාවේ ඡේදයට යොමුව

නිරීක්ෂණය

4.2 (අ) ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන් සැලැස්මට අනුව 2014 වර්ෂයෙන් ආරම්භ කර 2016 වර්ෂය අවසන් වන විට රත්මලාන පුහුණු මධ්‍යස්ථානයේ ගොඩනැගිලි නවීකරණය කර නව පාඨමාලා හඳුන්වාදීම තුළින් ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කල යුතුව තිබුණි. අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට හා ඉදිකිරීම් කටයුතු නඩිනමින් නිම කිරීමට සැලසුම්ගත වැඩපිළිවෙලක් සකස් කර, පවතින ගොඩනැගිල්ල නවීකරණය කරනු වෙනුවට 2014 වර්ෂයේදී නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම ආරම්භ කර තිබුණි. 2016 වර්ෂය නිම වන විට ඒ සඳහා රු. 158,787,849 ක් වැය කර තිබුණ ද, එහි ඉදිකිරීම් විගණන දිනය වූ 2017 මැයි 30 දින වන විටත් නිම කර නොතිබුණි. තවද, එම පුහුණු මධ්‍යස්ථානය පවත්වාගෙන යාමට 2014 වර්ෂයේ සිට කුලියට ලබාගත් බාහිර ගොඩනැගිල්ලේ සංවර්ධන කටයුතු සහ කුලිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය දක්වා එකතුව රු. 34,968,988 ක වියදමක් දරා තිබුණි.

4.7 (ආ) සභාව විසින් යොවුන් පාර්ලිමේන්තු වැඩසටහන යටතේ මන්ත්‍රීවරුන් වෙත බෙදා හැරීම සඳහා රු. 15,859,500 ක් වැයකර 2015 දෙසැම්බර් 31 දින ටැබ් පරිගණක 327 ක් මිලදී ගෙන තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් එම යන්ත්‍ර හොඳ ක්‍රියාකාරී තත්වයේ පවතින බවට සහතික කර තිබුණද, යන්ත්‍ර 23 ක් සැපයුම්කරු ගබඩාවට භාරදෙන අවස්ථාව වන විටත් ක්‍රියාකාරී තත්ත්වයේ නොපැවතුණ බව නිරීක්ෂණය විය. තවද, සැපයූ ටැබ් යන්ත්‍ර බොහෝ දෝෂ සහිත බව මන්ත්‍රීවරුන් විසින් විගණනයට ප්‍රකාශ කර තිබුණි.

5.2 ඡේදයෙහි සඳහන් පහත ඡේදයන්

2015 – 4.4 (ආ)හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානයට ආහාර සැපයීමේ කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් සිදුවී තිබූ අක්‍රමිකතා.

2015 – 4.7 සභාව සතු කැබ් රථ දෙකක් පිළිවෙළින් 2012 නොවැම්බර් 06 හා 2015 අප්‍රේල් 01 දින සිට අවිධිමත් පරිදි සීමාසහිත තරුණ සේවා සමාගමේ පරිහරණය සඳහා ලබාදී තිබුණි.

පිළිතුර:-සී/ස තරුණ සේවා සමාගම වෙත අනුයුක්ත කර ඇති, කැබ් රථ 02 ක සඳහා මසක කුලිය ලෙස 51-7262 කැබ් රථය සඳහා රු.25,000.00 ක මුදලක් ද, PC - 3675 කැබ් රථය සඳහා රු.50,000.00 ක මුදලක් ද ජාතික තරුණ සේවා සභාව වෙත ගෙවන ලෙස දන්වා යවා ඇත.

# ඇමුණුම් 4

## වාර්ෂික වාර්තාව - 2017

### ජාතික තරුණ සේවා සභාව

**අ. ආයතනයේ කාර්යසාධනය**

**1. ප්‍රතිපාදන සැලසීම**

2017 වර්ෂය තුළ ජාතික තරුණ සේවා සභාවේ සමස්ත ලැබීම් වලින් රු. මි. 1,385.9 ක් මහා භාණ්ඩාගාරයෙන් ද අමාත්‍යාංශය හා රාජ්‍ය ආයතන හරහා රු. මි. 1,263 ක් ද ලැබී ඇත. එයින් රු. මි. 1,825.7 ක් පුනරාවර්තන වියදම් වශයෙන් හා රු. මි. 892.3 ක් සංවර්ධන හා ප්‍රාග්ධන වියදම් වශයෙන් වැයකර ඇත. එම වසරේ ජාතික තරුණ සේවා සභාව සිය අභ්‍යන්තර ආදායම් මාර්ගවලින් රු. මි. 203.23 ක් උපයාගෙන තිබේ.

**2. සංවර්ධන වැඩසටහන්**

ජාතික තරුණ සේවා සභාව වර්ෂය තුළ ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන් යටතේ තරුණ කුසලතා සංවර්ධනය සඳහා වූ දේශීය වැඩසටහන් 13,601 ක් 917,835 ක තරුණ පිරිසකගේ සහභාගීත්වයෙන් පවත්වා ඇත. ඒ සඳහා වැයකර ඇති මුදල රු. මි. 259.84 කි. 2017 දී පැවැත්වූ තරුණ ක්‍රීඩා සංවර්ධන ක්‍රියාකාරකම් අතර 29 වැනි ජාතික යෞවන ක්‍රීඩා උළෙල, 30 වැනි තරුණ සේවා රූපවාහිනී වොලිබෝල් තරඟාවලිය හා ක්‍රීඩා පුහුණු කඳවුරු කැපී පෙනේ. සෞන්දර්ය කුසලතා සංවර්ධන ක්‍රියාකාරකම් යටතේ පැවැත්වූ ජාතික යෞවන සම්මාන තරඟාවලිය හා සම්මාන උළෙල, ජාතික යොවුන් නාට්‍ය උළෙල කැපී පෙනේ. ඊට අමතරව නාට්‍ය හා රංග කලා ඩිප්ලෝමා පාඨමාලා, යොවුන් නාට්‍ය දර්ශණ හා ජාතික සංස්කෘතික වැඩසටහන් පැවැත්වීමට ද ජාතික තරුණ සේවා සභාව කටයුතු කර ඇත.

**3. කාර්මික හා වෘත්තීය පුහුණු ක්‍රියාකාරකම්**

කාර්මික හා වෘත්තීය පුහුණු ක්‍රියාකාරකම් යටතේ ජාතික තරුණ සේවා සභාව පුහුණු මධ්‍යස්ථාන 49කදී පැවැත්වූ පූර්ණකාලීන හා අර්ධකාලීන පුහුණු පාඨමාලා 438 ක් සඳහා බඳවාගත් සිසුන් සංඛ්‍යාව 22,726 ක් වේ. එයින් සිසුන් 16,477 ක් එනම් 72.5% ක් පාඨමාලා අවසන් කර ඇත. ජාතික තරුණ සේවා සභාව 2017 වර්ෂයේදී වෘත්තීය පුහුණු සංවර්ධනය සඳහා රු. මි. 70.54 ක් වැය කර ඇත.

**4. ව්‍යවසායකත්ව හැකියා සංවර්ධනය**

ජාතික ව්‍යවසායකත්ව හැකියාවන් වර්ධනය කිරීම අරමුණු කරගෙන ජාතික තරුණ සේවා සභාව විසින් පැවැත්වූ වැඩසටහන් සඳහා 2017 දී රු. මි. 2.6 ක් වැය කර ඇති අතර ඒ යටතේ පැවැත්වූ පුහුණු වැඩසටහන් 21 ක් සඳහා 671 ක් සහභාගීවී ඇත

**5. ගොවිපල සංවර්ධනය**

ජාතික තරුණ සේවා සභාව 2017 වර්ෂය තුළ ගොවිපල මධ්‍යස්ථාන 18 ක් නඩත්තු කර පවත්වාගෙන ගොස් ඇති අතර මධ්‍යස්ථාන 08 කදී කෘෂි පාඨමාලා 14 ක් පවත්වා ඇත. ඒ සඳහා තරුණ තරුණියන් 222 ක් සහභාගිවී තිබේ.

**6. ජාත්‍යන්තර තරුණ සබඳතා**

ජාත්‍යන්තර තරුණ සබඳතා විෂයයට අදාළව 2017 දී පැවැත්වූ තරුණ හුවමාරු වැඩසටහන් සඳහා 434 ක්, ජගත් තරුණ නෞකා වැඩසටහන සඳහා 12 ක් හා කලාපීය තරුණ සමුළු හා වැඩමුළු සඳහා 72 ක් වශයෙන් තරුණ නියෝජිතයින් සහභාගීවී ඇත. එඩින්බරෝ ආදිපාද ජාත්‍යන්තර තිළිණ වැඩසටහන ජාතික තරුණ සේවා සභාව විසින් ක්‍රියාත්මක කර ඇති අතර 2017 දී එම වැඩසටහනේ විධිමත් බලපත්‍රය ලබා ගැනීමට ද සමත්ව ඇත. තවද මෙම තිළිණ පදනමේ අන්තර්ජාතික සභාවට ආසියා පැසිපික් කලාපය නියෝජනය කරමින් ප්‍රථම වරට තේරී පත්වීමට තරින්ද්‍රා අරුමප්පෙරුම මෙනෙවියට හැකි වී තිබේ.

**7. යොවුන් පාර්ලිමේන්තු වැඩසටහන**

රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය සඳහා හා ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට තරුණ ප්‍රජාවට ඉඩසැලසීමේ අරමුණ ඇති ව යොවුන් පාර්ලිමේන්තු වැඩසටහන 2017 දී ද ක්‍රියාත්මක කර ඇත. එහිදී "Youth with Talent තුරුණු ශ්‍රම ශක්ති" ප්‍රජා සංවර්ධන ව්‍යාපෘති 3000 වැඩසටහන ග්‍රාමීය හා නාගරික ජනතාව මුහුණ දෙන විවිධ ගැටළු හඳුනාගෙන ඒවාට විසඳුම් සෙවීම සඳහා තරුණ ප්‍රජාව සහභාගි කරවා ගැනීමේ අරමුණ ඇතිව ක්‍රියාත්මක කර තිබේ. තවද, Youth with Talent Show - 2017 නමින් කුසලතාවයෙන් හා දක්ෂතාවයෙන් පිරිපුන් සුවිශේෂී තරුණයා සෙවීමේ ප්‍රසාංගික වැඩසටහනක් ද ජාතික තරුණ සේවා සභාව විසින් 2017 වර්ෂයේ ක්‍රියාත්මක කර ඇත.

**8. කාර්ය මණ්ඩල කටයුතු හා සංවර්ධනය**

වර්ෂය තුළ ජාතික තරුණ සේවා සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලයට නිලධාරීන් 149 ක් අළුතෙන් බඳවාගෙන ඇත. වර්ෂය තුළ රු. මි. 10.07 ක් වැය කරමින් නිලධාරීන් 3,183 ක් සඳහා නිලධාරී පුහුණු වැඩසටහන් 46 ක් ද, ධාරිතා සංවර්ධන වැඩසටහන් 06 ක් පවත්වා නිලධාරීන් 116,930 ක් පුහුණු කිරීමට ද කටයුතු කර ඇත.

**9. ඉදිකිරීම් කටයුතු**

මීට අතිරේකව 2017 දී අමාත්‍යාංශ ප්‍රතිපාදන රු. මි. 900 යොදවා ඉදිකිරීම් හා නවීකරණ ව්‍යාපෘති 27 ක් ද නිපුණතා ආංශික වැඩසටහන යටතේ ලැබුණු රු. මි. 80 යොදවා ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කිරීමට ද ජාතික තරුණ සේවා සභාව කටයුතු කර ඇත.

**ආ. කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග**

ආයතනයේ කාර්යසාධනය වර්ධනය කර ගැනීම සඳහා ඉදිරියේදී අනුගමනය කිරීමට අපේක්ෂිත කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

**1. කෙටිකාලීන ක්‍රියාමාර්ග**

1. නිලධාරී දක්ෂතා හඳුනාගෙන ඔවුන් නියමිත පරිදි ස්ථානගත කිරීම
2. පෞද්ගලික, රාජ්‍ය හා රාජ්‍ය නොවන දේශීය හා විදේශීය ආයතන සමඟ හවුල්කාරීත්වයෙන් වැඩ කිරීම
3. ජාතික තරුණ සේවා සභාව සමඟ අත්වැල් බැඳ සිටින තරුණ ප්‍රජාවගේ දැනුම හා කුසලතා (ක්‍රීඩා, සෞන්දර්ය, වෘත්තීය පුහුණු) යනාදි සංවර්ධනය සඳහා වැඩසටහන් දියත් කිරීම
4. ආර්ථික සවිබල ගැන්වීමට අවශ්‍ය කාලීන පුහුණු, තාක්ෂණික දැනුම හා පහසුකම් සැපයීම
5. සංස්කෘතික, අධ්‍යාපනික, දේශපාලනික ක්ෂේත්‍රයන් හරහා තරුණ ප්‍රජාව තුළ අන්‍යෝන්‍ය අවබෝධය ඇති කිරීම හා නායකත්වය වර්ධනය කිරීම

**2. මධ්‍යකාලීන ක්‍රියාමාර්ග**

1. ඵලදායී සේවකයන් සඳහා අවශ්‍ය වන තාක්ෂණික පද්ධති (System) වර්ධනය කිරීම
2. සුහසාධනය, අභිප්‍රේරණය හා වර්ධනය තුළින් නිපුණ කාර්ය මණ්ඩලයක් ඇති කිරීම සඳහා පුහුණු අවස්ථා ලබා දීම
3. පරිපාලන ව්‍යුහය නවීකරණය කිරීම
4. තරුණ කුසලතා වර්ධනය සඳහා ජාතික හා ජාත්‍යන්තරව හඳුන්වා දෙන නව වැඩසටහන්වලට අනුකූලව ක්‍රියාත්මක වැඩසටහන් නවීකරණය කිරීම
5. තරුණයන්ගේ ආර්ථිකය සවිබල ගැන්වීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම
6. ශ්‍රී ලාංකික තරුණයන් අතර ශ්‍රී ලාංකේය අභිමානය ඇති කිරීම

# ඇමුණුම 5

**ඇ. විගණන විමසුම් සම්බන්ධ කරුණු**

2017 වර්ෂය ඉදිරිපත්ව ඇති විගණන විමසුම් මගින් පෙන්වා දී ඇති කරුණු නිවැරදි කිරීම සඳහා ජාතික තරුණ සේවා සභාව විසින් ගනු ලැබ ඇති සහ ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

| විගණන විමසුම් අංකය | විගණන විමසුම හා එමගින් පෙන්වා දී ඇති කරුණු | නිවැරදි කිරීමට ගනු ලැබූ හා ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග |
|---|---|---|
| VTY/A/NYSC / 2016/05 | ඇඟිලි සලකුණු යන්ත්‍ර මිලදී ගැනීම පිළිබඳ පරීක්ෂාව. | විගණන විමසුමට පිළිතුරු යොමුකරන අවස්ථාව වන විට ඇඟිලි සළකුණු යන්ත්‍ර 54 ක් සවිකර ඇතිබවත්, තවත් යන්ත්‍ර 6 ක් සවිකිරීමට ඇති බවත් වාර්තා වේ.<br><br>සවිකර ඇති යන්ත්‍ර අතුරින් මෘදුකාංග ඇතුලත් නොකිරීම හේතුවෙන් ක්‍රියාකාරී තත්ත්වයේ නොමැති යන්ත්‍ර, මෘදුකාංග ඇතුලත් කලද ක්‍රියාකාරී තත්ත්වයේ නොමැති යන්ත්‍ර, පැමිණීම් වාර්තා ලබාගත නොහැකි වීම, අකුණුසැර වැදීම හේතුවෙන් අක්‍රියවීම් හා අක්‍රිය තත්ත්වයේ පවතින යන්ත්‍ර පිළිබඳව හා ඒවා නැවත සකස් කිරීම සඳහා සැපයුම්කරු වෙත දැනුම් දී ඇත.<br><br>විමසුම මගින් පෙන්වා දී ඇති ප්‍රසම්පාදන ක්‍රමවේදයේ අඩුපාඩු මගහරවා ගැනීම සඳහා කටයුතු කරන ලෙස අදාල නිළධාරීන්ට උපදෙස් දී ඇත. |
| අවි/විවි.වි/06/2016/02 | අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තා - 2016. | මෙම විමසුම මගින් පෙන්වා දී ඇති අභ්‍යන්තර විගණන පරීක්ෂණ වාර්තා 10 සම්බන්ධව මේ වන විට ඉදිරි කටයුතු අවසන් කර ඇත. |
| VTY/A/NYSC / 2016/08 | යොවුන් පාර්ලිමේන්තු වැඩසටහන යටතේ ටැබ් පරිගනක මිලදී ගැනීම (පිරිවැය රු.15,859,500). | 2015 වර්ෂයේ කාර්යසාධන හා ඇගයීම් අංශය වෙත ත්‍යාග හා තිළිණ වැය විෂය යටතේ වෙන්කරන ලද ප්‍රතිපාදන හා යොවුන් පාර්ලිමේන්තු වැඩසටහන සඳහා අමාත්‍යාංශය වෙතින් ලබාදෙන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් 2015.12.29 දින ටැබ් පරිගනක මිලදී ගැනීම සඳහා ඇණවුම් ඉදිරිපත් කරන ලදි.<br><br>ටැබ් පරිගනක මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධව පෙන්වා දී ඇති අඩුපාඩු **130** අවම කර ගැනීම සඳහා උපදෙස් ලබා දී ඇත |
| | යූත් ගොට් ටැලන්ට් ව්‍යාපෘතිය | විමසුමෙන් පෙන්වා දී ඇති ව්‍යාපෘති වලට |

| | | |
|---|---|---|
| VTY/A/NYSC / 2016/09 | යටතේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් පිළිබඳ විගණනය ත්‍රිකුණාමලය. | අදාලව වියදම් තහවුරු කර ගැනීමට අදාල වන සාක්ෂි පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් ලබාදෙන ලෙසට පළාත් අධ්‍යක්ෂ(නැගෙනහිර) වෙතට දන්වා ඇති අතර, ඉදිරියේ දී මෙම කරුණු සම්බන්ධව දැඩි අවධානයකින් කටයුතු කරන ලෙසට උපදෙස් ලබා දී ඇත. |
| VTY/A/NYSC / 2016/10 | 2016 යොවුන්පුරය ජාතික වැඩසටහන සඳහා ටී ෂර්ට් මිලදී ගැනීම (පිරිවැය රු. 9,973,220) . | අවුරුදු ගනණාවකට පසු නැවත ක්‍රියාත්මක කරන ලද යොවුන්පුර ජාතික වැඩසටහන සම්බන්ධ සැලසුම් කර ගැනීමේ දී ප්‍රසම්පාදන අවශ්‍යතා පෙළගස්වා ගැනීම එක්වරම සිදුකර ගැනීමට අපහසුවීම හේතුවෙන් ප්‍රසම්පාදන පුවත්පත් දැන්වීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලබාදීමට අපොහොසත් විය. මේ හේතුව නිසා අණවුම් කරන ලද ටී ෂර්ට් 13,500 සඳහා මිළ ගණන් ලබා ගැනීම සඳහා ඇණවුම් භාරදීම,ඇණවුම නිම කිරීම සඳහා යන කරුණු වලට ප්‍රමාණවත් කාලයක් ලබා දීමට නොහැකි විය. මෙම හේතූන් නිසා විගණන විමසුමෙන් විමසුමට ලක්කර ඇති අඩුපාඩු සිදුවී ඇති බව නිරීක්ෂණය කරමි. |
| VTY/A/NYSC / 2016/11 | ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ ජාතික තරුණ සේවා සභාවට අයත් පුහුණු මධ්‍යස්ථාන සඳහා පරිගණක මිලදී ගැනීම (රු.35,414,531.00) | ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහන යටතේ පරිගනක මිලදී ගැනීම සඳහා ලබාදෙන ලද ප්‍රතිපාදන මගින් භාණ්ඩ මිලදී ගැනීම 2015 වර්ෂයේම සිදුකර අවසන් කළ යුතුවූ බැවින් 2015.10.13 වන දින සිට ඉදිරි කාලසීමාව පිළිබඳව සලකා බලා වෙලෙඳ පොල මිල සැදැහුම් ක්‍රමය අනුගමනය කරනලදි.<br>ටැබ් පරිගනක මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධව පෙන්වා දී ඇති අඩුපාඩු අවම කර ගැනීම සඳහා උපදෙස් ලබා දී ඇත. |
| VTY/A/NYSC / 2016/13 | නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනට අදාල කාර්ය සාධනය. | 2016 වර්ෂය අවසන් වන විට මධ්‍යස්ථාන 10 ක වැඩකටයුතු අවසන් කිරීමට ප්‍රථම සැලැස්මෙන් අනුමත කර තිබුණද ලබාදුන් ප්‍රතිපාදන වලට යටත්ව ඉන් මධ්‍යස්ථාන 06 ක නවීකරණ කටයුතු සිදුකරමින් පවතී. ඉතිරි මධ්‍යස්ථාන 04 ව්‍යාපෘතියේ ප්‍රතිපාදන නිදහස් වන ආකාරයට නවීකරණය කිරීමට සැලසුම් කර ඇත. |
| VTY/A/NYSC /2016/03 | පවිත්‍රතා සේවා කටයුතු සපයා ගැනීම. | 2015 වර්ෂයේ සේවා ලබා ගැනීමේ දී විධිමත් පරිදි ගිවිසුම්ගත නොවීමේ තත්ත්වයන් මේ වන විට නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| VTY/A/NYSC /2016/06 | සංස්කෘතික අංශයේ නිළධාරීන් සේවයට වාර්තා කිරීම පිළිබඳ විගණනය | විමසුමට ලක්වූ නිළධාරීන් වෙතින් හේතු විමසා එවැනි තත්ත්වයන් ඉදිරියේදී නොකරන ලෙසට උපදෙස් ලබා දී ඇත. |

| | | |
|---|---|---|
| VTY/A/NYSC / 2016/12 | මූල්‍ය විගණනය - 2016 | විමසුමෙන් පෙන්වා දී ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන මගින් අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදුකිරීමට පියවර ගෙන ඇත.<br><br>පාරිතෝෂික දීමනා වෙන්කිරීම් වල ගණනය කිරීම් දෝෂ නිවැරදි කිරීමට කටයුතු කර ඇත. ඉතිරි අඩුපාඩු ගිණුම් සටහන් මගින් නිරවුල් කර ඇත. |
| VTY/A/NYSC / 2017/01 | ජාතික තරුණ සේවා සභාවේ අනුමත කාර්ය මණ්ඩලය හා උසස්වීම් පිළිබඳ පරීක්ෂාව. | ආයතනයේ පුරප්පාඩු පවතින තනතුරු වලට බඳවා ගැනීම සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. |
| VTY/A/NYSC / 2017/02 | රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන තාක්ෂණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව පිළිබඳ විගණනය | රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන තාක්ෂණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා NVQ 5 මට්ටම ලබා ගැනීම සඳහා කටයුතු කර ඇත. ඒ අනුව ප්‍රතිතන කාර්යයන් සිදුකර ඇති අතර, අදාල විෂය නිර්දේශයන්ට අනුව අධ්‍යයන කටයුතු සිදුකිරීමට පියවර ගෙන ඇත. |
| VTY/A/NYSC / 2017/03 | සංගීත ඩිප්ලෝමා පාඨමාලාව පිළිබඳ විගණනය | සංගීත ඩිප්ලෝමා පාඨමාලාවට බෙල්වුඩ්, මහරගම හා එරමිණියය යන සෞන්දර්ය නිකේතනයන්හි පවත්වා ගෙන යන සංගීත පාඨමාලා NVQ මට්ටම ලබා ගැනීම සඳහා කටයුතු කරමින් පවතී. |
| VTY/A/NYSC / 2017/04 | රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන ජාතික ඩිප්ලෝමාව 2016 - ටෙලිනාට්‍ය නිෂ්පාදනය සඳහා දරන ලද වියදම් පරීක්ෂාව | විමසුම මගින් පෙන්වා දී ඇති කරුණු වලට අදාලව නිළධාරීන්ගෙන් හේතු විමසා අදාල කටයුතු නිරවුල් කර ඇත. |
| VTY/A/NYSC / 2017/05 | සභාවට පවරා දී තිබූ හැඩිගම මාදන්ගහවත්ත ඉඩම ප්‍රයෝජනයට නොගැනීම. | හැඩිගම මාදන්ගහවත්ත ඉඩමෙහි තරුණ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා උපදේශන ආයතනයක් තෝරාගෙන තිබුණද ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් 2018 වර්ෂයේ සැලසුම් කිරිමට පියවර ගෙන ඇත. |
| VTY/A/NYSC / 2017/07 | EPF අංක 3039 හිමි සහකාර තරුණ සේවා නිළධාරියාගේ අසතුටුදායක රාජකාරී තත්ත්වය සම්බන්ධයෙන් අවශ්‍ය විනය ක්‍රියාමාර්ග නොගැනීම හේතුවෙන් රජයට පාඩු සිදුවීම. | ගණනය කිරීම් සම්බන්ධව සිදුවූ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. |
| VTY/A/NYSC / 2017/08 | වැටුප් රහිත නිවාඩු පිළිබඳ පරිපාලනය. | වැටුප් රහිත නිවාඩු පිළිබඳ පරිපාලනය සම්බන්ධව ඊටී/1/122-1/ප්‍රකා හා 2017.12.29 දිනැතිව කාර්යාල නියෝගයක් නිකුත් කර ඇත. |

| | | |
|---|---|---|
| VTY/A/NYSC / 2017/09 | ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය තීන්ත ආලේප කිරීම පිළිබඳ පරීක්ෂාව | පෙන්වා දී ඇති ඉදිකිරීම් අඩු පාඩු පිළිබඳව ගම්පහ දිස්ත්‍රික් කාර්යාලයේ දිස්ත්‍රික් ඉංජිනේරු දැනුවත් කිරීමෙන් අනතුරුව ඔහුගේ පූර්ණ අධීක්ෂණය යටතේ අදාළ කාර්යයන් ඇස්තමේන්තුවට අනුකූලව ඉටු කරවාගෙන අවසන් වාර්තාවක් ඉදිරිපත් කර ඇත.<br><br>විමසුම මගින් පෙන්වා දී ඇති ප්‍රසම්පාදන අඩු පාඩු නිවැරදි කිරීම සඳහා පියවර ගන්නා ලෙස අදාළ නිලධාරීන් වෙත උපදෙස් ලබා දී |
| VTY/A/NYSC / 2017/06 | ප්‍රධාන කාර්යාලයේ තීන්ත ආලේප කිරීම (කොන්ත්‍රාත් වටිනාකම රු.13,719,940). | ප්‍රධාන කාර්යාලයේ තීන්ත ආලේප කොන්ත්‍රාත්තුවට අදාලව කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර ඇති බිල් පත සඳහා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ නිර්දේශ මත ගෙවීම් සිදු කරන ලෙසට උපදෙස් ලබා දී ඇත. ඒ අනුව මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කාර්මික නිලධාරියෙකුගේ සේවය ලබා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇති අතර මේ සම්බන්ධව නිර්දේශ ලැබෙන තෙක් බිල් පත ගෙවීම තාවකාලිකව අත්හිටුවා ඇත. |